# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2017** අගෝස්තු **22** වන අඟහරුවාදා
2017 ஆவணி 22 செவ்வாய்க் கிழமை
Tuesday 22nd August 2017

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.30 ට පළාත් සභාව රැස් විය.**
*மு.ப. 09.30 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.30 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

## ආණ්ඩුකාරවරයාගෙන් ලැබෙන සංදේශ
## GOVERNOR'S PROCLAMATION

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*" ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 උ 2 අනුව්‍යවස්ථාව අනුව, මෙම පළාත් සභාවේ අදහස් ප්‍රකාශ කරනු පිණිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ පනත් කෙටුම්පත අතිගරු ජනාධිපතිතුමාණන් විසින් අංක CSA/9/9/6 හා 2017.08.17 දිනැති ලිපිය මගින් බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා වෙත එවා ඇති බව දන්වමින් හා එම පනත් කෙටුම්පත බස්නාහිර පළාතේ පළාත් සභාව වෙත ඉදිරිපත් කර පළාත් සභාවේ අදහස් පිළිබඳ ප්‍රකාශනයක් අතිගරු ජනාධිපතිතුමන් වෙත වාර්තා කිරීමට හැකිවන පරිදි, 2017.08.18 දින සිට දින 12 ක් ඇතුළත බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා වෙත එවන මෙන් ගරු ආණ්ඩුකාරතුමා විසින් අංක GOS/LEG/නීති කටයුතු මිශ්‍ර හා 2017.08.18 දිනැති ලිපිය මගින් මා වෙත දැනුම් දී තිබෙනවා.*

*එම විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නම් වූ පනත් කෙටුම්පතේ පිටපත් භාෂාත්‍රයෙන්ම අද දින ගරු මන්ත්‍රීතුමන්ලාගේ සභා මේසය මත තබා තිබෙනවා. (බාධා කිරීමක්)*

*මෙම පනත් කෙටුම්පත සම්බන්ධව මෙම පළාත් සභාවේ අදහස් දන්වා යැවීමේදී ගත යුතු පියවර සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා සහා කටයුතු පිළිබඳ කාරක සභාවේ විශේෂ රැස්වීමක් අද දින පෙ.ව. 11.00 ට මාගේ නිල කාමරයේදී පැවැත්වීමට අදහස් කර තිබෙනවා.*

*එමෙන්ම මේ පිළිබඳව උනන්දුවක් දක්වන සියලුම පක්ෂ නායකතුමන්ලාටත්, විශේෂයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රමුඛ අමාත්‍යතුමන්ලාටත් මෙම විශේෂ කාරක සභා රැස්වීමට සහභාගිවන ලෙසට ගෞරවයෙන් ආරාධනා කරනවා. එහිදී,*

*එක, පනත් කෙටුම්පත පිළිබඳව අදහස් දන්වා යැවීමට දැනට ලැබුණු කාලය ප්‍රමාණවත්ද? අවධානය යොමු කරන්න. දෙක, එම පනත් කෙටුම්පත ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභාවට යොමු කිරීමට ඇති යෝග්‍යතාවය පිළිබඳවද, තුන, එම පනත් කෙටුම්පත පළාත් අමාත්‍ය මණ්ඩලයට යොමු කිරීමට අවශ්‍ය වේද යන කාරණා පිළිබඳව සාකච්ඡා කර නිරාකරණය කර ගැනීමට බලාපොරොත්තු වන බවත් වැඩිදුරටත් ඔබතුමන්ලා වෙත කාරුණිකව දැනුම් දෙනවා.*

අපි මේ හැම කරුණක්ම පෙ.ව. 11.00 ට තිබෙන සාකච්ඡාවේදී සාකච්ඡා කරමු.

*එහිදී සාකච්ඡා වන කරුණු අනුව මේ පිළිබඳව ගන්නා ඉදිරි පියවර සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන් වෙත අද දින තුළ දී දැනුවත් කිරීමට බලාපොරොත්තු වෙනවා.*

මම නැවත වරක් මතක් කරනවා. මේ පිළිබඳ විශේෂ සාකච්ඡාවක් පෙ.ව. 11.00 ට මගේ නිල කාමරයේදී පැවැත්වෙනවා. ඒ සඳහා ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍යතුමන්ලාටත්, විශේෂයෙන්ම සභා කටයුතු කාරක සභාව නියෝජනය කරන සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාටත් එම අවස්ථාවට අනිවාර්යයෙන්ම සහභාගිවන ලෙසට මම ආරාධනා කරනවා.

# කාරක සභා වාර්තා
COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පහත සඳහන් කාරක සභා වාර්තා මම ඔබතුමන්ලා වෙත පිළිගන්වනවා.

i. 2017.08.01 දින පැවැති පෙත්සම් කාරක සභා රැස්වීම් වාර්තාව හා,

ii. 2017.08.09 දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව.

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*The Hon. Chairman declared that the copies of the relevant reports are placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
PETITIONS

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. මහරගම, නාගහවත්ත පාර, අංක 137/6 හි පදිංචි උපුලී සිරියලතා බද්දේගම යන අය විසින් ඉදිරිපත් කර ඇති පෙත්සම සහ,

ii. පිළියන්දල, මඩපාත, පින්නවල, අංක 123/5 ඒ හි පදිංචි රේණුකා දමයන්ති යන අයගේ පෙත්සම

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. කැලණිය, සිංහාරමුල්ල, විහාර මාවත අංක 71 හි පදිංචි පී.ඒ.ඩී. හේමසිරි ගෝමස් මහතාගේ පෙත්සම සහ

ii. කොලොන්නාව, පිරිවෙන පාර, අංක 7/ඒ හි පදිංචි කීර්තිසිරි ලියනගේ යන අයගේ පෙත්සම.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු සභාපතිතුමනි, හල්කඳවිල, දූවවත්ත හි පදිංචි ප්‍රේමරත්න උදට්යාවල යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**[සභා මේසය මත තබන ලද පෙත්සම්]*
*[Tabled petitions]*

**ගරු ලලන්ත ගුණසේකර**
Hon. Lalantha Gunasekera

උඩුගම්පල, කෙහෙල්බද්දර, අංක 54/බී හි පදිංචි ඩබ්ලිව්.එස්.ආර්.එන්. සේනානායක යන අයගේ පෙත්සම.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මහරගම, ඇල්හේන පාර, අංක 70/13/ඒ හි පදිංචි යටියන ආරච්චිගේ සුජීව යන අයගේ පෙත්සම

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

නිට්ටඹුව, අත්තනගල්ල පාර, අංක 642/3 හි පදිංචි ඩබ්.ජී. ආර්. වේලාරත්න යන අයගේ පෙත්සම

***සියලු පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*All Petitions, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
ORAL ANSWERS TO QUESTIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න ඉදිරිපත් කිරීමේ අවස්ථාව. ප්‍රශ්න අංක 01. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

## 01.

**ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/69)**

අ. 2015 සිට 2017 ජූනි 06 දක්වා හෝමාගම ප්‍රාදේශීය සභාව විසින් කරන ලද මාර්ග සංවර්ධන ව්‍යාපෘති ගණන කීයද?

ආ. එම සියලු මාර්ග සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධව,

- i. ව්‍යාපෘතියේ නම
- ii. ප්‍රතිපාදන මූලාශ්‍රය
- iii. ඇස්තමේන්තු මුදල
- iv. ව්‍යාපෘතිය ප්‍රදානය කළේ ටෙන්ඩර් මගින් ද වෙනත් ක්‍රමයක් මගින්ද යන වග
- v. අවසාන වශයෙන් කොන්ත්‍රාත්තුව තීරණය වූ මුදල
- vi. ව්‍යාපෘතිය කළ අයගේ නම හා ලිපිනය
- vii. වැඩ පටන්ගත් දිනය
- viii. වැඩ අවසන් කළ දිනය
- ix. ගෙවීම් අවසන් කර ඇති නම් එම දිනය

යන තොරතුරු ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කරන්නේද?

ඇ. මහජන නියෝජිත පාලනයක් නැති තත්ත්වයක් තුළ ප්‍රාදේශීය සභාවේ ප්‍රතිපාදන යොදවා කරන ව්‍යාපෘති කවරේද? යන්න තීරණය කරන්නේ කවුරුන්ද?

ඈ. සංවර්ධනය නොකළ එහෙත් සංවර්ධනය කළ යුතු මාර්ග ඇති බව ඔබතුමා දන්නේද?

ඉ. ප්‍රමුඛතාවය අනුව හඳුනාගත් මාර්ග සංවර්ධනයට වැඩ පිළිවෙළක් තිබේද?

ඊ. ඉදිරියේ සංවර්ධනය කළ යුතු මාර්ග පිළිබඳ ප්‍රමුඛතාවය අනුව නම් කළ හැකිද?

උ. ඒ අනුව මාර්ග පිළිබඳව ලේඛනයක් ඉදිරිපත් කරන්නේද?

ඌ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

අ. 1092 යි.

ආ. ඔව්. ඇමුණුම X 3[1] වශයෙන් වූ වාර්තාවට ඇතුළත් කර ඉදිරිපත් කරමි.

ඇ. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙහි විධිවිධාන අනුව ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් ය.

ඈ. ඔව්.

ඉ. 2017 වර්ෂයෙහි හෝමාගම ප්‍රාදේශීය සභා අරමුදලට අදාළව අයවැය ලේඛනයෙහි මාර්ග සංවර්ධනය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමේදී සංවර්ධන ප්‍රමුඛතාවය සඳහා මාර්ග හඳුනා ගැනීමක් සිදු කර ඇත.

ඊ. 2017 වර්ෂයෙහි හෝමාගම ප්‍රාදේශීය සභා අරමුදලට අදාළ අයවැය ලේඛනයට අනුව සංවර්ධන ප්‍රමුඛතාව සඳහා හඳුනාගත් මාර්ග නම් කළ හැකිය.

උ. ඔව්. ඇමුණුම X 4[2] වශයෙන් වූ වාර්තාවට ඇතුළත් කර ඉදිරිපත් කරමි.

ඌ. පැන නොනගී.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න අංක 02. එස්.ඒ.ඩී. ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රවාහන, සමූපකාර අමාත්‍යතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

---

[1] හැන්සාඩ් අංශයේ තබා ඇත.
[2] හැන්සාඩ් අංශයේ තබා ඇත.

## 02.

**එස්.ඒ.ඩී. ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/vi(1)/17/74)**

අ. බත්තරමුල්ල හා කඩුවෙල විවිධ සේවා සමූපකාර සමිති ඉතාම අපහසුතාවෙන් පාඩු ලබමින් පවත්වාගෙන යන බව ඔබතුමා දන්නේද?

ආ. මෙම සමූපකාර සමිති දෙකේ පසුගිය 2012 වසරේ සිට වසර 4 කට අදාළව වත්කම් හා බැරකම් පිළිබඳ තොරතුරු වර්ෂයෙන් වර්ෂය වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද?

ඇ. මෙම සමූපකාර සමිතිය පසුගිය වර්ෂ 4 තුළ දිගින් දිගටම අලාභ ලබමින් පවත්වාගෙන යාමට හේතුව ඔබතුමා දන්නේද? දන්නේ නම් පාඩු ලැබීමට හේතුව මොනවාද?

ඇ. මෙම සමූපකාර සමිති දෙකෙහි සේවක සංඛ්‍යාව වෙන් වෙන්ව සඳහන් කරන්නේද? කඩුවෙල හා බත්තරමුල්ල සමිති දෙකේ ප්‍රාදේශික වෙළඳසැල් කොපමණද? එම ප්‍රාදේශ්ක වෙළඳසැල් වලින් කොපමණ ප්‍රමාණයක් බාහිර පුද්ගලයින්ට කුළියට හෝ බදු පදනමින් ලබා දී තිබේද? එසේ දී තිබේ නම් ඒවා වෙන් වෙන්ව සඳහන් කරන්නේද?

**ගරු ලලිත් වනිගරත්න** (මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)

Hon. Lalith Wanigarathne (Minister of Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction, Estate Sector Infrastructure Facilities, Industries and Rural Development)

අ. ඔව්.

ආ. ඔව්. ඇමුණුම (1) න් ඉදිරිපත් කරමි.

ඇමුණුම 01

| වර්ෂය | බත්තරමුල්ල | | කඩුවෙල | |
|---|---|---|---|---|
| | **වත්කම් (රු.)** | **වගකීම් (රු.)** | **වත්කම් (රු.)** | **වගකීම් (රු.)** |
| 2012 | 669,274,351.00 | 669,274,351.00 | 1,314,714,299.00 | 1,373,200,562.00 |
| 2013 | 809,654,995.00 | 809,654,995.00 | 1,527,676,173.00 | 1,615,712,865.00 |
| 2014 | 825,401,604.00 | 825,401,604.00 | 1,793,397,718.00 | 1,903,273,821.00 |
| 2015 | 86,131,351.00 | 86,131,351.00 | 1,893,143,622.00 | 2,045,710,980.00 |

ඇ. සී/ස බත්තරමුල්ල වි.සේ.ස. සමිතිය

මෙම සමිතිය ප්‍රදාන ව්‍යාපාරික අංශ 04 ක් යටතේ ක්‍රියාත්මක වේ.

<u>ග්‍රාමීය බැංකු අංශය</u>

2012 සිට 2016 දක්වා ලාභදායිකව පවත්වාගෙන යනු ලැබුවත් 2012 වර්ෂයේ රු.11,166,299.00 ක් වූ ආංශික ලාභය ක්‍රමානුකූලව අඩු වී 2015 දී රු. 1,088,426.00 සහ 2016 දී රු.2,698,100.00 දක්වා පහළ යාම සමස්ත සමිතියේ අලාභය කෙරෙහි බලපා ඇත.

<u>පාරිභෝගික අංශය</u>

2012 වසරේ සිට රුපියල් හැට ලක්ෂය ඉක්මවා පාඩු ලබා ඇත.

<u>ඉන්ධන අංශය</u>

2015 හා 2016 වර්ෂයේ පාඩු පිට පවත්වාගෙන ගොස් ඇත.

<u>වෙනත් අංශ</u>

2013 වර්ෂයේ හැර අනෙකුත් වර්ෂවල රුපියල් ලක්ෂ 2 කට අඩු ප්‍රමාණයක ආදායමක් ලැබී ඇත. මේ අනුව ආංශික ලාභ අලාභ තත්ත්වයන් ගැලපූ විට සෑම වර්ෂයකම ලැබී ඇත්තේ පොදු ශුද්ධ අලාභයකි.

සී/ස කඩුවෙල වි.සේ.ස. සමිතිය

<u>පාරිභෝගික අංශය</u>

2011 වර්ෂය හැර අන් හැම වර්ෂයකම රු.ලක්ෂ 20 සිට රු.ලක්ෂ 314 ක් වූ ප්‍රමාණයක ශුද්ධ පාඩු තත්ත්වයක් මත පවත්වාගෙන ගෙන ගොස් ඇත. 2011 වර්ෂයේ පමණක් රු.265,266.48 ක ලාභයක් උපයාගෙන ඇත.

<u>ග්‍රාමීය බැංකු අංශය</u>

2012 හා 2013 වර්ෂවල ශුද්ධ පාඩු ලබා ගෙන ඇති අතර 2014, 2015 හා 2016 යන වර්ෂවල ශුද්ධ ලාභයක් ලබාගෙන ඇත.

<u>ඉන්ධන අංශය</u>

සෑම වර්ෂයකම රු.ලක්ෂ 21 සිට රු.ලක්ෂ 103 දක්වා ප්‍රමාණයක ලාභ තත්ත්වයක් යටතේ පවත්වාගෙන ගොස් ඇත.

<u>අනෙකුත් අංශ</u>

ලාභ හා අලාභ තත්ත්වයක් යටතේ වාර්ෂිකව පවත්වාගෙන ගොස් ඇති අතර 2008 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා සමිතිය පොදු ශුද්ධ පාඩුවක් මත පවත්වාගෙන ගොස් ඇත.

ඇ. ඇමුණුම (2) න් ඉදිරිපත් කරමි.

ඇමුණුම 02

සී/ස බත්තරමුල්ල වි.සේ.ස. සමිතිය - සේවක සංඛ්‍යාව
2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා සමිතියේ
සේවය කළ සේවක සංඛ්‍යාව

| | පිරිස්බල තක්සේරුව අනුව අනුමත | ස්ථිර | අනියම් | කොන්ත්‍රාත් | එකතුව |
|---|---|---|---|---|---|
| 2014 | 241 | 111 | 06 | 06 | 123 |
| 2015 | 241 | 97 | 06 | 11 | 114 |
| 2016 | 241 | 85 | 03 | 03 | 91 |

සී/ස කඩුවෙල වි.සේ.ස. සමිතිය - සේවක සංඛ්‍යාව

| | පිරිස්බල තක්සේරුව අනුව අනුමත | ස්ථිර | අනියම් | කොන්ත්‍රාත් | එකතුව |
|---|---|---|---|---|---|
| 2014 | 474 | 167 | 141 | 7 | 315 |
| 2015 | 474 | 194 | 98 | 6 | 298 |
| 2016 | 407 | 222 | 33 | 1 | 256 |

ප්‍රාදේශීක වෙළසැල් ගණන

| සමිතිය | බත්තරමුල්ල | කඩුවෙල |
|---|---|---|
| ප්‍රමාණය | 11 | 23 |

ප්‍රාදේශීක වෙළසැල් පවත්වාගෙන ගිය ගොඩනැගිලි බදු දී ඇති ආකාරය

| බත්තරමුල්ල | | කඩුවෙල | |
|---|---|---|---|
| ප්‍රමාණය | ප්‍රාදේශිකය | ප්‍රමාණය | ප්‍රාදේශිකය |
| 03 | තලවතුගොඩ<br>කළපළුවාව<br>උතුරු<br>තලංගම | 03 | කොතලාවල 1<br>ජය මාවත<br>කොතලාවල 2 |

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට ඕනෑ නම් අතුරු ප්‍රශ්න තුනක් අහන්න පුළුවන්.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, ගරු ඇමැතිතුමාගෙන් මම දැනගන්න කැමැතියි. ඔබතුමා කිව්වා 2012 න් පස්සේ දිගින් දිගට අලාභ සිද්ධ වෙලා තිබෙනවා කියලා. දැන් අලාභ සිද්ධ වෙන්න බලපාපු හේතු සොයාගෙන තිබෙනවාද? ඒ සම්බන්ධයෙන් යම් පුද්ගලයෙක් වග කිව යුතු නම්, ඒ සම්බන්ධව යම් පියවරක් ගෙන තිබෙනවාද? ඒ වාගේම හිටපු සභාපතිවරයාගේ ප්‍රජා අයිතිය අහෝසි කිරීම ඇතුළු ක්‍රියා මාර්ග කිහිපයක් අරගෙන තිබෙනවා. ඒ හැර ඔහුගෙන් නැවත මුදල්, ඒ අලාභය අය කරගන්න ක්‍රමයක් හෝ ක්‍රමවේදයක් භාවිතා කරනවාද?

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, දිගින් දිගටම පාඩු ලැබූ නිසා මේ පිළිබඳව විමර්ශනය කරලා අවශ්‍ය වාර්තාවක් ලබා ගන්න කොමසාරිස්තුමාට මම උපදෙස් දීලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න අංක 03 ත් එස්.ඒ.ඩී. ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා විසින් -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

එකකටයි උත්තර ලැබුණේ. මම අතුරු ප්‍රශ්න තුනක් ඇහුවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, එතුමා අතුරු ප්‍රශ්න තුනක් අහලා තිබෙනවා. ඔබතුමා එක උත්තරයයි ලූ දුන්නේ. අනික් උත්තර දෙක ලැහැස්තිද?

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ඒක දැන් සකස් කරගෙන තිබෙනවා. ප්‍රශ්න තුනටම ලබන වාරයේදී මම උත්තර ලබා දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තුන් වැනි ප්‍රශ්නයත්, ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමාගෙන් ගරු ප්‍රවාහන, සමූපකාර අමාත්‍යතුමාට.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**03.**

**එස්.ඒ.ඩී. ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/vi(1)/17/75)**

අ. බත්තරමුල්ල හා කඩුවෙල විවිධ සේවා සමූපකාර සමිති දෙකේ පඩිනඩි ගෙවීමට ප්‍රමාණවත් ආදායමක් පවතින්නේද? එසේ නැතිනම් එයට හේතුව මොනවාද?

ආ. මෙම සමිතිවල පාරිභෝගික අංශයේ පමණක් වත්කම් බැරකම් කොපමණද? යන්න ඔබතුමා දන්නේද? ඒවා වෙන් වෙන්ව සඳහන් කරන්නේද?

ඇ. බත්තරමුල්ල හා කඩුවෙල සමිති දෙකේ ග්‍රාමීය බැංකු අංශයෙන් පසුගිය වසර 4 ක කාලය තුළ එක් එක් සමිතිය ණය ලබාගෙන තිබෙන ආකාරය ඔබතුමා දන්නේද? එය වෙන් වෙන්ව සඳහන් කරන්නේද?

ඈ. එම ණය පියවීම සඳහා මෙම සමූපකාර සමිති දෙකේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ වන විට ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද?

ඉ. බත්තරමුල්ල විවිධ සේවා සමූපකාර සමිතියේ අවසන් වරට ඡන්දයෙන් පත්ව සිටි සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය සිදු කර ඇති විෂමාචාරයන් හා සමිතිය වෙත සිදු කර ඇති පාඩු ඔබතුමා දන්නේද? එම තත්ත්වයන් වෙන වෙනම පැහැදිලි කරන්නේද?

ඊ. එම අය පිළිබඳව ඔබතුමා ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද?

උ. කඩුවෙල හා බත්තරමුල්ල විවිධ සේවා සමූපකාර සමිති දෙකේ වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය පත් කර තිබෙන්නේ කුමන පදනමකින්ද?

ඌ. මෙම සමිති දෙකේ නිල කාලයන් අවසන්ව ඇති බැවින් ඡන්ද පැවැත්වීමට කටයුතු සිදු කරන්නේද?

එ. එය කුමන කාලයේ සිදු කරන්නේද?

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

අ. සී/ස බත්තරමුල්ල වි.සේ.ස. සමිතිය - සේවක වැටුප් හා වේතන ගෙවීමට ප්‍රමාණවත් ආදායමක් නැත.

සමිතිය දිගින් දිගටම අලාභදායීකව පවත්වාගෙන යාම එයට හේතුවයි.

සී/ස කඩුවෙල වි.සේ.ස. සමිතිය - සේවක වැටුප් හා වේතන ගෙවීමට ප්‍රමාණවක් ආදායමක් ඇත.

ආ. වාර්ෂික විගණනයේදී පාරිභෝගික හා ග්‍රාමීය බැංකු අංශයේ ලාභාලාභ ගිණුම් වෙන වෙනම සකස් කරන අතර මූල්‍ය වාර්තා තුළින් වත්කම් හා වගකීම් ඒකාබද්ධව සකස් කර ඉදිරිපත් කරයි. එබැවින් පාරිභෝගික අංශයේ වත්කම් හා වගකීම් වෙන් කර හඳුනාගැනීමට අපහසුය.

ඇ. ඇමුණුම (3) න් ඉදිරිපත් කරමි.

ඇමුණුම (3)

## සී/ස බත්තරමුල්ල වි.සේ.ස. සමිතිය

| විස්තරය | | 2013 | 2014 | 2015 | 2016 | ණය ගෙවීමට ගෙන ඇති ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|---|---|
| 1 | පාරිභෝගික ස්ථාවර තැන්පත් මුදල් | 6,566,168 | - | - | - | |
| 2 | පාරිභෝගික ස්ථාවර තැන්පත් සඳහා පොළිය | 4,816,307 | - | - | - | |
| 3 | 0028 ග්‍රා/බැංකු ගිණුමෙන් 0027 පාරිභෝගික අංශ ගිණුමට මාරු කිරීම | - | 11,258,864 | - | - | ණය ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පියවරක් ගෙන නොමැති අතර ග්‍රාමීය බැංකු අංශයට ගෙවිය යුතු ණය ලෙස ගිණුම්ගත කර ඇත. |
| 4 | පාරිභෝගික අංශයට ලබාගත් ණය හා පොළිය | - | - | 32,500,000 | - | |
| 5 | පාරිභෝගික අලෙවි සංගමයෙන් ලබාගත් ණය සඳහා රඳවාගත් පොළිය | 2,714,581 | 300,000 | 420,000 | 540,000 | |
| 6 | දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගමය රඳවාගත් පොළිය | - | - | 239,060 | - | |
| 7 | 0028 ග්‍රා/බැංකු අංශ ගිණුමට තැන්පත් නොවූ මුදල් | - | - | - | 2,594,211 | |
| | එකතුව | 14,097,056 | 11,558,864 | 33,159,060 | 3,134,211 | |

## සී/ස කඩුවෙල වි.සේ.ස. සමිතිය

| | විස්තරය | 2013 | 2016 | 2017 | ණය ගෙවීමට ගෙන ඇති ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|---|
| 1 | 2013.01.05 දිනට පෙර පාරිභෝගික අංශයේ වෙළඳ ණයහිමියන් සඳහා ගෙවීමට තිබූ රු.11,115,047.08 ක මුදල ගෙවීම 2013 වර්ෂයේ සිදු කළ බැවින් පාරිභෝගික අංශය සතු අංක 504 ජංගම ගිණුමේ 2013.08.31 දිනට පැවැති රු.16,305,950.73 ක අයිරාව පියවීම සඳහා ණය ලබා ගැනීම. | - | - | - | පාරිභෝගික අංශයේ ජංගම ගිණුමෙන් දෛනිකව රු.25,000/- බැගින් හා ණය මුදල අලුත් කිරීමේදී පියවා අවසන් කර ඇත. |
| 2 | පාරිභෝගික අංශයේ ගනුදෙනු සඳහා රු.4,216,626/- ක මුදලක් ලබා ගැනීම සඳහා 2013.09.03 දින ලබාගත් ණය මුදල අලුත් කිරීම. | - | 18,000,000.00 | - | පාරිභෝගික අංශයේ ජංගම ගිණුමෙන් දෛනිකව රු.25,000/- බැගින් හා ණය මුදල අලුත් කිරීමේදී පියවා අවසන් කර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3 | සේවක උත්සව අත්තිකාරම් ගෙවීම සඳහා | - | 1,608,500.00 | - | මාසිකව සේවක වැටුපෙන් අය කරගෙන නිම කර ඇත. |
| 4 | ග්‍රාමෝදාගම ප්‍රාදේශීකය ආරම්භ කිරීම සඳහා | - | 500,000.00 | - | මාසිකව ග්‍රාමෝදගම ප්‍රාදේශිකයේ ආදායමින් රු.50,000/- බැගින් ගෙවන ලද අතර, 20107.07.25 දින ගෙවා අවසන් කර ඇත. |
| 5 | සමගි සුරකුම් තැන්පත් ගෙවීම සහා (පී.ආර්.ජේ. ජයනෙත්ති) | - | 3,000,000.00 | - | 2017.06.09 දින රු.1,125,000/- ක් ගෙවා ඇත. |
| 6 | වෙස්කෝ ආයතනයට, පාරිභෝගික අංශයට ලබාගත් භාණ්ඩ වෙනුවෙන් අයවිය යුතු මුදලට ග්‍රාමීය බැංකු ස්ථිර තැන්පතුවකින් අයකරගත් වටිනාකම | - | 2,849,713.81 | - | ගෙවීම් කර නැත. |
| 7 | වී ලබා ගැනීම සඳහා | - | - | 5,000,000/- | සහල් අලෙවි ආදායමින් ගෙවීමෙන් හා ණය මුදල අලුත් කිරීමේදී පියවා අවසන් කර ඇත. |
| 8 | සමඟි සුරුකුම් තැන්පත් ගෙවීම සඳහා (විමලරත්න කොහොඹවත්) | - | - | 3,375,000.00 | 2017.06.09 දින මෙම මුදල ගෙවා ඇත. |
| 9 | සේවක උත්සව අත්තිකාරම් ගෙවීම සඳහා | - | - | 1,772,000.00 | මාසිකව උත්සව අත්තිකාරම් වැටුවෙන් අය කර ගැනීමෙන් පසු ගෙවීම් සිදු කරනු ලබයි. |
| 10 | ඔරුවල ප්‍රාදේශීකය ආරම්භ කිරීම සඳහා | - | - | 270,000.00 | ප්‍රාදේශීකය ආරම්භ කර මාස 03 ක් ඉක්ම ගිය පසු වාරික 06 කින් ගෙවීමට. |
| 11 | පාරිභෝගික අංශයේ ගනුදෙනු සඳහා රු.ලක්ෂ 70 ක ණය මුදලක් ලබා ගැනීම සඳහා 2016.11.22 දින ලබාගත් ණය මුදල අලුත් කළ අතර, සමගි ග්‍රාමීය බැංකු අංශයෙන් ලබාගෙන තිබූ මුදලින් රු.ලක්ෂ 45 ක මුදලක් මෙම ලබාගත් මුදලින් ගෙවා නිම කර ඇත. | - | - | 24,444,116.00 | පාරිභෝගික අංශයේ ජංගම ගිණුමෙන් දෛනිකව රු.25,000/- බැගින් ගෙවීමට. |
| 12 | වී ලබා ගැනීම සඳහා ලබාගත් පෙර ණය මුදල අලුත් කිරීම. | - | - | 2,500,000/- | වාරික 03 කින් ගෙවීමට |
| 13 | හෝමෝජියනයිසර් යන්ත්‍රය ලබා ගැනීම | - | - | 2,228,850/- | වසර 03 ක් ඇතුළත ගෙවීමට |

ඇ. ඇමුණුම් (3) න් ඒ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සඳහන් කර ඇත.

ඉ. ඔව්.

ඊ. සී/ස බත්තරමුල්ල විවිධ සේවා සමුපකාර සමිතිය සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභාවේ 2011 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 47(2) වගන්තිය ප්‍රකාරව විමර්ශනයක් සිදු කර, චෝදනා ලාභීන් සම්බන්ධයෙන් ප්‍රඥප්තියේ 48(1)(ඇ) වගන්තිය අනුව විනය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, මූල්‍ය හානි අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගනිමින් පවතී.

උ. සී/ස බත්තරමුල්ල විවිධ සේවා සමුපකාර සමිතිය

බස්නාහිර පළාත් සභාවේ 2011 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 60(03)(අ) වගන්තිය අනුව සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා වෙත පැවරී ඇති බලතල අනුව.

සී/ස කඩුවෙල විවිධ සේවා සමුපකාර සමිතිය

සමුපකාර සමිතියේ සාමාජික ඡන්දයෙන් පත් වූ ප්‍රාදේශීය කාරක සභා මගින් ස්ථාපිත කර ඇති මහ සභාව විසින් තෝරා පත් කර ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩලයන් විසින් පාලනය කරනු ලබයි.

ඌ. ඔව්.

එ. නිලවරණ පැවැත්වීමට අදාළ මූලික කටයුතු සිදු කිරීමට සැලසුම් කර ඇත.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය. එතුමා ප්‍රකාශ කළා, ග්‍රාමීය බැංකු අංශයේ සහ පාරිභෝගික අංශයේ වත්කම් වගකීම් වෙනම හඳුනාගන්න බැහැයි කියලා. සාමාන්‍යයෙන් එහෙම බැරි වෙන්න විධියක් නැහැ. සෑම සමිතියකම තමන්ගේ වත්කම් වගකීම් වෙන වෙනම තිබෙනවා. එහෙම නොහැකි මන්ද? කියන ප්‍රශ්නය මම නැවත අතුරු ප්‍රශ්නයක් විධියට අහනවා.

ඒ වාගේම පරීක්ෂණයක් කරලා හිටපු සභාපතිවරයාගෙන් අයකර ගන්න කටයුතු කරනවා කියලා ගරු ඇමැතිතුමා සඳහන් කළා. අපි දන්න විධියට දැනට කිසිම ක්‍රියා මාර්ගයක් අරගෙන නැහැ. අඩුම ගණනේ යවපු ලියුමක්වත් තිබෙනවාද? ඒ අය කරගන්නවා කියන එක සම්බන්ධව ලිපියකින්වත් දැනුම් දීමක් කරලා තිබෙනවාද කියන කාරණය අහනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. සභාවේ ඝෝෂාව වැඩියි.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඒ වාගේම ඡන්දය පවත්වන්න තීන්දු කරලා තිබෙනවා නම් කුමන කාලවකවානුවේද කියලා දැනගන්න කැමැතියි.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, ඡන්දය පවත්වන දිනය සම්බන්ධයෙන් මම හිතන්නේ අපට ඉදිරියේදී දැනුවත් කරන්න පුළුවන්. ඒ නිසා මේ අහපු ප්‍රශ්න සියල්ලටම සියලුම විස්තර අරගෙන මම ලබන වාරයේ දැනුවත් කිරීමක් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලබන සභා රැස්වීමේදී එතුමා ප්‍රශ්න සියල්ලටම උත්තර දෙන්න ලැහැස්තියි. 04 වැනි ප්‍රශ්නයත් ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමාගෙන්මයි. ඒ ප්‍රශ්නයත් සමුපකාර ගරු ඇමැතිතුමාට.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

## 04.

**එස්.ඒ.ඩී. ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/vi(1)/17/76)**

අ. බත්තරමුල්ල හා කඩුවෙල විවිධ සේවා සමූපකාර සමිති දෙකේ නොබෝදා පත් කරන ලද (දින කිහිපයකට පෙර පත් කළ) සභාපති පත් කළේ කුමන පදනමකින්ද?

ආ. ඔහු විදේශ සංචාර සඳහා පිටත්ව තිබේද? ඒ සඳහා කොපමණ වියදමක් දරා තිබේද? එම වියදම් දරා ඇත්තේ කුමන අංශවලින්ද?

ඇ. බත්තරමුල්ල හා කඩුවෙල සමිතිවල පසුගිය වසර 05 ක කාලය තුළ හිටපු අධ්‍යක්ෂ මණ්ඩල විදේශ සංචාර කොතරම් ප්‍රමාණයක් සිදු කර තිබේද?

ඈ. ඒ සඳහා කොතරම් වියදමක් දරා තිබේද? යන්න අදාළ සංචාරය හා වියදමත් සංචාරයට සහභාගි වූ අධ්‍යක්ෂවරයාත් ආදී නිවැරදි තොරතුරු මෙම ගරු සභාවට වෙන් වෙන්ව ඉදිරිපත් කරන්නේද?

ඉ. බත්තරමුල්ල කඩුවෙල සමිති දෙක මෙවැනි දැවැන්ත කඩා වැටීමකට ලක්ව ඇත්තේ අවසන් වරට ඡන්දයෙන් පත් වූ අධ්‍යක්ෂ මණ්ඩල විසින් ගනු ලැබූ තීරණ හේතුවෙන් බව ඔබතුමා පිළිගන්නේද?

ඊ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

අ. සී/ස බත්තරමුල්ල විවිධ සේවා සමූපකාර සමිතිය

බස්නාහිර පළාත් සභාවේ 2011 අංක 04 දරන සමූපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමූපකාර සමිති ප්‍රඥප්තියේ 60(03)(අ) වගන්තිය අනුව සමූපකාර සංවර්ධන කොමසාරිස්වරයා වෙත පැවරී ඇති බලතල අනුව.

සී/ස කඩුවෙල විවිධ සේවා සමූපකාර සමිතිය

පත් කිරීමක් සිදු කර නොමැත.

ආ. නැත.

ඇ. ඇමුණුම (4) ඉදිරිපත් කරමි.

**<u>සී/ස බත්තරමුල්ල විවිධ සේවා සමූපකාර සමිතිය</u>**

| වර්ෂය | කාලය | සහභාගි වූ අය | ස්ථානය | ගුවන් ගමන් ගාස්තු | පරිස්කාර දීමනාව රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|
| 2013 | 2013.09.19 - 2013.09.21 | ගරු සභාපති - නිශාන්ත උඩවත්ත ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල නිලධාරීන් සහ සේවක මහත්ම මහත්මීන් 09 | ඉන්දියාව | - | 297,000.00 | 297,000.00 |
| 2013 | 2013.12.16 - 2013.12.21 | ගරු සභාපති - නිශාන්ත උඩවත්ත ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල නිලධාරීන් සහ සේවක මහත්ම මහත්මීන් 10 | ඉන්දියාව | - | 170,625.00 | 170,625.00 |
| 2014 | 2014.07.08 - 2014.07.14 | ගරු සභාපති - නිශාන්ත උඩවත්ත | පිලිපීනය | - | - | - |
| 2015 | 2015.02.23 - 2015.02.28 | ගරු සභාපති - ඩී.එම්.පී.එම්. ඒකනායක | ඩුබායි | - | 19,800.00 | 19,800.00 |
| 2016 | 2016.03.01 - 2016.03.07 | ගරු සභාපති - ඩී.එම්.පී.එම්. ඒකනායක | මැලේසියාව | - | 21,150.00 | 21,150.00 |

<u>**සී/ස හේවාගම් කෝරළයේ (බටහිර) විවිධ සේවා සමූපකාර සමිතිය - කඩුවෙල**</u>

| | දිනය | සහභාගීත්වය | රට | ගුවන් ගමන් ගාස්තු රු. | පරිස්කාර දීමනාව රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|
| 1 | 2011.05.06 සිට 2011.05.11 දක්වා | ගරු සභාපති - එස්.ඒ.ලීලාරත්න මහතා | තායිලන්තය | - | 12,500.00 | 12,500.00 |
| 2 | 2012.07.27 සිට 2012.08.01 දක්වා | ගරු උප සභාපති - කේ.ඩී. ගාමිණී බන්දුසිරි මහතා | තායිලන්තය | - | 20,100.00 | 20,100.00 |
| 3 | 2013.01.25 සිට 2013.01.29 දක්වා | ගරු සභාපති - ඩබ්.ඒ. ප්‍රේමරත්න වීරසිංහ මහතා | චීනය | - | 18,982.50 | 18,982.50 |
| 4 | 2013.06.02 සිට 2013.06.09 දක්වා | ගරු සභාපති - කුෂලා තුෂාරි දමයන්ති මිය | ඉන්දියාව | 53,750.00 | 22,860.00 | 76,610.00 |
| 5 | 2013.07.09 සිට 2013.07.13 දක්වා | ගරු උප සභාපති - මාඹුලගේ වික්‍රමපාල මහතා | මැලේසියාව | 64,000.00 | 19,327.50 | 83,327.50 |
| 6 | 2013.10.06 සිට 10,11,12,13 දක්වා | ගරු අධ්‍යක්ෂ ප්‍රියන්ත බමුණු ආරච්චි මහතා | තායිලන්තය | 63,000.00 | 19,792.50 | 82,792.50 |
| 7 | 2013.11.10 සිට 2013.11.16 දක්වා | ගරු අධ්‍යක්ෂ එන්. කුලසේකර මහතා | ඉන්දියාව | 69,500.00 | 19,657.50 | 89,157.50 |
| 8 | 2013.10.30 සිට 2013.11.04 දක්වා | ගරු සභාපති කුෂලා තුෂාරි දමයන්ති මිය | තායිලන්තය | - | 23,562.00 | 23,56.00 |
| 9 | 2014.01.23 සිට 2014.01.28 | ගරු අධ්‍යක්ෂ වසන්ත කුමාර මායදුන්න මහතා | තායිලන්තය | 71,500.00 | 19,612.50 | 91,112.50 |
| 10 | 2014.07.08 සිට 2014.07.14 දක්වා | ගරු සභාපති කුෂලා තුෂාරි දමයන්ති මහත්මිය | පිලිපීනය | - | 23,711.40 | 23,711.40 |
| 11 | 2014.07.10 සිට 2014.07.15 දක්වා | ගරු අධ්‍යක්ෂ ප්‍රදීප් ප්‍රියදර්ශන මහතා | තායිලන්තය | - | 19,753.50 | 19,753.50 |

ඈ. ඉහත ඇමුණුම (4) පිළිතුර තුළ දක්වා ඇත.

ඉ. නැත.

ඊ. මෙම සමිති දෙක දිගු කාලීනව පාඩු ලබමින් පැවතීම නිසා කඩා වැටීමකට පත් වී ඇත.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට ඒක පැහැදිලිද?

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

අපැහැදිලි තැන් කිහිපයක්ම තිබෙනවා. නමුත් අද අහපුවාම එතුමාට උත්තර දෙන්න බැරි නිසා මම දීර්ඝව අහන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, එක කාරණයක් දැන් බත්තරමුල්ල සහ කඩුවෙල විවිධ සේවා සමූපකාර සමිති දෙකේ එතුමාගේ උත්තරේ කිව්වා, කඩුවෙල පත් කරලා නැහැයි කියලා. පත් කරලා නැහැ නොවෙයි. කාලය ඉවර වෙලා දීර්ඝ කරලා තිබෙනවා. ඒ කියන්නේ පත් කළා හා

සමානයි. ඒකටත් ඡන්දයක් තියන්න ඕනෑ. ඒ නිසා කඩුවෙලත් ඡන්දය තිබෙන දිනය කවදාද කියලා අහනවා. ඒ වාගේම අනික් අතට මේ සමූපකාර සමිති දෙකේ අලාභය පියවා ගන්න, එහෙම නැත්නම් ඒ වෙනුවෙන් යම් ක්‍රියා මාර්ගයක් දෙපාර්තමේන්තුව විධියට ගන්න කටයුතු කරලා තිබෙනවාද කියන කාරණාවත්, තුන් වැනි අතුරු ප්‍රශ්නය විධියට වර්තමානයේ බත්තරමුල්ල විවිධ සේවා සමූපකාර සමිතියේ පත් කරලා තිබෙන පාලකයන් කුමන තත්ත්වයන් යට - ඡන්දයක් තියන්න තිබෙද්දී, දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඉද්දී දේශපාලනික හේතූන් මත මේ හදිසියේ පත්වීම් කරලා තිබෙනවා නේද කියන කාරණාවත් මම දැනගන්න කැමැතියි.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, දැන් මෙතුමාගේ ප්‍රශ්න තුනක් තිබුණා. මේ ප්‍රශ්න තුන සම්බන්ධයෙන්ම මෙතුමා අහපු අතුරු ප්‍රශ්නවලට මෙම කොමසාරිස්තුමාවත් ගෙන්නලා, මෙතුමාවත් ගෙන්නලා දිනයක් දීලා මේ පිළිබඳව සාකච්ඡාවක් කරනවා. මේකේ උග්‍ර ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, එම සාකච්ඡාව පවත්වන විටදී මාවත් කැඳවන්න.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

හොඳයි. එතුමාවත් කැඳවන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පස් වැනි ප්‍රශ්නය. සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රවාහන, සමූපකාර ගරු අමාත්‍යතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රවාහන ඇමැතිතුමා, ඔබතුමාට ප්‍රශ්නය තිබෙන්නේ.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, ඒ ප්‍රශ්නයට උත්තර දෙන්න තව සති දෙකක් කාලය ඉල්ලනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, කලින් වර මම ඉදිරිපත් කරලා තිබුණු මේ න්‍යාය පත්‍රයේ තිබුණු ප්‍රශ්නයක අතුරු ප්‍රශ්න කිහිපයකට අද ඇමැතිතුමා උත්තර දෙන්න පොරොන්දු වෙලා තිබුණා. ඒ ගැනත් පොඩ්ඩක් අවධානය යොමු කරන්න. ඒක මේ න්‍යාය පත්‍රයේ නැති නිසා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, ඔබතුමා පිළිතුරු දෙන්න ලැහැස්තිද?

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ඒක සභාගත කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උත්තරය තිබෙනවාද?

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ඔව්. සභාගත කරනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, එදා අතුරු ප්‍රශ්න අහපු වෙලාවේ තමයි එතුමා කිව්වේ අද උත්තර දෙන්නම් කියලා. එතකොට මට තව අතුරු -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උත්තරය ලැහැස්තියි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

හරි. එතකොට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට දෙන්න උත්තර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා මේ උත්තරය සභාගත කරන්නද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඊට අදාළව මට ප්‍රශ්නයක් ගොඩනැගුණොත්, මට ඒකට අවස්ථාව ඕනෑ ගරු සභාපතිතුමනි. කාට හරි වෙන ඇමැති කෙනෙකුට කිව්වත් කමක් නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා [ගරු ලලිත් වනිගරත්න අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Isura Devapriya - Chief Minister [On Behalf of the Hon. Minister Lalith Wanigaratna]

ගරු සභාපතිතුමනි, සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාගේ අතුරු ප්‍රශ්නවලට පිළිතුර :

රුපියල් මිලියන 672.9 යි.

ඊළඟ ප්‍රශ්නයට පිළිතුර, නැත.

මෙම ඉඩම හිමිකරුගෙන් මිලදී ගෙන ඇත. බ්‍රෝකර් ගාස්තු ගෙවා නැත.

සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාගේ අතුරු ප්‍රශ්නයට පිළිතුර :

ඔව්. බලයලත් තක්සේරුකරු එස්.ඒ.එම්.ඒ. පෙරේරා යන අය විසින් මෙම ඉඩම තක්සේරු කර ඇති අතර, වටිනාකම රුපියල් මිලියන 650 යි.

සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුර:

සී/ස ගම්පහ දිස්ත්‍රික්ක සමූපකාර ග්‍රාමීය බැංකු සංගමයේ අතුරු ව්‍යවස්ථාවේ 4.1 වගන්තිය අනුව.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, දැන් මම එදා ගරු ඇමැතිතුමාගෙන් ඇහුවා, මේකේ පර්චසයක් මිලදී ගත්තේ කීයටද කියලා. නමුත් ඒක එතුමාට හරියට කියන්න බැහැයි කිව්වා. එතකොට දැන් මේකේ දෙවැනි ප්‍රශ්නය තමයි - දැන් ඕනෑම ඉඩම් ගනුදෙනුවකදී, ඒ ගනුදෙනුවට යම් ප්‍රතිශයක් අදාළ පාර්ශවවලට ගෙවනවා නේ? බ්‍රෝකර් ගාස්තුව. එහෙම බ්‍රෝකර් ගාස්තුවක් කිසියම් කෙනෙකුට ගෙව්වාද කියන එක මට දැනගන්න ඕනෑ වුණා. නමුත් ගරු සභාපතිතුමනි, තුන් වැනි ප්‍රශ්නය. ගරු ඇමැතිතුමා දන්නවාද බැංකු සංගමයට කොමිස් මුදලක් අත යට ගිහිල්ලා තිබෙනවා. නමුත් ගිය සුමානේ සාකච්ඡා කරලා තීරණය කරනවා. ඉදිරියේ දී කිසිම ඉඩම් ගනුදෙනුවකදී කොමිස් ගන්නේ නැහැයි කියලා. දැන් මෙහෙම සිද්ධියක් වෙලා තිබෙනවා කියලා ඔබතුමා දන්නවාද?

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

මම ඒ පිළිබඳව සොයා බලලා කටයුතු කරනවා. ගරු සභාපතිතුමනි, මම හිතන්නේ මේක අද ඊයේ නොවෙයි. බැංකු සංගමය මගින් ඉඩම් මිලදී ගැනීම දැනට අවුරුදු ගණනකට ඉස්සෙල්ලා සිට කෙරෙන ඒ ව්‍යාපාරයක්. මොකද, මේ බැංකු සංගමයේ තිබෙන මුදල් පෞද්ගලික ආයතනයක තැන්පත් කරලා පොලිය ගැන විශ්වාසයක් තියන්න බැරි නිසා තමයි මේ ඉඩම් ව්‍යාපාරය ඒ අය කරන්නේ. මම ඒ අයත් එක්ක සාකච්ඡා කළා. මේක මම කරන එකක් නොවෙයි. බැංකු සංගමයේ සභාපති කෙනෙක් ඉන්නවා. Director Board එකක් තිබෙනවා. ඒ වාගේම නීතිඥ panel එකක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා විෂයය භාර ඇමැතිවරයා වශයෙන් ඔබතුමාට තමයි ඔක්කොම කුණු ටික එන්නේ.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

මම ඒක සොයා බලනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කොහොම වුණත් ඔබතුමා වගකීම ගන්න ඕනෑ.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

වගකීම මම ගන්නවා. මම සොයා බලනවා. නමුත් ඔය කරන්නේ අද ඊයේ ඉඳලා නොවෙයි. ඒ ව්‍යාපාරය දිගටම කෙරීගෙන යනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ඔබතුමා මගින් ගරු ඇමැතිතුමා යම් කාරණයක් ගැන දැනුවත් කරනවා වාගේම ඒ ගැන පරීක්ෂණයක් කළ යුතුයි කියලා මම විශ්වාස කරනවා. එහෙම නැත්නම් මම අදාළ ඉහළ බලධාරීන්ට දැනුම් දෙනවා, මේ පිළිබඳව පරීක්ෂණයක් කළ යුතුයි කියලා. මේ ඉඩම් හිමියා පර්චසය ලක්ෂ 21 ගණනේ මේ ඉඩම දෙන්න කැමැති වෙලා තිබෙනවා. 22 ගණනේ කියලා, 21 ගණනේ. නමුත් අපි දන්න විධියට ඊට වඩා විශාල මුදලකට, ලක්ෂ 28 කට වාගේ විකුණලා තිබෙනවා කියලා කියනවා. මෙතුමා හරියට ගණන දන්නේ නැහැ. හැබැයි, මේ අනුව කිසියම් පුද්ගලයෙකුට අතයට පර්චස් 247 කට මුදල් ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා ඒ පිළිබඳව පරීක්ෂාවක් කරන්න කියලා ඉල්ලීමක් කරනවා. ඒ අනුව බැලුවාම ලක්ෂ 7 ගණනේ එළියට ගිහිල්ලා තිබෙනවා. පර්චස් දෙසි ගණනකට.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

එහෙම අරගෙන තිබෙන්නේ, ජානක සූරිය බණ්ඩාර.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේ පිළිබඳව සොයා බලන්න කියලා ඔබතුමා මගින් ඉල්ලා සිටිනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ප්‍රදේශයේ මන්ත්‍රීවරයා, ජානක සූරිය බණ්ඩාර මන්ත්‍රීතුමා අරගෙන තිබෙන්නේ.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ගරු සභාපතිතුමනි, මෙතුමා මෙහෙම කථා කරනවා. මම දන්නෙවත් නැහැ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, අපේ කාලයේ වෙන්නේ නැහැ නේ? මෙතුමාගේ කාලයේ කොහොමද වුණේ ? ජානක සූරිය බණ්ඩාර කොමිස් එක ගන්න ඇති.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ලක්ෂ 35 ගණනේ දැනට ඉල්ලනවා.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ගරු සභාපතිතුමනි, මගේ නම ගාවනවා මේ මන්ත්‍රීතුමා. මේ අහක තිබෙන කුණු ගොඩවල්වලට. මගේ ආසනයේ තමයි මම දන්නෙත් නැහැ. මම ඇමැතිතුමාට දොස් කිව්වා. මම නොදැනුවත්ව කෙරුවා කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, අපේ මන්ත්‍රීවරුත් ඉන්නවා. ඉඩම් අරන් දීලා, සම්බන්ධ වෙලා, ඒ අයටත් කොමිස් දීලා නැහැ. මොකක්ද දෙන්නේ?

**ගරු අමල් සිල්වා**
Hon. Amal Silva

මන්ත්‍රීවරුන්ගේ නම් කියන්න කෝ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර වාඩි වෙන්න. මේ සභාවේ අනවශ්‍ය විවාදවලට යන්න දෙන්න බැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, බෝකර් ගාස්තු නොලැබීමේ ප්‍රශ්නත් තිබෙනවා. අර ඉන්න සභාපති බ්‍රෝකර් ගාස්තු ටිකත් ගහලා. කීර්ති නන්ද ද? කවුද? බ්‍රෝකර් ගාස්තුවත් යට ගහලා. ඔබතුමා දන්නේ නැහැ. ඒකටත් පිල්ලි ගහලා. සමහරවිට ඔබතුමා දන්නේ නැතිව ඇති.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඔබතුමා දැන් වාඩි වෙන්න. කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. ලලිත් වනිගරත්න ගරු ඇමැතිතුමා, එතුමා දැන් ඔබතුමාට බරපතළ ප්‍රකාශයක් කළේ කොමිස් එක මෙච්චරයි කියලා. ඔබතුමා ඒ ගැන සොයා බලා සභාවට වාර්තාවක් ඉදිරිපත් කරන්න. ඔබතුමා කොමසාරිස්තුමා එක්ක සාකච්ඡා කරන්න.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කරපු ප්‍රකාශය පිළිබඳව තොරතුරු සොයා බලලා ඉදිරිපත් කරන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා කියනවා, තව මන්ත්‍රීවරයෙක් කොමිස් ගත්තා කියලා. සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා ප්‍රසිද්ධියේ කිව්වා, තවත් මන්ත්‍රීවරුන්ට කොමිස් ගියා කියලා. ඒ කාරණාව ඔක්කොටම අදාළ වෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

නැහැ. බ්‍රෝකර් ගාස්තු ගියා කියන්නේ නැහැ ගරු සභාපතිතුමනි. සමහර අපේ මන්ත්‍රීවරු ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සමහර කියන්නේ. ඔබතුමා නම් කියන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

හිටපු මන්ත්‍රීවරු ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔක්කොමලා සම්බන්ධ වෙනවා. ගම්පහ දිස්ත්‍රික්කයේ ඉන්න.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

කවුද කියලා කියන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේ පැත්තේ නැහැ. පැහැදිලිව කියන්නම් මේ පැත්තේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙමනම් ඔබතුමා ඒ වාගේ ප්‍රකාශ කරන්න එපා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

දැනට දැනුවත්ව නැහැ. දැනගත්තොත් ඔබතුමාට කියනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බරපතළ ප්‍රකාශයක් ඔබතුමා කරන්නේ. නම් ටික කියන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මම කිව්වේ හිටපු මන්ත්‍රීවරු. මම නම් කරලා කිව්වේ නැහැ, මෙතැන මන්ත්‍රීවරු කියලා. හිටපු මන්ත්‍රීවරු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කිව්වේ, සමහර මන්ත්‍රීවරු කියලා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

දැන් මන්ත්‍රීවරුත් ඉන්න පුළුවන්. අනේ කරුණාකරලා කාටවත් මම එහෙම මඩ ගහන්න බලාපොරොත්තු වුණේ නැහැ. එහෙම කාටවත් ඇඟිල්ල දික් කරන්න එපා ගරු සභාපතිතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙනම් ඔබතුමා ඒ වාගේ ප්‍රකාශ නොකර ඉන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමාට මම කියන්නේ මේක බරපතළ -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කාලය. කාලය.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

කවුරු හරි මන්ත්‍රීවරයෙක් ඉඩමක් විකුණන්න මැදිහත් වෙලා බෝකර් ගාස්තු ගැනීමේ වරදක් නැහැ. හැබැයි බ්‍රෝකර් ගාස්තුවත්, මේ දාපු මනුස්සයා ඒකත් පිල්ලි ගහලා. ඒකයි මම කියන්නේ. බ්‍රෝකර් ගාස්තු ගැනීම ඉඩම් ගනුදෙනුවකදී වරදක් නැහැ. මන්ත්‍රීවරයෙක්. ඇමැතිවරයෙක් ගත්තත් වරදක් නැහැ. හැබැයි, ඒක නොවෙයි. මම කියන්නේ. රජයේ ආයතනත් මැදිහත් වෙලා, රජයේ ආයතනත්, සම්බන්ධ වෙලා ජනතාවත් දැනුවත් කරලා ඒවායෙන් පිල්ලි ගහන එකයි මම කියන්නේ.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ගරු මන්ත්‍රීතුමා ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් වාඩි වෙන්න. මේ ප්‍රශ්නය තවම ඉවර නැහැ නේ?

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ගරු සභාපතිතුමනි, 36(1).

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, උත්තරයක් දෙනවා. පොඩ්ඩක් ඉන්න. ඔබතුමා වාඩි වෙන්න කෝ. ගරු ඇමැතිතුමා උත්තරයක් දෙනවා.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි,

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

තොප්පි දා ගන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කොමිස් ගත්තේ නැත්නම් කලබල වෙන්න ඕනෑ නැහැ. වාඩි වෙලා ඉන්න. ඔච්චර කළබල මොකද? ඇමැතිතුමා ප්‍රකාශයක් කරනවා. පොඩ්ඩක් නිශ්ශබ්ද වන්න. කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, මේ ව්‍යාපාරය ඉතාමත් විනිවිධභාවයෙන් සිද්ධ වෙන ව්‍යාපාරයක්. මොකද,මේකේ බෝඩ් එකක් තිබෙනවා. මේකේ ලෝයර්ස්ලා කට්ටියක් ඉන්නවා. එතකොට මේවායේ තක්සේරුකරුවත් බලලා -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

බොරු කියන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට, ඔබතුමා අභියෝග කරන්න යන්න එපා. එතුමාට ප්‍රකාශයක් කරන්න අවස්ථාවක් දෙන්න.

**ගරු ලලිත් වනිගරත්න - අමාත්‍යතුමා**
Hon. Lalith Wanigaratna - Minister

එතුමා මේ කාගේ හරි ලණුවක් කාගෙන හැමදාම දොඩවන්නේ. මෙතුමාගේ ප්‍රශ්න. ලබන පාර පළාත් සභාවට එන්නේ නැති නිසා ඔය. මේක අපේ සමූපකාර සංගමයෙන් කරන ව්‍යාපාරයක්. මේක විනිවිධභාවයකින් කරන වැඩක්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, එතුමාට බාධා කිරීම් කරන්න එපා. ගරු ඇමැතිතුමා, ඔබතුමා පැහැදිලිව ප්‍රකාශ කරන්න.

**ගරු ලලිත් වනිගරත්න - අමාත්‍යතුමා**
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, දැන් අපේ අම්බලමුල්ලේ. ගරු මන්ත්‍රීතුමිය මම දන්නෙත් නැහැ අම්බලමුල්ලේ ඉඩමක් ගත්තා කියලා කිව්වා. ඉතින් මම කුලප්පු වෙනවාද අපේ ආසනයේ කියලා. ඉඩම් ගනිද්දී මේ ආසනයේ ඉන්න මන්ත්‍රීවරු දැනුවත් කරන්න ඕනෑද? මේක මහ බොරුවක් නේ? මේ කවුරු හරි යමක් කරගන්න බැරිව පීඩාවෙන් කෑගහන අයයි. මේක අපි විනිවධභාවයෙන් කරන වැඩක්. ඒක නිසා මේ කවුරු හරි ලණුවක් දුන්නාම ඕක ප්‍රශ්න අහලා නිකන් - මම ඇත්තටම දන්න දේ තමයි, දැන් ඉඩම ගත්තාම ඒ ඉඩම්කාරයා ඉඩම ලබා දුන්නු මිනිහාට කීයක් හරි දෙන එකට අපට කරන්න දෙයක් නැහැ නේ? අපේ ආයතනයෙන් අපි සල්ලි දෙන්නේ නැහැ නේ? අපි දෙන්නේ නැහැ. දැන් 35 ට -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

කැමිලස් ප්‍රනාන්දු සභාපති හැටියට ඉන්න කොට විනිවිදභාවය ගැන ප්‍රශ්නයක්. එයා ඉඩම් ව්‍යාපාරිකයෙක්. ඔබතුමා සොයලා බලන්න කෝ. කියනවාට.

**ගරු ලලිත් වනිගරත්න - අමාත්‍යතුමා**
Hon. Lalith Wanigaratna - Minister

එයා ලාන්සා ඇමැතිතුමාගේ කාලයේ ඉඳලාම ඉන්නවා, කැමිලස් ප්‍රනාන්දු කියන කෙනා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

යහපාලනය වෙනුවෙන් පෙනී සිටින ඔබතුමන්ලා -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

නඩුවක් දාගන්න. නඩුවක් දාගන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

යහපාලනය වෙනුවෙන් පෙනී ඉන්න ඔබතුමාත් ඒ වැරැද්ද කරනවාද? ඒක නේ?

**ගරු ලලිත් වනිගරත්න - අමාත්‍යතුමා**
Hon. Lalith Wanigaratna - Minister

මම වැරැදි කරන්න යන්නේ නැහැ. ඔබතුමන්ලා නිකන් මේ ලණු -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

කරපු වැරැදි ඔබතුමන්ලාගේ කථා කළොත් - අපට වෙලාවක් අරගෙන - අපට වෙනම විවාදයක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, දැන් මේ අනවශ්‍ය විවාදවලට යන්න දෙන්න බැහැ. ගරු ඇමැතිතුමා, ඔබතුමාගේ ප්‍රකාශය පැහැදිලියි.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ මම වරප්‍රසාද ප්‍රශ්නයක් යොමු කරනවා. අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා මට චෝදනා කෙරුවා, මගේ නම කියලා. එතකොට කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා නිකන් වටෙන් කියනවා, මම ඉඩම් බ්‍රෝකර් වැඩක් කරලා -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

නැහැ. නැහැ. ඔබතුමා ගැන කිව්වේ නැහැ.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

නැහැ. නැහැ. ඔබතුමා කිව්වා. මගේ හෘදය සාක්ෂිය දන්නවා නේ?

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න . එතුමා -

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

කරුණාකර මට කියන්න දෙන්න කෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට කියන්න දෙන්න.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ගරු සභාපතිතුමනි, අපේ ගරු ඇමැතිතුමා කිව්වා වාගේ මේ ආයතනය අද ඊයේ පිහිටවපු එකක් නොවෙයි. මේක එදා මහ ඇමැතිතුමා ඉන්න කාලයේ ඉඳන් තිබුණා. දිගටම තිබෙන ආයතනයක්, මේ බැංකු ආයතනය. මේ බැංකු ආයතනයෙන් මම ලක්ෂ 40 ක Loan එකක් අරගෙන තිබෙනවා. ඒ වාගේ Loan දෙන ආයතනයක්. මේ ආයතනයේ සල්ලි තිබෙනවා. ඒ හින්දා මේ වාගේ ඉඩම් අරන් දාලා තිබුණා. වත්තල ඇවරිවත්ත පාරෙත් ඉඩමක් අරගෙන දාලා තිබුණා. බොහොම වටිනා පර්චස් 100 ක ප්‍රමාණයක්. නමුත් මම මැදිහත් වුණේ නැහැ. මගේ යාළුවෙක් මැදිහත් වෙලා, මෙතුමා කියන්නේ ඔය ගැන තමයි. මගේ යාළුවෙක් මැදිහත් වෙලා ඒ ඉඩම සමූපකාරයේ ඒ නිලධාරීන් එක්ක කථා කරලා බැංකුව සතු ඉඩමක් නිසා, ඉඩම් සේල් කාරයෙකුට විකුණලා දුන්නා. නමුත් තමුන්නාන්සේ කියනවා නම් ශත පහක් හරි, ඒ විකුණපු මිනිහා හරි, ඒ බ්‍රෝකර් හරි සල්ලි අරගෙන තිබෙනවා නම් මම මේ මන්ත්‍රීකමෙන් අයින් වෙනවා. හරිද? අපි අරගෙන නැහැ. ගරු සභාපතිතුමනි, අපි අරගත්තේ නැහැ. ඒ එදා කරපු දේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, හරි.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ඒ එදා කරපු දේ. කලින්. දැන් ඔය ඉඩම සම්බන්ධව තිබෙන දේ මම මොකුත්ම දන්නේ නැහැ. මේ මන්ත්‍රීතුමා කියනවා, කොමිස් ගත්තා කියලා. මේගොල්ලෝ තමයි එහෙමනම් ඒකට කොමිස් අරගෙන තිබෙන්නේ. ඒ නිසා මම ඔය ගැන කිසිම දෙයක් දන්නේ නැහැ. මට කියන්න තිබෙන්නෙ එච්චරයි. අර ඉඩම විකුණලා දුන්නා මිසක් මම මේ ඉඩම් විකුණන්න මැදිහත් වුණේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. පැහැදිලියි. අපි න්‍යාය පත්‍රයට යමු. හය වැනි ප්‍රශ්නය, එච්.එම්. උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා විසින් අධ්‍යාපන ගරු ඇමැතිතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය යොමු කරනවා.

**06.**

**එච්.එම්. උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/78)**

අ. මහරගම නගර සභාවට අයත් නාවින්න ක්‍රීඩා පිට්ටනියේ පිහිනුම් තටාකය ආරම්භ කර ඇත්තේ කුමන වර්ෂයේද?

ආ. මෙම පිහිනුම් තටාකය සංවර්ධනය කරන්නේ කුමන ආයතනය මගින්ද?

ඇ. පසුගිය වසර 2 තුළ මෙම පිහිනුම් තටාකය සඳහා ඔබ අමාත්‍යාංශයෙන් කොපමණ මුදලක් වියදම් කර ඇත්ද?

ඈ. එසේ වියදම් කර ඇතත් තවම එය නිම නොකරන්නේ මන්ද?

ඉ. මෙම පිහිනුම් තටාකය සඳහා 2017 වසරට කොපමණ මුදලක් වෙන් කර ඇත්ද?

ඊ. එම මුදල් වෙන් කර ඇත්තේ කුමන වැය ශීර්ෂය යටතේද?

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

අ. 2012 වර්ෂයේ

ආ. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ උපදේශකත්වය යටතේ ටෙක් වෝටර්ස් පුද්ගලික ආයතනය මගින් කොන්ත්‍රාත්තුව ඉටු කරනු ලැබේ.

ඇ. රුපියල් මිලියන 26.28

ඈ. ව්‍යාපෘති උපදේශක ලෙස කටයුතු කරන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ නිර්දේශ ඉදිරි ක්‍රියා මාර්ග සඳහා ඉල්ලා ඇති අතර, ඒ අනුව ව්‍යාපෘතියේ මීළඟ අදියර වටිනාකම තීරණය කළ යුතු බැවින් මේ වන විට කටයුතු තාවකාලිකව නවතා ඇත. ස්වාභාවික හේතූන් මත විනාශ වීමට ඇති අවස්ථාවන් මඟහරවා කටයුතු ආරම්භ කිරීමට නියමිත අතර, දැනට අනුමත මුදල් ප්‍රමාණය ඊට ප්‍රමාණවත් නොවන බව ඔවුන් සඳහන් කරන බැවින් අදාළ වාර්තාව ලැබුණු පසු ප්‍රමාණවත් මුදලක් වෙන් කර දෙන ලෙස ප්‍රධාන ලේකම්තුමා වෙත දැන්වීමට නියමිතය.

ඉ. මිලියන 05 කි.

ඊ. පොදු ව්‍යාපෘති වැය ශීර්ෂය යටතේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, පළමුවැනි අතුරු ප්‍රශ්නය. ප්‍රශ්නයකටද උත්තර දුන්නේ? ලිපියක්ද කියෙව්වේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමාට තිබෙන්නේ, අතුරු ප්‍රශ්නයක් අහන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම කරුණු කියලා තිබෙනවා. තමුන්නාන්සේ පොඩ්ඩක් කහ වහගෙන ඉන්න කෝ. තමුන්නාන්සේත් තැම්බිලා ඉන්නේ යහපාලනයෙන්. පොඩ්ඩක් ඉන්න. විජේදාසට වෙච්ච එක තමයි තමුන්නාන්සේටත් වෙන්නේ. පොඩ්ඩක් ඉන්න .

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කාලය නාස්ති කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අතුරු ප්‍රශ්න අහන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මම අහලා තිබෙනවා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා ඉන්න කාලයේ ප්‍රශ්නයක් ඇහුවාම ඔබතුමා මාස 06 ක් කල් ගත්තා. ඔබතුමා ප්‍රසන්න මහ ඇමැතිතුමාගෙන් මස හයක් කල් ගත්තා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, එතුමාට අනවශ්‍ය බාධා කිරීම් කරන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමා, මේ ප්‍රකාශයක් නේ කියෙව්වේ. ප්‍රශ්නයෙන් ප්‍රශ්නයට උත්තරයක් දෙන්න කෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා උත්තර දුන්නා නේ? ඔබතුමා හරියට අහගෙන ඉන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම ප්‍රශ්නයක් අහලා තිබෙනවා. (බාධා කිරීම්) ඔබතුමා ඇමැතිකම ගන්න . යහපාලනයෙන් ඇමැතිකම ගන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අතුරු ප්‍රශ්නයක් අහන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා නිශ්ශබ්ද වන්න. ඔබතුමාට අදාළ නැහැ නේ? ඔබතුමා කවුද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

පණ්ඩිතයා වෙන්න එපා. ප්‍රමාණයට ඉන්න. තාත්තාට වුණු දේ ඔබතුමාටත් වෙනවා. (බාධා කිරීම්) මම “අ” ප්‍රශ්නයට අහලා තිබෙනවා, මහරගම නගර සභාවට අයත් නාවින්න ක්‍රීඩා පිට්ටනියේ පිහිනුම් තටාකය ආරම්භ කිරීම සම්බන්ධව. කොයි වර්ෂයේ ද පටන් ගත්තේ කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා අහනවා, කොයි වර්ෂයේද පටන් ගත්තේ කියලා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ප්‍රකාශයක් නේ කළේ. මට උත්තරයක් දෙන්න කෝ? අද බැරි නම් වෙන දවසක හරි දෙන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මම උත්තර දුන්නා. ඕනෑ නම් මම සභාගත කරන්නම්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අද බැරි නම් වෙන දවසක හරි දෙන්න ඇමැතිතුමාට කල් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා උත්තරය සභාගත කරනවා. ඔබතුමාට අහන් ඉන්නත් බැහැ. මේවා ඔබතුමාට ඇහෙන්නෙත් නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමා, අහගෙන ඉඳලා නැහැ. දැන් හත්වැනි ප්‍රශ්නය තිබෙන්නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ පිහිනුම් තටාකයට පසුගිය අවුරුද්දේ ලක්ෂ 30 ක් දුන්නා. මෙතුමා වෙන් කරලා. නමුත් ඒකේ වැඩ කළෙත් නැහැ. දැන් ගරු මහ ඇමැතිතුමා මේ වන කොට ඒ මහරගම මහ ඇමැතිතුමා ඉන්න ප්‍රදේශය හැටියට මේ පිහිනුම් තටාකය හදන්න -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට රැස්වීම් තියන්න දෙන්න බැහැ. කරුණාකර අදාළ ප්‍රශ්නය විතරක් අහන්න .

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම දන්න තරමින් five million දීලා තිබෙනවා. එතකොට තවම මේ ගැන එක සාකච්ඡාවක්වත් තියලා වැඩක් ආරම්භ කරලා නැහැ. මේකේ තිබෙන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මේ -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

යකඩ ටික කුඩ්ඩෝ කපන් යනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ රැස්වීම් තියන්න හදනවා. ප්‍රශ්න තුනක් අහන්න. ඔබතුමා සභාව තුළ රැස්වීම් තියන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේකට මහ ඇමැතිතුමා සල්ලි දීලා තිබෙනවා. ඒ ආයතනයත් එක්කලා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව කරන්නේ. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවත් එක්ක සාකච්ඡා කරලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, අනවශ්‍ය ප්‍රශ්නවලට යන්න එපා ඔබතුමා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ කොන්ත්‍රාත්කරුවන්ට මේක ආරම්භ කරන්න කියලා ඉල්ලන්නේ . නමුත් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න. ප්‍රශ්නය අහගෙන ඉන්නෙත් නැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

අතුරු ප්‍රශ්න අහනවා නම් උත්තර දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අතුරු ප්‍රශ්න අහන්නේ නැහැ නේ, ඔබතුමා. ඔබතුමා විස්තර නේ කරන්නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අතුරු ප්‍රශ්නවලට මම අහන්නේ, දැනට මේ දීලා තිබෙන මුදල්වලට ක්‍රියා කරලා තිබෙනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් වාඩි වෙන්න. වාඩි වෙලා අහගෙන ඉන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, අපි ඉතාම කඩිනමින් මේ ව්‍යාපෘතිය සම්බන්ධව සාකච්ඡාවක් පැවැත් වූවා. ඒ අනුව පොදු ව්‍යාපෘති වැය ශීර්ෂය යටතේ තමයි ලැබිලා තිබෙන්නේ. ව්‍යාපෘති උපදේශක ලෙස කටයුතු කරන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ නිර්දේශ අපි ඉල්ලලා තිබෙනවා. අපට ඉක්මණින්ම ලැබුණාම අපි ඒ කටයුතු විධිමත්ව පටන් ගන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙවැනි ප්‍රශ්නය අහන්න කෝ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

දැන් මේකේ උපදේශකයෙක් වශයෙන් කටයුතු කරන්නේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව. මේ අවුරුදු දෙකට ඉංජිනේරු සංස්ථාවත් එක්ක සාකච්ඡා වට කීයක් මේ ගැන තියලා තිබෙනවාද? මේ වන කොට අවුරුදු 02 යි මාස 07 යි දින 14 යි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ සම්බන්ධව සාකච්ඡා වට කීයක් තියලා තිබුණාද කියලා එතුමා අහන්නේ?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

සාකච්ඡා වට තියන්න ප්‍රතිපාදන තිබෙන්න ඕනෑ නේ ගරු සභාපතිතුමනි. ප්‍රතිපාදන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තියලා නැහැ නේද ඔබතුමා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

සාකච්ඡා වට, මේ සම්බන්ධවද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. මේ සම්බන්ධව.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, අපි හැම උපදේශක කාරක සභාවකම මේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සම්බන්ධව කථා කරනවා. ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් ලැබුණු ප්‍රතිපාදන සම්බන්ධව පළමුවැනි සාකච්ඡාව තිබ්බා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට පැහැදිලිද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

තුන් වැනි ප්‍රශ්නය. ඔබතුමා මේ සාකච්ඡාවල එක දවසක් - මෙවැනි ලොකු ව්‍යාපෘතියක් සම්බන්ධව ඔබතුමා ඇමැති හැටියට ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් එක මීටින් එකක් හෝ සාකච්ඡාවක් හෝ තියලා තිබෙනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, එතුමා දැන් කිව්වා නේ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

නිලධාරීන් නොවේ. මෙතුමාගේ ප්‍රධානත්වයෙන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උපදේශක කාරක සභාව පවත්වන්නේ එතුමාගේ ප්‍රධානත්වයෙන් නේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපි බාධා කරනවා නොවෙයි. අපේ කාලය නාස්ති කරන්න දෙන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මාසෙන් මාසයට මේවායේ ප්‍රගති ගැන කථා කළා. ඒ නිසා තමයි මේ වැඩ වුණේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උපදේශක කාරක සභා තියන්නේ ඇමැතිතුමාගේ ප්‍රධානත්වයෙන්. වෙන කාගෙන්වත් නොවෙයි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේවා මහජනයාගේ සල්ලි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ආ..... ඉස්සර කරපුවා මතක නැතිවද?

[සභාවේ ඝෝෂා]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, තුන් වැනි ප්‍රශ්නයට මට උත්තරයක් දුන්නේ නැහැ නේ? මම අහන්නේ ඇමැතිවරයෙක් හැටියට, ඇමැතිතුමාගේ විෂයය පථයට අයත් ව්‍යාපෘතියක් හැටියට මෙතුමා එක දවසක් මේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවයි, ඒ කොන්ත්‍රාත් සමාගම වන වෙට් වෝටර් ආයතනයත් එක්ක එක දවසක් වාඩි වෙලා කථා කරලා තිබෙනවාද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මම සාකච්ඡා පවත්වලා තිබෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එම සාකච්ඡාවල වාර්තාවන් ලබන සභාවට ඉදිරිපත් කරන්නය කියලා ගරු සභාපතිතුමා මගින් මම ඉල්ලනවා.

මෙතුමාගේ ප්‍රධානත්වයෙන් තියපු සාකච්ඡා වාර්තා මට ඉදිරිපත් කරන්නය කියලා ඉල්ලනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, එතුමා කියන්නේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවත් එක්ක, අදාළ කොන්ත්‍රාත් ආයතනයත් එක්ක සාකච්ඡා කළාද කියලා එතුමා අහන්නේ. ඒවායේ වාර්තාවන් එතුමා මම හරහා ඉල්ලනවා. කරුණාකර මට ඒ වාර්තාවන් දෙන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මම කියන්න ඕනෑ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා කියන්නේ උපදේශක කාරක සභා නොවෙයි.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ආයේ කිසිම දවසක මේ අදහස මේ සභාවේ පළ කරන්නේ නැහැ. මේ අද අවසන් දවස. මේ රීති සංග්‍රහයට පිටින් යන එකයි මේ ප්‍රශ්නය. කොච්චර වුණත් මම ඒකට සමගාමීව කටයුතු කරන්න කැමැතියි. ඉතින් මේ විස්තරාත්මකව ප්‍රකාශ කරන්න ගියාම සභාපතිතුමාත් අසීරුවට පත් වෙනවා. අපිත් අසීරුවට පත්වෙනවා. මම දන්නෙත් නැහැ, අහන්නේ මොනවද කියලා. මම ඒකට උත්තර දීලා තිබෙනවා. සභාපතිතුමා ඉල්ලීමක් කරනවා නම් මම ඒක දෙන්න කැමැතියි. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හත්වැනි ප්‍රශ්නයත් උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා විසින් අධ්‍යාපන ගරු ඇමැතිතුමාට ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**07.**

**එච්.එම්. උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරුතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/79)**

අ. 2016 වර්ෂයට බස්නාහිර පළාත් සභා අයවැයෙන් ක්‍රීඩා අමාත්‍යාංශයට කොපමණ මුදලක් වෙන් වී ඇත්ද?

ආ. එම මුදලින් බස්නාහිර පළාත් සභාවේ පාසල් ක්‍රීඩාංගණ සඳහා කොපමණ මුදලක් වෙන් කර ඇත්ද?

ඇ. පළාත් සභා ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා කොපමණ මුදලක් වෙන් කර ඇත්ද?

ඈ. බස්නාහිර පළාතේ ක්‍රීඩා සමාජ සඳහා වියදම් කර ඇති මුදල කොපමණද?

ඉ. එම ක්‍රීඩා සමාජ කුමන දිස්ත්‍රික්කවලට අයත්ද?

ඊ. ඉතිරි මුදල් ප්‍රමාණය කොපමණද?

උ. පළාත් සභා මන්ත්‍රීවරුන්ට මුදල් වෙන් කර ඇත්ද?

ඌ. ඒ කුමන මන්ත්‍රීවරුන් සඳහාද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අ. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - රු.මිලියන 20.00
පළාත් සංවර්ධන ප්‍රදාන - රු.මිලියන 63.89
වාර්ෂික අනුමත ප්‍රතිපාදන - රු.මිලියන 25.00

ආ. රු.මිලියන 7.52

ඇ. රු.මිලියන 24.748

ඈ. රු.මිලියන 29.415

ඉ. කොළඹ, ගම්පහ හා කළුතර දිස්ත්‍රික්ක
කොළඹ දිස්ත්‍රික්කයේ ක්‍රීඩා සමාජ 438 ක් සඳහා ක්‍රීඩා භාණ්ඩ ලබා දී ඇත.
ගම්පහ දිස්ත්‍රික්කයේ ක්‍රීඩා සමාජ 651 ක් සඳහා ක්‍රීඩා භාණ්ඩ ලබා දී ඇත.
කළුතර දිස්ත්‍රික්කයේ ක්‍රීඩා සමාජ 688 ක් සඳහා ක්‍රීඩා භාණ්ඩ ලබා දී ඇත.

[ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා]

ඊ. සියලුම මුදල් ව්‍යාපෘතිගත කර ඇති බැවින් ප්‍රතිපාදන ඉතිරියක් නොමැත.

උ. නැත.

ඌ. අදාළ නොවේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මෙතුමා මිලියන ගණනක් කිව්වා. එතකොට මම අවසානයේ අහලා තිබෙනවා, මිලියන කීයක් ඉතුරු වෙලා තිබෙනවාද කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැයි කියලා කිව්වා නේ? එතුමා නැහැ කියලා කිව්වා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

නැහැ. එතකොට දෙවැනි ප්‍රශ්නය, මම අහන්නේ මේ පාසල් ක්‍රීඩා පිට්ටනිවලට කොපමණ වියදම් කරලා තිබෙනවාද කියලා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම උත්තරයක් දෙන්නම්. ගරු සභාපතිතුමනි, රුපියල් මිලියන 7.52 යි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඔබතුමා වාඩි වෙන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්න අහන කොට මේ කාලය යනවා. ඒ නිසා ගරු ඇමැතිතුමා කලින් හම්බ වෙලා ප්‍රශ්නවලට උත්තර සොයාගෙන මෙතැනට එන්න කියන්න. මුහුණට මුහුණ හම්බ වෙනවා නේ? නැත්නම් මෙතුමා කියන දේවල් මෙතුමාට ඇහැන්නේ නැහැ. තේරෙන්නේ නැහැ. ලොකු ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අට වැනි ප්‍රශ්නය. එම ප්‍රශ්නයත් උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාගෙන්ම අධ්‍යාපන ගරු ඇමැතිතුමාටමයි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**08.**

**එච්.එම්. උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරුතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/80)**

අ. 2017 වර්ෂයට බස්නාහිර පළාත් සභා අයවැයෙන් ක්‍රීඩා අමාත්‍යාංශයට කොපමණ මුදලක් වෙන් වී ඇත්ද?

ආ. එම මුදලින් බස්නාහිර පළාත් සභාවේ පාසල් ක්‍රීඩාංගණ සඳහා කොපමණ මුදලක් වෙන් කර ඇත්ද?

ඇ. පළාත් පාලන ආයතනවල ක්‍රීඩා පිට්ටනි කොපමණ ඉදි කර ඇත්ද?

ඈ. පළාත් සභා ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා කොපමණ මුදලක් වෙන් කර ඇත්ද?

ඉ. බස්නාහිර පළාතේ ක්‍රීඩා සමාජ සඳහා වියදම් කර ඇති මුදල කොපමණද?

ඊ. එම ක්‍රීඩා සමාජ කුමන දිස්ත්‍රික්කවලට අයත්ද?

උ. ඉතිරි මුදල් ප්‍රමාණය කොපමණද?

ඌ. පළාත් සභා මන්ත්‍රීවරුන්ට මුදල් වෙන් කර ඇත්ද?

එ. ඒ කුමන මන්ත්‍රීවරුන් සඳහාද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අ.

| | | | |
|---|---|---|---|
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | - | රු.මිලියන | 05.00 |
| පළාත් සංවර්ධන ප්‍රදාන | - | රු.මිලියන | 40.00 |
| 1703 වැය ශීර්ෂ | - | රු.මිලියන | 27.00 |

ආ. රු.මිලියන 1.6

ඇ. ක්‍රීඩා පිටි 08 ක් සඳහා මුදල් වෙන් කර ඇත.

ඇ. රු.මිලියන 10.255 යි.

ඉ. රු.මිලියන 3 යි.

ඊ. කොළඹ, ගම්පහ හා කළුතර දිස්ත්‍රික්ක.
කොළඹ දිස්ත්‍රික්කයේ ක්‍රීඩා සමාජ 06 ක් සඳහා ක්‍රීඩා භාණ්ඩ ලබා දී ඇත.
ගම්පහ දිස්ත්‍රික්කයේ ක්‍රීඩා සමාජ 10 ක් සඳහා ක්‍රීඩා භාණ්ඩ ලබා දී ඇත.
කළුතර දිස්ත්‍රික්කයේ ක්‍රීඩා සමාජ 02 ක් සඳහා ක්‍රීඩා භාණ්ඩ ලබා දී ඇත.

උ. සියලුම මුදල් ව්‍යාපෘතිගත කර ඇති බැවින් ප්‍රතිපාදන ඉතිරියක් නොමැත.

ඌ. නැත.

එ. අදාළ නොවේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මම අහලා තිබෙනවා කොයි මන්ත්‍රීවරුන්ටද මේක දීලා තිබෙන්නේ? කොයි කොයි ප්‍රදේශවලටද? කියලා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

නැත.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එතකොට කොළඹ ප්‍රදේශයේ මන්ත්‍රීවරයෙකුට දීලා නැහැ නේ?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

නැත.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අදාළ නැහැ කියන්නේ අදාළ නැහැ තමයි. දීලා නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා කිසිම මන්ත්‍රීවරයෙකුට දීලා නැහැ. නව වැනි ප්‍රශ්නය, අජන්ත නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ප්‍රශ්නය ඉදිරිපත් කිරීමේ අවස්ථාව. ගරු මන්ත්‍රීතුමා සභා ගර්භයේ නැහැ. ගරු ප්‍රධාන අමාත්‍යතුමා පිළිතුර තිබෙනවා නම් සභාගත කරන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, පිළිතුර සභාගත කරනවා.

** [සභාගත කරන ලද පිළිතුර]*
*[Tabled Answer]*

**09.**

***අජන්ත නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :***

***(ප්‍ර/vi(1)/17/81)***

***ප්‍රශ්නය :***

*අ. මොරටුව හිටපු නගරාධිපති සම්බන්ධව පත් කළ ඒකපුද්ගල කමිටුවේ තීන්දුව කුමක්ද?*

***පිළිතුර :***

*අ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 07/1959 හා 2016.03.21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයට ඇතුළත් වන පරීක්ෂා කළ යුතු චෝදනා අතරින් 1 හා 2 චෝදනාවන්ට වරදකරු බවට නිගමනය කර ඇත.*

***ප්‍රශ්නය :***

*ආ. වැරැදිකරුවන් සිටීද? ඒ පිළිබඳව ගන්නා තීන්දුව කුමක්ද?*

***පිළිතුර :***

*ආ. මොරටුව මහ නගර සභාවේ හිටපු නගරාධිපති ඔහුට එරෙහිව වූ චෝදනා තුනෙන් චෝදනා දෙකකට වරදකරු වී ඇත. එහෙත් ඒ වන විට මොරටුව මහ නගර සභාවේ ධූර කාලය අවසන් වී තිබූ තත්ත්වය යටතේ බස්නාහිර පළාතේ 1991 අංක 4 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තිය යටතේ වැඩිමනත් තීන්දුවක් ගැනීමට නොහැකි වී ඇත.*

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

***ප්‍රශ්නය :***

*ඈ. වාර්තාව සභාගත කිරීමට කටයුතු කරන්නේද? නොඑසේ නම් ඒ මන්ද?*

***පිළිතුර :***

*ඈ. නැත. අදාළ පරීක්ෂණ සභාව හා ඊට අදාළ වාර්තා කිරීම සම්බන්ධව කොළඹ පළාත්බද මහාධිකරණයෙහි තවදුරටත් නඩුවක් විභාග වෙමින් පවතින තත්ත්වය යටතේ දැනට එම පරීක්ෂණ වාර්තාව සභාගත කළ නොහැක.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දහවැනි ප්‍රශ්නය, රජිත රංගන හපුආරච්චිගේ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කර ඇති ප්‍රශ්නය ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කිරීමේ අවස්ථාව.

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**10.**

**රජිත රංගන හපුආරච්චිගේ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/vi(1)/17/82)**

අ. කටාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සභාව සතු වැව් ගණන කීයද?

ආ. i. මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් අයිවන්ද සිල්වා මාවතේ පුද්ගලික ඉඩමක වැවක් සාදා සභාවට පරිත්‍යාග කරන ලෙස කටාන ප්‍රාදේශීය සභාවෙන් ඉල්ලීමක් කර තිබේද?

ii. පොල් වගාව හැර වෙනත් කිසිදු කටයුත්තක් සිදු නොකරන ප්‍රදේශයක එවැනි වැවක් සාදා සභාවට පරිත්‍යාග කරන ලෙස සභාව මගින් ඉල්ලුම් කිරීම සිදු වන්නේ කුමන පදනමක් යටතේද?

ඇ. එම වැව සාදා සභාවට පරිත්‍යාග කරන ලෙස කටාන ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයා හා වෙනත් දේශපාලන බලවතෙකු විසින් අදාළ ඉඩමේ අයිතිකරුවන්ගෙන් ඉල්ලීමක් කර ඇති බව පිළිගන්නේද?

ඈ. වැවක් සාදන මුවාවෙන් එම වළෙන් ගොඩ දමන ලද පස් යොදා ගනිමින් වගුරු සහිත භූමියක් ගොඩ කර ඇති බව ඔබතුමා පිළිගන්නේද?

ඉ. මෙම වැව ඉදි කිරීම සම්බන්ධව සමස්ත ක්‍රියාවලිය ප්‍රෝඩාකාරී මවාපෑමක් ලෙස ඔබතුමා පිළිගන්නේද?

ඊ. එම අක්‍රමිකතාවලට සෘජුව හා වක්‍රව සම්බන්ධ පාර්ශවයන්ට එරෙහිව ඔබතුමා ගන්නා ක්‍රියා මාර්ග මොනවාද?

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අ. කටාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ, සභාව සතු නියමානුකූල වැව් කිසිවක් නොමැත. එහෙත් කටාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි අක්කරයක තරම් භූමි ප්‍රමාණයක් වැවක් හා සමාන ජලය පිරුණු වළක් සහිත භූමි ප්‍රමාණයක් කටාන ප්‍රාදේශීය සභාව වෙත පවරා දීමක් සිදුව ඇති බවට වාර්තා වී ඇත.

ආ. i. කටාන ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිතුමා විසින් එවැනි ඉල්ලීමක් කර ඇත.

ii. ඉල්ලීම කිරීමට හේතු වූ පිළිගත හැකි පදනමක් තිබූ බවට කරුණු අනාවරණය නොවේ. එහෙත්, ගොනුවට අදාළ ලේඛන අනුව, එහි මිරිදිය මත්ස්‍ය පොකුණු ව්‍යාපෘතියක් ආරම්භ කිරීම උදෙසා ක්‍රියාත්මක වෙමින් ලියවිලි හුවමාරු වී ඇත.

ඇ. කටාන ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපති විසින් එවැනි ඉල්ලීමක් කර ඇති බව පිළිගනිමි.

ඈ. පිළිගනිමි.

ඉ. පවත්නා තත්ත්වය තුළ වැව ඉදි කිරීම හා සම්බන්ධ ක්‍රියාවලිය අවිධිමත් ක්‍රියාවක් බව පිළිගනී.

ඊ. මීට වසර පහකට පූර්වයෙන් සිදුව ඇති ක්‍රියා මාර්ගයක් හෙයින්, පවත්නා නීතියේ විධිවිධානයන්ට අනුව වර්තමානයේ ගත හැකි ක්‍රියා මාර්ග සඳහා අදාළ අධිකාරීත්වයන් වෙත වාර්තා කරමි. එසේම, කරුණට අදාළ පූර්ණ විමර්ශනයක් සිදු කර එමගින් අනාවරණය වන කරුණු මත බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා වශයෙන් වර්තමානයේ ගත හැකි ක්‍රියාමාර්ග වේ නම් ඊට අදාළව ක්‍රියාත්මක වෙමි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එකළොස් වැනි ප්‍රශ්නයත් රජිත රංගන හපුආරච්චි ගරු මන්ත්‍රීතුමා ගෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**11.**

**රජිත රංගන හපුආරච්චිගේ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/vi(1)/17/83)**

අ. කටාන ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයා හා වෙනත් දේශපාලන බලවතෙකුගේ ඉල්ලීමට අනුව අයිවන් ද සිල්වා මාවතේ ප්‍රශ්නගත වෙන්දේසි ඉඩමේ ඉදි කර ඇති වැව පාරිසරික ගැටලු රැසකට හේතු වී ඇති බව ඔබතුමා පිළිගන්නේද?

ආ. i. එම ඉඩමේ වැවක් සාදා සභාවට පරිත්‍යාග කිරීමට කැමැත්ත පළකල අයිතිකරුවන් විසින්ම අදාළ වැවේ පස් යොදා ගෙන ඉඩම ගොඩ කිරීමෙන් අනතුරුව එම ඉඩම කට්ටි කොට විකිණීමට කටාන ප්‍රාදේශීය සභාවෙන් ඉල්ලීමක් කර තිබේද?

ii. 2012.05.03 වන දින සිට වසර පහක් ගතවන තුරුම කට්ටි සැලසුමට අදාළ කොන්දේසි ඉටු නොකිරීම සම්බන්ධයෙන් කටාන ප්‍රාදේශීය සභාව ගෙන ඇති ක්‍රියා මාර්ග මොනවාද?

iii. ඉඩම විකුණා වසර 05 ක් ගත වන තුරුත් කට්ටි සැලසුම් අනුමත නොකර සිටීම තුළ ගැනුම්කරුවන්ට අපහසුතා රැසකට මුහුණ දීමට සිදුව ඇති බව ඔබතුමා පිළිගන්නේද?

iv. මෙම ගැනුම්කරුවන්ට සාධාරණයක් ඉටු කිරීමට ඔබතුමා ගන්නා ක්‍රියා මාර්ග මොනවාද?

ඇ. මෙම ඉඩමේ වැව සෑදීමේ සිට ඉඩම් කට්ටි කර විකිණීම දක්වා සිදු වී ඇති අක්‍රමිකතා සම්බන්ධයෙන් ඔබතුමා ගන්නා ක්‍රියා මාර්ග මොනවාද?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අ. කටාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කඳවල ප්‍රදේශයෙහි පිහිටි සබීඩියා වත්ත ඉඩමෙහි ඉදි කර ඇති වැව පාරිසරික ගැටලු රැසකට හේතු වී ඇති බව පිළිගනිමි.

ආ. i. ඔව්.

ii. අනු බෙදුම් සැලැස්මට අනුමැතිය සඳහා කොන්දේසි හයක් සපුරන ලෙස ඉල්ලුම්කරු වෙත දැනුම් දී ඇතත්, එම කොන්දේසි සම්පූර්ණ වී නොමැත. ඒ අනුව අනුබෙදුම් සැලැස්ම සඳහා අනුමැතිය ලබා නොදීම හැර වෙනත් ක්‍රියා මාර්ගයක් ගෙන නොමැත.

iii. අනුබෙදුම් ඉඩමකට අදාළ අනුබෙදුම් සැලැස්මක් අනුමත වී, ඒ සඳහා අනුකූලතා සහතිකයක් ලැබීමට පූර්වයෙන් ඉඩම් කොටස් මිලදී ගැනීමෙන්, එසේ මිලදී ගනු ලබන්නන්ට අපහසුතාවයන්ට මුහුණ දීමට සිදුවන බව පිළිගනිමි.

iv. අදාළ අනුබෙදුම් සැලැස්ම අනුමත කිරීමට අදාළ සංවර්ධනකරු විසින් ඉටු කළ යුතු කොන්දේසි නිශ්චිත කාලයක් තුළ ඉටු කරවා ගැනීමෙන් පසු අනුබෙදුම් සැලැස්ම අනුමත කරලීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම පිණිස කටාන ප්‍රාදේශීය සභාවේ ලේකම් වෙත උපදෙස් ලබා දෙමි.

ඇ. තවදුරටත් සිදු කරන විමර්ශනයකින් අනතුරුව තීරණය කළ යුතුව ඇත.

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

ගරු සභාපතිතුමනි, මේ ඉඩම කට්ටි කරලා විකුණලා දැන් අවුරුදු 05 කට වැඩියි. දැන් අද වනතුරු කිසිම ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ. තවදුරටත් මේක ක්‍රියාත්මක වෙලා මේ ගැනුම්කරුවන්ට සාධාරණයක් ඉෂ්ට කරන්න කොපමණ කාලයක් යයිද? කියන එක තමයි මගේ අතුරු ප්‍රශ්නය.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

මම ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපති කෙනෙක්. අපි දැකපු දේ තමයි මේ Land sale එකක් සංවර්ධනය කරලා ඉඩම් දැම්මාම ගිහින් ගන්නවා. අනුමත කරලාද කියලා නගර සභාවෙන් අහලා ගන්නේ නැහැ. මම මේ සභාවේ ගෞරවය රකින්න ඕනෑ නිසා, මේ රීති රකින්න ඕනෑ නිසා උත්තරයක් දෙනවා මිසක් අපි ඒ අය ගැන කථා කරන්න අවශ්‍යතාවයක් නැහැ. ඔබතුමා යම් ඉඩමක් පළාත් පාලන ආයතන බලප්‍රදේශය තුළ මිලදී ගන්නවා නම් ඔබතුමා ඒක අනුමත කරලාද කියලා දැනගන්න ඕනෑ.

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

ගරු සභාපතිතුමනි, මම ගරු ඇමැතිමාගේ ඒ ප්‍රකාශයට විරුද්ධයි. ගරු සභාපතිතුමනි, අතුරු ප්‍රශ්නයක් නොවුණත් ඔබතුමා කියන නිසා යම්කිසි කාරණයක් කියන්න අවශ්‍යයි. මොකද, අපි සභාවක් විධියට හෝ පළාත් සභා හෝ පළාත් පාලන ආයතනයක් විධියට, රජයට විධියට අපට වගකීමෙන් නිදහස් වෙන්න බැහැ, ඒ මිනිස්සු සොයලා බලලා ගත්තේ නැහැයි කියලා. ඒ නිසා තමයි අපි ඉන්නේ. ඒ නිසා තමයි සභාවක් තිබෙන්නේ. ඒ නිසා එම අවශ්‍ය කටයුතු කළේ නැත්නම් ඒ මිනිස්සුන්ගේ පැත්තට ඒක තල්ලු කරලා නිකන් ඉන්න බැහැ. ගරු සභාපතිතුමනි, අපි ඒකට අවශ්‍ය ක්‍රියා මාර්ගයක් ගත යුතුයි. ඒ නිසා ඒකට මොකක්ද කරන්නේ කියලයි මට දැනගන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒකට අපට මොකුත් කරන්න බැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

එතුමා අහන ප්‍රශ්නයට උත්තරය මෙතැන තිබුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දොළොස් වැනි ප්‍රශ්නය. සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රවාහන, සමූපකාර ඇමැතිතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව. ගරු මන්ත්‍රීතුමා සභාවේ නැහැ. පිළිතුරු ලැහැස්ති නම් සභාගත කරන්න.

**ගරු ලලිත් වනිගරත්න - අමාත්‍යතුමා**
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, මම පිළිතුර සභාගත කරනවා.

** [සභාගත කරන ලද පිළිතුර]*
*[Tabled Answer]*

***12.***

***සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/84)***

***ප්‍රශ්නය :***

*අ. බස්නාහිර පළාතේ මාර්ග සංවර්ධන අධිකාරිය සතු මාර්ගවල රථ වාහන ධාවනය කළ හැකි උපරිම බරක් සහ වේගයක් තිබේද?*

***පිළිතුර:***

*අ. ඔව්.*

***ප්‍රශ්නය :***

*ආ. ටොන් 05 ට වඩා බර පැට වූ වාහන ධාවනය කළ නොහැකි මාර්ගවල විශාල බර වාහන ගමන් කරන බව ඔබතුමා දන්නේද?*

***පිළිතුර:***

*ආ. ඔව්.*

*ප්‍රශ්නය :*

*ඈ. මෙම නීති විරෝධී ක්‍රියාව හේතුවෙන් විශාල මුදලක් වැය කර කාපට් අතුරා සංවර්ධනය කරන ලද මාර්ග ඉතා ඉක්මණින් විනාශ වන බව ඔබතුමා දන්නේද?*

***පිළිතුර:***

*ඈ. ඔව්.*

*ප්‍රශ්නය :*

*ඈ. හෝමාගම මුල්ලෙගම ඔරුවල මාර්ගය මෙලෙස ගෙන යා නොහැකි උපරිම බර සීමාවට වඩා වැඩි බරකින් යුතු ටිපර් රථ විශාල ලෙස ධාවනය වීම නිසා කාපට් අතුරු මාර්ගය විනාශ වී ගොස් ඇති බව ඔබතුමා දන්නේද?*

***පිළිතුර:***

*ඈ. ඔව්.*

*ප්‍රශ්නය :*

*ඉ. මෙම තත්ත්වය වෙනස් කිරීමට ඔබතුමා ක්‍රියා කරන්නේද? නොඑසේ නම් ඒ මන්ද?*

***පිළිතුර:***

*ඉ. ඊට අවශ්‍ය ක්‍රියා මාර්ගයන් මේ වන විටත් ක්‍රියාත්මක කර ඇත. මුල්ලේගම ඔරුවල මාර්ගය පිළිසකර කිරීමට කටයුතු යොදා ඇත. තව ද මාර්ගයන්හි ධාවනය වන බර වාහන සඳහා උපරිම බර සීමාවන් සඳහන් කරන ලද නාම පුවරු සකස් කර, සවි කිරීමට කටයුතු යොදා ඇත.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දහතුන් වැනි ප්‍රශ්නය. නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික අමාත්‍යතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය යොමු කරනවා.

**13.**

**නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරුතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :** **(ප්‍ර/vi(1)/17/85)**

අ. i. කළුතර දිස්ත්‍රික්කයේ මතුගම අධ්‍යාපන කලාපයේ තිබෙන මුළු පාසල් ප්‍රමාණය කොපමණද?

ii. එය ජාතික පාසල් ලෙස කොපමණද?

iii. පළාත් පාසල් ලෙස කොපමණද?

ආ. i. මතුගම කලාපයේ 2016 අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටි දරුවන් සංඛ්‍යාව කොපමණද?

ii. මෙම විභාගයට පෙනී සිටි ජාතික පාසැල්වල දරුවන් සංඛ්‍යාව කොපමණද?

iii. මෙම විභාගයට පෙනී සිටි පළාත් පාසල්වල දරුවන් සංඛ්‍යාව කොපමණද?

ඇ. i. ඉහත විභාගයට පෙනී සිටි මුළු දරුවන්ගෙන් සමත් හා අසමත් ප්‍රමාණය කොපමණද?

ii. එය ජාතික පාසැල් මට්ටමින් සමත් හා අසමත් ප්‍රමාණය කොපමණද?

iii. සමත් හා අසමත් සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව කොපමණද?

iv. මෙය පළාත් පාසැල් මට්ටමින් සමත් හා අසමත් ප්‍රමාණය කොපමණද?

v. සමත් හා අසමත් සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව කොපමණද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

අ. i. 131 යි.

ii. 02 යි.

iii. 129 යි.

ආ. i. 3125

ii. 661

iii. 2464

[ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා]

ඇ. i. සමත් සංඛ්‍යාව - 2306
අසමත් සංඛ්‍යාව - 819

ii. සමත් සංඛ්‍යාව - 611
අසමත් සංඛ්‍යාව - 50

iii. සමත් ප්‍රතිශතය - 92.44%
අසමත් ප්‍රතිශතය - 7.56% (ජාතික පාසල් මට්ටමින්)

iv. සමත් සංඛ්‍යාව - 1695
අසමත් සංඛ්‍යාව - 769

v. සමත් ප්‍රතිශතය - 68.79%
අසමත් ප්‍රතිශතය - 31.21% (පළාත් පාසල් මට්ටමින්)

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය. දැන් කළුතර දිස්ත්‍රික්කයේ කලාප මට්ටමින් ගත්තොත් එහෙම මෙතුමා දෙන උත්තරයෙන් අපට පෙනෙනවා, සැලකිය යුතු ළමයින් ප්‍රමාණයක් මේ සාමාන්‍ය පෙළ විභාගය අසමත් වෙනවා. දැන් ඔබතුමාගේ පැත්තෙන් මේ අසමත් වන ළමයින් සඳහා ගන්නා ක්‍රියා මාර්ගය කුමක්ද කියලා දැනගන්න කැමැතියි.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මතක් කරන්න ඕනෑ. මේ කාරණාවට මට කෙටි උත්තරයක් නොවෙයි. පේළි හතරක විතර උත්තරයක් දෙනවා. ඒකට මම සමාව ඉල්ලනවා. හැබැයි, මේ කාරණාව ඉතාම හොඳින් තේරුම් ගත්ත ඇමැතිවරයෙක් මම. අවුරුදු විසි ගණනක් තිස්සේ මේ අසමත් ප්‍රතිශතය මේ ළඟ, අයිනේ තිබෙන්නේ. 52% යි, 53% යි උපරිම සමත් වෙන්නේ. මේ සැරේ 52.7% යි බස්නාහිර පළාතේ සමස්ත දරුවන්ගේ සාමාන්‍ය පෙළ සමත්වීමේ ප්‍රතිශතය. අපි පොදුවේ බැලුවොත් 47% ක් අසමත්. ඉතාම හොඳින් නිරීක්ෂණය කළාම වැදගත්ම විෂයයක්, අනිවාර්යය විෂයය වන ගණිතය අසමත් වන නිසාවෙන් තමයි මේ ප්‍රශ්නය තිබෙන්නේ. ඒ නිසාවෙන් ගණිත ප්‍රවර්ධන නවෝදන විශේෂ වැඩ සටහනක් අපි ආරම්භ කළා. කොළඹ, ඒ වාගේම කැලණිය සහ පේරාදෙණිය විශ්ව විද්‍යාලවල සහ ජාතික අධ්‍යාපන ආයතනයේ මහාචාර්ය සහ ආචාර්යතුමන්ලා කැඳවලා දැන් ඒක ආරම්භ කරලා අපි ඒ වැඩ ටික කරගෙන යනවා. අපි පළමුවැනි සාකච්ඡාව පටන් ගත්තේ මොරටුවේ සර්වෝදය මධ්‍යස්ථානයේ. ඒ.ටී.ආරියරත්න මහත්මයාත් මූලාසනයේ තියාගෙන. ඉතින් දැන් ඒ වැඩ ටික කරගෙන යනවා. ගණිතය විෂයය සම්බන්ධව දුර්වලතාවයන් හඳුනාගෙන, දරුවන් හඳුනාගෙන මේ වැඩ ටික කරගෙන යනවා. ඒ නිසාවෙන් මම ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමාත් මේකට උදව් කරන්න. අපි තත්ත්වය තේරුම් ගන්න ඕනෑ. විභාග මූලික කරගත්ත අධ්‍යාපන ක්‍රමයක් තිබෙන රටක අපේ දරුවෝ 100 ක් වාඩි වුණාම ගරු සභාපතිතුමනි, 47 ක් අසමත් වෙලා ගෙදර යනවා. ඒක වළක්වන්න උපරිම විධියට මම මේ දවස්වල වැඩ කරගෙන යනවා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, මෙතුමා මීට පෙරත් දුන්න උත්තරය තමයි, මම පසුගිය කාලයේ ප්‍රශ්න ඇහුවාමත් වැඩ පිළිවෙළක් කරගෙන යනවා කියන එක. අපට ප්‍රායෝගිකව ඒක පෙනෙන්න නැහැ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමා සහභාගි වෙන්න කැමැති නම් මම ඉතාම කාරුණිකව ආරාධනා කරනවා. අපේ වැඩ පිළිවෙළට ඔබතුමා සහභාගි වෙන්න. අපි ඔබතුමාට සම්පූර්ණ සහයෝගය දෙනවා. ඔබතුමාගේ සහයෝගයත් බලාපොරොත්තු වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දාහතර වැනි ප්‍රශ්නයත් නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමාගෙන්මයි. එම ප්‍රශ්නයත් ගරු අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යතුමාට යොමු කිරීමේ අවස්ථාව.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**14.**

**නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරුතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/86)**

අ. i. කළුතර දිස්ත්‍රික්කයේ හොරණ අධ්‍යාපන කලාපයේ තිබෙන මුළු පාසල් ප්‍රමාණය කොපමණද?

ii. එය ජාතික පාසල් ලෙස කොපමණද?

iii. පළාත් පාසල් ලෙස කොපමණද?

ආ. i. හොරණ කලාපයේ 2016 අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටි දරුවන් සංඛ්‍යාව කොපමණද?

ii. මෙම විභාගයට පෙනී සිටි ජාතික පාසැල්වල දරුවන් සංඛ්‍යාව කොපමණද?

iii. මෙම විභාගයට පෙනී සිටි පළාත් පාසල්වල දරුවන් සංඛ්‍යාව කොපමණද?

ඇ. i. ඉහත විභාගයට පෙනී සිටි මුළු දරුවන්ගෙන් සමත් හා අසමත් ප්‍රමාණය කොපමණද?

ii. එය ජාතික පාසැල් මට්ටමින් සමත් හා අසමත් ප්‍රමාණය කොපමණද?

iii. සමත් හා අසමත් සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව කොපමණද?

iv. මෙය පළාත් පාසැල් මට්ටමින් සමත් හා අසමත් ප්‍රමාණය කොපමණද?

v. සමත් හා අසමත් සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව කොපමණද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අ. i. 136 යි.

ii. 05 යි.

iii. 131 යි.

ආ. i. 4270 යි.

ii. 1222 යි.

iii. 3048 යි.

ඇ. i. සමත් සංඛ්‍යාව - 2872
අසමත් සංඛ්‍යාව - 1398

ii. සමත් සංඛ්‍යාව - 1127
අසමත් සංඛ්‍යාව - 95

iii. සමත් ප්‍රතිශතය - 92.22%
අසමත් ප්‍රතිශතය- 07.78 (ජාතික පාසල් මට්ටමින්)

iv. සමත් සංඛ්‍යාව - 1745
අසමත් සංඛ්‍යාව - 1303

v. සමත් ප්‍රතිශතය - 57.25%
අසමත් ප්‍රතිශතය - 42.75% (පළාත් පාසල් මට්ටමින්)

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, කළුතර දිස්ත්‍රික්කයේ හොරණ කලාපය ගත්තාට පස්සේ යම් ප්‍රගතියක් තිබෙන්නේ මතුගම කලාපයේ විතරයි. කළුතර කොට්ඨාශය ගත්තොත් එහෙම අසමත් සංඛ්‍යාව 46.2% යි. ඊට පස්සේ හොරණ කලාපය ගත්තොත් එහෙම අසමත් සංඛ්‍යාව 42.7% යි. ඔබතුමා දෙන උත්තරය තමයි මේ ගණිත විෂයය අසමත් වීම නිසාම තමයි මේ දරුවන් අසමත් වෙන්නේ කියලා. නමුත් ඔබතුමා සොයා බැලීමක් කරන්න. මේ ගණිත විෂයය විතරක් නොවෙයි. අනික් විෂයයනුත් අසමත් වන සංඛ්‍යාවක් ඉන්නවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

කෙටියෙන් ප්‍රශ්නය අහන්න.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ඔබතුමා ඒ සම්බන්ධව ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම ආරාධනා කරනවා. නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමා මේ සම්බන්ධයෙන් උනන්දු වන එකට මම

[ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා]

ඉතාම සතුටු වෙනවා. ඇත්තටම අහපු ප්‍රශ්නයට අමතරව උත්තර දෙන්න අයිතියක් නැහැ, ගරු සභාපතිතුමනි. ගණිතය විෂයය විතරක් නොවෙයි. විශේෂයෙන් භාෂාව සම්බන්ධයෙන් බරපතළ ප්‍රශ්නයක් මේ දරුවන්ගේ තිබෙනවා. භාෂා ප්‍රවීණතා ව්‍යාපෘතියක් අපි දැනට බලගන්වමින් තිබෙනවා. භාෂාව පිළිබඳව දරුවන්ට තිබෙන හැකියා මට්ටම දුර්වලතාවයෙන් නිසා තමයි ප්‍රශ්නයක් ඉදිරිපත් කළාම ප්‍රශ්නය අවබෝධ කර ගැනීමේ දුර්වලතාවයක් තිබෙනවා. පිළිතුරු සංවිධානගත කිරීමේ දුර්වලතාවයන් දරුවන්ගෙන් අපට දකින්නට තිබෙනවා. ප්‍රස්තුථ ඉලක්ක ගත පිළිතුර සැපයීම සම්බන්ධව දරුවන්ගේ දුර්වලතා තිබෙනවා. ඒ නිසා විශේෂයෙන් මම ගරු මන්ත්‍රීතුමාට මම ස්තූතිවන්ත වෙනවා. ගණිතය වාගේම භාෂාව සම්බන්ධවත් විශේෂ ව්‍යාපෘතියක් අපි බලගන්වලා තිබෙනවා. මේක ඇහුවේ නැහැ. ඇහුව හින්දා උත්තර දෙනවා. ඉදිරියේදී එතුමාගේ සහයෝගය බලාපොරොත්තු වෙනවා. එතුමාගේ සහයෝගයත් ඇතිව අපි ඉදිරි වැඩ ටික කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු ඇමැතිතුමනි, දැන් මම ඇහුවාම තමයි ඔබතුමා වෙනත් විෂයයන් පිළිබඳව සැලකිලිමත් භාවයක් දක්වනවා කිව්වේ. ඔබතුමා මේ හැම තිස්සේම දෙන උත්තරය තමයි මේ ගණිතය සම්බන්ධයෙන් විතරක් මතු කරන ප්‍රශ්නය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට කථාවක් කරන්න දෙන්න බැහැ. ඔබතුමා ප්‍රශ්නය අහන්න කෝ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මෙතැන මට උත්තර දෙන එකත් අසාධාරණයි. මගෙන් එහෙම ප්‍රශ්නයක් අහන්නේ නැතිව මට උත්තර දෙන්න බැහැ. අහලා තිබෙන ප්‍රශ්නයට උත්තර දෙනවා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

දැන් මම ඇහුව ප්‍රශ්නය තමයි, ගණිතය විෂයට විතරද ඔබතුමාගේ පැත්තෙන් මැදිහත් වෙන්නේ කියලා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු මන්ත්‍රීතුමා, දැන් ඒකට උත්තරයක් දුන්නා. ගණිතය විතරක් නොවෙයි. දරුවන්ගේ සාමාන්‍ය පෙළ විභාගයට හර විෂයයන් පහක් තිබෙනවා. අපට මේක විග්‍රහ කරන්න දෙන්නේ නැහැ. මේ රීති ප්‍රකාරව විරුද්ධයි මම මේ කථා කරන එකත්. ඒ නිසා හර විෂයයන් පහක් තිබෙනවා. හර විෂයයන් පහම බල ගන්වන්නට ඕනෑ. ගණිතය සහ භාෂාව සම්බන්ධව විශේෂ ව්‍යාපෘති ගොඩ නගන්නට ඕනෑ. එතකොට තමයි දරුවෝ සමත් වෙන්නේ. දුර්වල දරුවන් හඳුනා ගන්න ඕනෑ. විෂයයෙන් විෂයට. ඒකට අපි හයෙන් අරඹමු කියලා වැඩ සටහනක් තිබෙනවා. අටෙන් පටන් ගනිමු කියලා වැඩ සටහනක් තිබෙනවා. ඔබතුමා සහයෝගය දෙන්න. අපි උදව් කරනවා. ස්තූතියි.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, මෙතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දිගින් දිගටම ඔබතුමන්ලා දෙන්නා මෙතැන ලොකු සාකච්ඡාවක් යනවා. මට ඒකට ඉඩ දෙන්න බැහැ.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, මෙතුමා දෙන උත්තරය මම පිළිගන්නේ නැත්තේ, මෙතුමා මුලින්ම කියනවා ගණන් කියලා. ඊට පස්සේ මම ගණන් පිළිබඳව විතරක් ද කියලා ඇහුවාම කියනවා සිංහල කියලා. මෙතුමා මේ සාමාන්‍ය පෙළ සමත් කරනවා නම් - ඔබතුමාට වැඩ පිළිවෙළක් නැහැ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මම මීට පස්සේ උත්තර දෙන්නේ නැහැ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

අහපු නැති ප්‍රශ්නයකට උත්තර දෙන්නේ කොහොමද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතුමාට උත්තර දෙන්න බැහැ. ඔබතුමා අහපු ප්‍රශ්නයට විතරයි මෙතුමාට උත්තර දෙන්න පුළුවන්කම තිබෙන්නේ.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

මම ඇහුවේ, ගණන් විෂයයට විතරද මෙතුමාගේ වැඩ පිළිවෙළ තිබෙන්නේ කියලා. ඊට පස්සේ කියනවා සිංහලවලට. සිංහල නොවෙයි හැම විෂයයටම ඔබතුමා බලන්න මේ -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමා එන්න කෝ අමාත්‍යාංශයට. ගරු සභාපතිතුමනි, අපි මෙතුමාව සාදරයෙන් පිළිගන්නවා. එන්න කෝ? ඇවිල්ලා සහයෝගය දෙන්න කෝ?

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

විෂයයන් අටම ෆේල් දරුවෝ ටිකක් ඉන්නවා මේකේ. ඔබතුමා ඒ ටික සොයලා බලන්න මුලින්ම.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙහෙම කරන්න ඇමතිතුමා. මේ හැම කාරණාවක්ම ඔබතුමාට වැදගත් වෙනවා. අධ්‍යාපනය පිළිබඳව.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ඒ විෂයයන් අටම අසමත් දරුවෝ වෙනුවෙන් කරන වැඩ පිළිවෙළ හදන්න. එක එක විෂයට එකක් කියලා උත්තර දෙන්න එපා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, උත්තර දෙන්න පුළුවන්.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ඔබතුමා, ගණන්ද කියලා ඇහුවාම ගණන් කියනවා. ඊට පස්සේ සිංහල -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, ඊළඟ සභාවට ප්‍රශ්නය ඉදිරිපත් කරන්න කියලා කියන්න. අපි බොහොම අවංකව උත්තර දෙනවා. එතෙක් ඔබතුමා එන්න අපේ අමාත්‍යාංශයට. අපි ඔබතුමාට සහාය පළ කරනවා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ඔබතුමා ඉතින් හැමදාම කියන්නේ එන්න එන්න කියලා. සම්බන්ධ වෙන්න කියලා තමයි ඉතින්.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමා

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

අහන්න එපා. මීට පස්සේ මට රීතියෙන් පිට කථා කරන්න දෙන්න එපා. මාව වාඩි කරවන්න. මේ ප්‍රශ්න අහන හින්දා නේ ප්‍රශ්නය. අහන්න දෙන්නත් බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීතිය කියලා ඇමතිතුමා, මෙතැන සීමාවක් නැහැ. ඔබතුමා විෂය භාර ඇමතිවරයා වශයෙන් උත්තරයක් දෙන්න ඒවාට.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

උත්තර දෙන එක පිළිගන්නේ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උත්තර දෙන එක සිමාවක් නැහැ. ඔබතුමා උත්තරයක් දෙන්න ඒකට.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඉතින් මම උත්තර දීලා ආරාධනාත් කළා, ඉදිරියේදී අහන්නය කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට හොඳයි. මේ ප්‍රශ්න අහන එක හොඳයි. ඔබතුමා අඩුපාඩු සොයා ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට මංජුල ප්‍රසන්න ගරු මන්ත්‍රීතුමාගේ නමින් ඇති අංක 15 යටතේ වන ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ප්‍රශ්නය යොමු කරනවා.

**10.**

**මංජුල ප්‍රසන්න සම්පත් ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/vi(1)/17/87)**

අ. i. බියගම ප්‍රාදේශීය සභාවට අයත් පොදු මහජන ක්‍රීඩංගණ කීයක් තිබේද?

ii. ඒවා මොනවාද?

iii. ඒවායේ හඳුනාගත් අඩුපාඩු තිබේද?

iv. එම අඩුපාඩු සකස් කිරීමට ගන්නා පියවර මොනවාද?

ආ. i. බියගම ප්‍රාදේශීය සභාව සතු පොදු ඉඩම් පෞද්ගලික පරිහරණය සඳහා ලබා දී ඇත්ද?

ii. තිබේ නම් ඒ මොනවාද?

iii. ඒ සඳහා ඔබතුමා ගන්නා ඉදිරි ක්‍රියා මාර්ග මොනවාද?

ඇ. i. බියගම ප්‍රාදේශීය සභා බල ප්‍රෙද්ශය තුළ 2015 වර්ෂය සිට මේ දක්වා ඉඩම් කීයක් වෙන්දේසි කර ඇත්ද?

ii. එම ඉඩම්වල මුළු ප්‍රමාණය කොපමණද?

iii. එම ඉඩම් සියල්ලටම පොදු පහසුකම් ලබා දී අවසන්ද?

iv. මෙම වෙන්දේසි ඉඩම්වල 10% භූමි ප්‍රමාණය පොදු පහසුකම් සඳහා වෙන් කර ඇත්ද?

v. මෙම ඉඩම් වෙන්දේසි තුළින් බියගම ප්‍රාදේශීය සභාවට 2015 සිට මේ දක්වා කොපමණ බදු මුදලක් ලැබී ඇත්ද?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අ. i. පහයි.

ii. දෙල්ගොඩ ක්‍රීඩාංගණය
වක්කඩවෙල මාබිම ක්‍රීඩාංගණය
ජෝන් කීල්ස් ක්‍රීඩාංගණය
ගෝනවල ඔරේන්ජ් බිල්වත්ත ක්‍රීඩාංගණය
පට්ටිවිල ක්‍රීඩාංගණය

iii. ඔව්.

දෙල්ගොඩ ක්‍රීඩාංගණය- සංවර්ධනය කර ඇතත් ප්‍රේක්ෂකාගාරය නවීකරණය කළ යුතුව ඇත.

වක්කඩවෙල මාබිම ක්‍රීඩාංගණය - සංවර්ධනය කර ඇතත් ක්‍රීඩා පිටිය වැට මායිම්, ප්‍රේක්ෂකාගාරය සහ වැසිකිළි පද්ධතිය ඉදි කළ යුතුව ඇත.

ජෝන් කීල්ස් ක්‍රීඩාංගණය - සංවර්ධනය කිරීමට, වැට මායිම සකස් කිරීමට, ප්‍රේක්ෂාකාගාරයක් ඉදි කිරීමට සහ වැසිකිළි පද්ධතිය ඉදි කිරීමට ඇත.

ගෝනවල ඔරේන්ජ් බිල්වත්ත ක්‍රීඩාංගණය - සංවර්ධනය කිරීමට, වැට මායිම සකස් කිරීමට, ප්‍රේක්ෂකාගාරයක් ඉදි කිරීමට සහ වැසිකිළි පද්ධතිය ඉදි කිරීමට ඇත.

පට්ටිවිල ක්‍රීඩාංගණය - සංවර්ධනය කිරීමට, වැට මායිම සකස් කිරීමට, ප්‍රේක්ෂකාගාරයක් ඉදි කිරීමට සහ වැසිකිළි පද්ධතිය ඉදි කිරීමට ඇත.

iv. බියගම ප්‍රාදේශීය සභාවේ අයවැය ලේඛනය යටතේ ප්‍රතිපාදන සකස් කර ගනිමින් ඉදිරියේදී අඩුපාඩු සම්පූර්ණ කරලීම සඳහා උපදෙස් දෙමි.

ආ. i. පොදු ඉඩම් පෞද්ගලික පරිහරණය සඳහා ලබා දීමක් සිදු වී නොමැත. එහෙත් දෙල්ගොඩ මිලිලගහලන්ද කැබැල්ල ඉඩමේ, පොදු පහසුකම් ඉඩම් කොටසේ අනවසරයෙන් පිරිසක් පදිංචි වී ඇත.

ii. දෙල්ගොඩ මිලිලගහලන්ද ඉඩමේ අනවසර පදිංචිය හැර පොදු පහසුකම් සඳහා වූ වෙනත් ඉඩම් පෞද්ගලික පරිහරණය සඳහා ලබා දී නැත.

iii. දෙල්ගොඩ මිලිලගහලන්ද ඉඩමේ අනවසර පදිංචිය ඉවත් කිරීමට බියගම ප්‍රාදේශීය සභාවේ ලේකම් වෙත උපදෙස් දෙමි.

ඇ. i. විසි පහයි.

ii. අක්කර හතළිස් තුනයි පර්චස් තිස් තුනයි.

iii. නැත.

iv වෙන්දේසි ඉඩම්වල ප්‍රමාණයෙන් හෙක්ටයාරයකට වඩා වැඩි ඉඩම් යටතේ 10% ක් වූ භූමි ප්‍රමාණ වශයෙන් පොදු පහසුකම් සඳහා අක්කර දෙකයි රූඩ් එකයි පර්චස් හතරක් වෙන් කර ඇත.

v. රුපියල් 9,868,133.50 යි.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ගරු සභාපතිතුමනි, මට අතුරු ප්‍රශ්න කිහිපයක් අහන්න තිබෙනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා සඳහන් කළා, බියගම ප්‍රදේශයේ පොදු ක්‍රීඩාංගණ පහක් තිබෙනවාය කියලා. ඒකයි මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න හදන්නේ. ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, දෙල්ගොඩ මහජන ක්‍රීඩාංගනය පිළිබඳව. දෙල්ගොඩ මහජන ක්‍රීඩාංගනය තමයි බියගමට තිබෙන ලොකුම ක්‍රීඩාංගනය. මේ ක්‍රීඩාංගනයේ මෑත කාලයේ වැටක් ගැහුවා. ඒක ඉතාමත් වැදගත් කර්තව්‍යයක්. ඒ වැටක් ගැහුවාට ඉස්සෙල්ලා දෙල්ගොඩ නගරයේ සහ ඒ අවට ප්‍රදේශයේ තරුණ තරුණියෝ ඔක්කොම ටික එන්නේ මේ ක්‍රීඩාංගනයට. එතකොට සෙනසුරාදා, ඉරිදා දවස්වල ගරු සභාපතිතුමනි, මේකට ඇවිල්ලා වෙළඳ කලාපයේ පුද්ගලික කර්මාන්ත ශාලාවල වැඩ කරන අය ඇවිල්ලා මැච් ගහනවා. ටූනමන්ට් ගහනවා. ඒකට යම්කිසි මුදලක් අය කරනවා. ඒක සාධාරණයි. මම ඔබතුමා හරහා ඉල්ලීමක් කරනවා. බියගම ආසනයේ පොදු ක්‍රීඩා සමාජ තිබෙනවා. මේගොල්ලෝ සෙනසුරාදා ඉරිදා මේකේ ක්‍රිකට් තරග පවත්වන කොට, එල්ලේ තරඟ පවත්වන කොට මේකට ප්‍රධාන අමාත්‍යතුමනි, රු. 2500 ක මුදලක් අය කරනවා. ඇත්තටම අපි ඔබතුමා හරහා ඉල්ලීමක් කරනවා. මේ තරුණයින්ට රු. 2500 ක් දෙන්න නැහැ. ඒගොල්ලෝ රැකියාවක් කරන්නේත් නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමා මාර්ගයෙන් ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඒ වෙළඳ කලාපයේ කර්මාන්ත ශාලාවලින් මුදල් අය කළාට කමක් නැහැ. නමුත් බියගම ආසනයේ තරුණ තරුණියෝ මේ ක්‍රීඩාංගනයේ ක්‍රීඩා කරන කොට, මුදල් අය කිරීමකින් තොරව මේක නොමිලේ ලබා දෙන්න පුළුවන් නම් ඇත්තටම විශාල වටිනා කර්තව්‍යයක්. ඒ එක්කම හවසට මේකේ ගේට්ටුව වහලා තිබෙන්නේ. ඒ ගේට්ටුවත් ඇරලා දීලා බියගම ආසනයේ ක්‍රීඩා සමාජවලට නොමිලයේ ක්‍රීඩා කිරීමට මේකේ අවස්ථාව ලබා දෙන්න පුළුවන්ද කියලා මම ඔබතුමාගෙන් අහනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒ කාරණය පිළිබඳව විමසීමක් කරලා තමයි උත්තර දෙන්න වෙන්නේ. එතකොට මේ වාගේ ක්‍රීඩාංගන කිහිපයක් තිබෙනවා, අදාළ පළාත් පාලන ආයතනය සතුව. එතකොට මේවාට පළාත් පාලන ආයතනවල යම් පිරිවැයක් දරලා තිබෙනවා. එතකොට එවැනි තත්ත්වයන් තුළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ තිබෙන සමහර ක්‍රීඩාංගන නොමිලයේ දීමට හැකියාවක් නැහැ. මොකද, ඒවායෙන් යම් ආදායමක් පළාත් පාලන ආයතනය උපයා ගත යුතු නිසා. එතකොට දැන් ගම්වල ක්‍රීඩකයන් සම්බන්ධයෙන්, මන්ත්‍රීතුමා කියන තත්ත්වය පිළිබඳව මගේ අවධානය යොමු වුණා. එහෙම ඉඩකඩ දෙන්න පුළුවන් නම් පරීක්ෂා කරලා ඉදිරි කාලයේදී අපි දෙන්න කටයුතු කරනවා. ගරු මන්ත්‍රීතුමාවත් දැනුවත් කරන්නම්.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ඊළඟ ප්‍රශ්නය ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, 'ආ' ප්‍රශ්නයේ දාලා තිබෙනවා, බියගම ප්‍රාදේශීය සභාවේ පුද්ගලික ඉඩම් පොදු ඉඩම් පෞද්ගලික පරිහරණය සම්බන්ධයෙන්. ඒ සම්බන්ධයෙන් ඔබතුමා ඉදිරිපත් කරපු උත්තරේ තිබෙන්නේ එකයි. දෙල්ගොඩ නගරය කියලා. ඒ දෙල්ගොඩ ඉඩම. ඊට අමතරව ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, මේක ඔබතුමා වගකීම දරන්න ඕනෑ නැහැ. මේක ඔබතුමාගේ කාල සීමාව තුළ වුණු එකක් නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ප්‍රශ්නයක් වශයෙන් ඉදිරිපත් කරන්න.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

මම ඉල්ලීමක් කරනවා, බියගම ප්‍රාදේශීය සභාවේ 2015 න් පස්සේ පොදු ඉඩම් පුද්ගලික පරිහරණය සඳහා දීලා තිබෙනවා. මේක එකක් නොවෙයි. අපි දැක්කා, සමහර තැන්වල මේකේ විහාරස්ථාන හැදුවා. අපි ඒකට විරුද්ධ වුණා. නමුත් දැන් මේ විහාරස්ථාන හදලා ඉවරයි. පොදු ඉඩම්වල. ඒ විහාරස්ථාන හැදුවාට පස්සේ ඇත්තටම එතැන ඉන්න ස්වාමීන් වහන්සේලා දැන් දැඩි ලෙස අපහසුතාවයකට පත් වෙලා ඉන්නවා. මේකේ නීත්‍යානුකූල අයිතිය ඒ විහාරස්ථානයට නැහැ. මේක පොදු ඉඩමක්. ඒ නිසා අපි ඔබතුමා හරහා ඉල්ලීමක් කරනවා. බියගම ප්‍රාදේශීය සභාවේ සියඹලාපේ තිබෙනවා, සිතුම් පියස -වෙන්දේසි ඉඩමක්. ඒ වෙන්දේසි ඉඩමේ දැන් විහාරස්ථානයක් ගහලා. සභාව කොහොම හරි අවසර දීලා. මේක නීත්‍යානුකූල තත්ත්වයට පත් කරන්න කියලා අපි ඔබතුමා හරහා ඉල්ලීමක් කරනවා. පුළුවන්ද කියලා අහනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, මෙවැනි ඉඩම් අපේ වෙහෙර විහාරස්ථානවලට, ආගමික කටයුතුවලට පවරාගෙන තිබෙනවා. ඒ වාගේම ක්‍රීඩා සමාජ හා ස්වේච්ඡා සංවිධාන තමන්ගේ ගමේ තිබෙන විවෘත භූමිය විවිධ කටයුතු සඳහා පාවිච්චි කරන බව අපට වාර්තා වෙලා තිබෙනවා. ඒ කෙසේ වෙතත්, ගරු සභාපතිතුමනි, නීත්‍යානුකූලව මට හෝ පළාත් පාලන ආයතනයකට එවැනි තත්ත්වයන් යටතේ ඒ විවෘත අවකාශ නීත්‍යානුකූල තත්ත්වයකින් ප්‍රදේශයේ ජනතාවට මිස වෙනත් බාහිර පාර්ශවයකට පවරා දිය නොහැකි යැයි කියන එක තමයි මම විශ්වාස කරන්නේ.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ගරු සභාපතිතුමනි, මගේ තුන් වන අතුරු ප්‍රශ්නය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කෙටියෙන් අහන්න.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

හරි. තුන් වන ප්‍රශ්නය. වෙන්දේසි ඉඩම් වෙන්දේසි කරන කොට මම හිතන්නේ, වෙන් කරනවා පොදු පහසුකම්. ඒ පොදු පහසුකම් කෑල්ල ගන්න කොට ගරු ප්‍රධාන අමාත්‍යතුමනි - ඊයේ අපේ සම්බන්ධීකරණ කමිටුව තිබුණා. ඒකේ තීන්දුවක් කථා කරන්නේ. ඒකේදී කාර්මික නිලධාරී මේකේ නෝට් එකක් ගහලා තිබෙනවා, මේකේ හොඳම කෑල්ල ගන්නය කියලා. එතකොට බියගම ප්‍රාදේශීය සභාවෙන් පසුගිය කාලයේ වෙන්දේසි කරපු එකේ නරකම කෑල්ල අරගෙන තිබෙන්නේ. ඒ කියන්නේ ඒක පාවිච්චි කරන්නම බැහැ. ඒ සඳහා ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ග.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒක වැරදියි. හුඟක් ව්‍යාපාරිකයෝ, ඉඩම් වෙන්දේසි කරන ආයතන බොහොම උනන්දු වෙනවා එවැනි ඉඩම් කොටස පළාත් පාලන ආයතනයට පවරා දෙන්න. හැබැයි, එහෙම එකක් ගන්න එකේ වගකීම තිබෙන්නේ - ඉඩම ස්වභාවිකව පහතක පිහිටා තිබෙන්න පුළුවන්. නමුත් ඒක සංවර්ධනය කරලා භාර ගැනීමේ වගකීම තිබෙන්නේ, පළාත් පාලන ආයතනයේ බලධාරීන්ට. එහෙම එකක් සිද්ධ වෙලා තිබෙනවා නම් අපට සිද්ධ වෙනවා, ඒ නිලධාරීන්ට නීත්‍යානුකූල කටයුතු කරන්න. මෙතැන මම හිතන්නේ, අපේ නීති නිලධාරීතුමාත් ඉන්නවා. පළාත් පාලන

කොමසාරිස්තුමියත් ඉන්නවා. ඔබතුමා මගින් මම ඉල්ලා සිටිනවා. එවැනි තත්ත්වයන්ට වහාම සොයලා බලලා නීත්‍යානුකූල කටයුතු කරන්නය කියලා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරනවා. අපේ උගත් බුද්ධිමත් අධ්‍යාපන ඇමතිතුමා කිව්වා, මට මේ මෝඩ ප්‍රශ්න ඉදිරිපත් කරනවාය කියලා. අපි කැමැතියි. මේ දරුවන් වෙනුවෙන් තමයි, මේ උගත් එතුමාගේ තත්ත්වයට ගේන්න තමයි මේ ප්‍රශ්න ඉදිරිපත් කරන්නේ. මම ඔබතුමා මගින් ඉල්ලා සිටිනවා, එතුමාගෙන් මේ මෝඩ ප්‍රශ්න ඉදිරිපත් කරනවාය කියන එක ඉල්ලා අස් කර ගන්න කියලා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මම ඒක ඉල්ලා අස් කර ගන්නවා සන්තෝෂයෙන්. මම ආරාධනා කරනවා, අමාත්‍යාංශයට එන්නය කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අන්න එතුමා ආරාධනා කරනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා මාසයකට සැරයක් උපදේශක කාරක සභාව තියනවා නේ? වෙලාවට තියනවා. ගරු ඇමතිතුමා, ඔබතුමාත් හැබැයි මාසයකට සැරයක් උපදේශක කාරක සභාව තියන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම තියලා තිබෙන්නේ හැමදාම.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. හැමදාම නම් තියලා නැහැ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

දිනය පහු වෙනවා. සමහර දවස්වලට පහු වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. මේ අවුරුද්දට එහෙම තියලා නැහැ. තවම හතරයි තියලා තිබෙන්නේ. මටත් වාර්තා වෙනවා. තියලා ආරාධනා කරන්න. අපේ ගරු ගාමිණී ඇමතිතුමායි, මහ ඇමතිතුමායි වාගේ හැමදාම මාසයකට පාරක් තියන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා, කාර්ය පටිපාටි රීති 36(2), (3) සහ (4) වෙත. ඔබතුමාට කියන්නට ඕනෑ. ජූනි මාසේ 18 වැනිදා පළාත් සභා රැස්වීමේදී මම විශේෂ ප්‍රකාශයක් කළා, පාදුක්ක සිරි පියරතන විද්‍යාලයේ ගොඩනැගිලිවල අබලන් තත්ත්වය පිළිබඳව. මේ කථාව හැන්සාඩ් වාර්තාවේ සටහන් වෙලා තිබෙනවා. ඊට පස්සේ ගරු සභාපතිතුමනි, අගෝස්තු මාසේ 14 වැනිදා ලංකාදීප පුවත්පතේ මේක වාර්තා කරලා තිබෙනවා, ශ්‍රී ජයවර්ධනපුර මුදිතා දයානන්ද කියලා වාර්තාකාරිනියක්. මම ස්තුතිවන්ත වෙනවා ඇත්තටම මේ ජනමාධ්‍යවේදීන්ට අපි කරන කථා ජනමාධ්‍ය හරහා සමාජයට ගෙනිහිල්ලා, අපටත් මේ ප්‍රශ්න විසඳලා දෙන්නත් අවස්ථාවක් ලැබීම පිළිබඳව. හැබැයි, මේකේ ප්‍රශ්නයක් තිබෙනවා ගරු සභාපතිතුමනි. මම ඉතා පැහැදිලිව කිව්වේ, මේ විද්‍යාලයේ ගොඩනැගිලි අබලන් වෙලා තිබෙද්දී, පළාත් සභා මුදල් වෙන් කරලා තිබෙද්දී, ඒ මුදල් ක්‍රියාත්මක වෙන්නේ හෝමාගම අධ්‍යාපන කාර්යාලයේ වරදක් නිසා නොවෙයි. කලාප ඉංජිනේරු කාර්යාලයේ වරදක් නිසා කියලා. එහෙමයි මම කිව්වේ. ඒක හැන්සාඩ් වාර්තාවේ ඉතාමත් පැහැදිලිව සටහන් වෙලා තිබෙනවා. හැබැයි, පත්තරේ දාලා තිබෙන්නේ හෝමාගම අධ්‍යාපන කලාපය මේ පිළිබඳව කටයුතු කළේ නැහැයි කියලා. මේකෙන් කලාප කාර්යාලය අසීරුතාවයකට පත් වෙලා ඉන්නවා. අපි කලාප කාර්යාලය විවේචනය කළාය

[ගරු මහේෂ් අල්මේදා]

කියලා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම ඉල්ලා සිටිනවා. මේ හැන්සාඩ් වාර්තාව අරගෙන, මේ වාර්තාව දැම්මා වාගේම, අපි මේ වාර්තාව ඉදිරිපත් කිරීම ගැන පුවත්පත් වාර්තාකරුවන්ට ස්තුතිවන්ත වෙනවා. මේක නිවැරදි කරලා දෙන්නය කියලා ඉල්ලා සිටිනවා. පළාත් ඉංජිනේරු කාර්යාලය කරපු වරදක් නිසා තමයි මුදල් වෙන් කරලත් මේ පාසලේ ගොඩනැගිලි - පළාත් අධ්‍යාපන කාර්යාලයේ නොවෙයි. හෝමාගම අධ්‍යාපන කාර්යාලයේ ඉංජිනේරු කාර්යාලය කරපු වරදක් නිසා තමයි දරුවන්ට මේ ප්‍රශ්නය මතු වුණේ. ඒ නිසා ඒක නිවැරදි කරලා දෙන්නය කියන ඉල්ලීම කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මේ අවස්ථාවේදී මාධ්‍ය මිතුරන් ගොඩක් ඉන්නවා. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කියන කාරණය සම්බන්ධයෙන් එතුමාට නිවැරදි කිරීමක් කරලා දෙන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්යනයක් මතු කරන්න තිබෙනවා. ඉතාම කෙටි කාලයක් ලබා දෙන්න. ගරු සභාපතිතුමනි, පසුගිය සෙනසුරාදා මම ගියා කඩුවෙල බුද්ධදාස ක්‍රීඩාංගනයට. එතැන යම් ප්‍රශ්නයක් මතු වෙලා තිබුණා. බත්තරමුල්ල ක්‍රීඩා සමාජයේ ගමේ ක්‍රීඩකයින්ට බුද්ධදාස මහත්තයා ඒ ක්‍රීඩාංගනය හදපු වෙලාවේ නොමිලේ ක්‍රීඩා කරන්න ඉඩ දීලා තිබුණා. නමුත් දැන් නාගරික කොමසාරිස්තුමිය කියලා තිබෙනවා, පැයකට රුපියල් හාර දහස ගණනේ ගෙවන්න. නැත්නම් සෙල්ලම් කරන්න දෙන්නේ නැහැයි කියලා. මේ ප්‍රශ්නය පිළිබඳව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඒක ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

නැහැ. ඉන්න කෝ ඔබතුමා කියන්න දෙන්නේ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතැනට අදාළ නැහැ. ඔබතුමා උපදේශක කාරක සභාවට එන්න. ඕවා කථා කරන්න බැහැ මෙතැන.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒක නොවෙයි කියන්න හදන්නේ. මන්ත්‍රීවරයෙක් එතැන ඉන්දැද්දී පොලීසියෙන් ගෙන්නුවාම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. ඔබතුමාට වුණු දෙයක් නම් මට කියන්න. ඔබතුමා වරප්‍රසාද ප්‍රශ්න කියලා වෙන කාරණා කියන්න යන්න ලැහැස්ති වෙන්න එපා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එහෙම නම් මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයත් කියන්න තිබුණා උපදේශක කාරක සභාවේ. ඔබතුමා කියන්න දෙන්නේ නැහැ නේ? මට මන්ත්‍රීවරයෙක් හැටියට ඔබතුමාත් වරප්‍රසාද කඩ කරනවා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කෙටියෙන් කියන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

කෙටියෙන් තමයි කියන්න හැදුවේ. මේ කාරණය කෙටියෙන්ම කියන්න තමයි හැදුවේ. ගරු සභාපතිතුමනි, ඊට පස්සේ මෙතැන ක්‍රීඩා කරන්න දෙන්නය කියලා මහ ඇමතිතුමා ඉල්ලීමක් කළා. ඊට පස්සේ නාගරික කොමසාරිස්වරිය ඒකට එකඟ වුණා. ඊට පස්සේ ක්‍රීඩකයෝ සෙනසුරාදා හවස මෙතැනට ගියා. ගියාම මම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, 36(1) කියන්නේ, ඔබතුමාගේ වරප්‍රසාද කඩ වීමක් තිබෙන්නේ. ඔබතුමාට මෙතැන මොකුත් වෙලා නැහැ නේ? ක්‍රීඩකයින්ගේ ප්‍රශ්න -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මම මන්ත්‍රීවරයෙක් හැටියට මට ඔබතුමාත් වරප්‍රසාද කඩ කරනවා නේ? කියන්න දෙන්නේ නැහැ නේ? ඊට පස්සේ මෙතැනට ගිහිල්ලා ඉන්න කොට මෙතැන ක්‍රීඩා කරන්න දෙනවා කියලා නාගරික කොමසාරිස්තුමිය එකඟ වුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට කරදරයක් කළාද ඒගොල්ලෝ. නැහැ නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම එතැනට ගිය නිසා කියන්නේ. මට වෙච්ච දේ. ඔබතුමා කථා කරන්න දෙන්නේ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කථා කරන්න දෙන්නේ නැත්තේ, ඔබතුමා මේ වරප්‍රසාද නොවෙයිනේ කියන්නේ. හැල්ලක් නේ කියන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේ වරප්‍රසාද ප්‍රශ්නයට එන්න අහසින් පහත් වෙන්න බැහැ, ගරු සභාපතිතුමා. ගරු මහ ඇමතිතුමා කියන්න කෝ. මේක නොකියා වෙන කියන්න බැහැ මේක.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

එතුමා ගියා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආ ගියාද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

කියන්න දෙන්න කෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි ඉතින් එතුමා පිළිගන්නවා, ගියා කියලා ඉවර වෙලා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මම එතැනට ගියා මේ වැඩේ කෙරෙනවාද? ඉඩ දෙනවාද බලන්න. එතකොට මට නාගරික කොමසාරිස්තුමිය එස්.එම්.එස්. පණිවුඩයක් එව්වා මෙන්න මෙහෙම. I am at discussion with Hon. Minister P.C. Ranawaka can’t talk now, tell them to go the ground and meet caretaker. මේකෙන් අනියමාර්ථයෙන් ඇඟවෙනවා, ඕගොල්ලෝ යන්න. ඒගොල්ලන්ට සෙල්ලම් කරන්න දෙයි කියලා. මමත් එතැනට ගියා. මොකද, මට ජෙන තෙක් මානයේ තිබෙන ක්‍රීඩාංගනය මේක. හැබැයි, මම එතැනට ගියාම නාගරික කොමසාරිස්තුමිය මම ඉන්න බව - මම එතුමියට SMS පණිවුඩයක් යැව්වා, මමත් මෙතැනට ඇවිල්ලා ඉන්නවාය කියලා. මම ඉන්න බව දැන ගෙන මේක බලාගන්න කෙනාට, අර මිනිස්සුන්ට ක්‍රීඩා කරන්නත් ඉඩ දුන්නාට පස්සේ පොලීසියට පැමිණිලි කරනවා, අපි අයුතු ලෙස ඇතුළත් වුණාය කියලා. අයුතු ලෙස ඇතුළත් වීම මත නාගරික කොමසාරිස්තුමිය පොලීසියට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, සමාවෙන්න. මොනවාද මේ කියන්නේ ඔබතුමා?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මන්ත්‍රීවරයෙක් හැටියට එතැනට ආවාම, මට විරුද්ධව පැමිණිල්ලක් දැම්මාම, මේක නීත්‍යානුකූලව ගියාම එතැන මගේ වරප්‍රසාද කඩ වෙලා නැද්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ ටික මුලින්ම කියන්න එපැයි. ඔබතුමා මේ වටෙන්නේ ආවේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඉතින් ඒ ටික කියන්නේ නැතිව වෙන කොහොමද කියන්නේ මේක?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නම් ඔබතුමා -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම දැනගෙන හිටියේ නැහැ නේ ඔබතුමා කලින් දැන ගෙන හිටියා කියලා. මම හිතන්නේ, ඔබතුමා සිද්ධිය දැන ගෙන ඉඳලා තිබෙනවා. ඒකනේ ඔබතුමා කියන්නේ. අනික් අය දන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වරප්‍රසාද ප්‍රශ්න කියලා ගරු මන්ත්‍රීතුමා මෙපමණ කාලයක් දෙන්න බැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ඔබතුමා කලිනුත් පරීක්ෂණ කරනවා කියලා, පරීක්ෂණ කළේ නැහැ. මගේ ළඟ ෆයිල් එක තිබෙනවා. කරුණාකරලා මේ ගැන පරීක්ෂණයක් කරන්න. එපමණයි මගේ ඉල්ලීම.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කරන ලද ප්‍රකාශය පිළිබඳව - අපේ කොමසාරිස්තුමිය සභාවේ ඉන්නවා. ඒ ගැන පොඩි පරීක්ෂණයක් කරලා අපට වාර්තාවක් ලබා දෙන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. 36(1) යටතේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාත් දිගට නොකියා කෙටියෙන්ම කියන්න කෝ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

වටේ යන්න එපා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

පළාත් සභා රැස්වීමකදී පරිපූරක ඇස්තමේන්තුවක් අනුමත කළා. ඔබතුමා දන්නවා නේ? පරිපූරක ඇස්තමේන්තුවක් අනුමත කළා. විපක්ෂ නායක, ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායක, සභානායක, විපක්ෂයේ සංවිධායකවරයාටත් ඒ පරිපූරක ඇස්තමේන්තුවේදී වාහන ගැනීම සඳහා අනුමත වුණා. අපට අසාධාරණයක් වුණා. අපි හතර දෙනෙකුට. ධුරධාරීන් හතර දෙනෙකුට අසාධාරණයක් වුණා. ලබන මාසේ තවත් පරිපූරකයක් දානවා කියලා ආරංචියක් තිබෙනවා. මම දන්නේ නැහැ ඇත්ත නැත්ත. කොයි විධියකින් හරි අපට එදා වුණු අසාධාරණය නැවත සාධාරණයක් බවට පත් කරන්න -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

පුළුවන් තරම් වාහන ගෙන්වන්න. සහනාධාර කප කපා වාහන ගෙන්වන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක මෙහෙමයි විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු ප්‍රධාන අමාත්‍යතුමා මාර්ගයෙන් තමයි මම ඉල්ලීමක් කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ ප්‍රශ්නය සම්බන්ධව අපි -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. පසුගිය සභා වාරවලදී ෆොටෝ කොපි මැෂින් එකක් අපට දෙනවාය කියලා එළියේ ෆෝම් එකක් පුරවලා, අපේ පඩියෙන් අය කර ගන්නවාය කියලා සමූපකාර ග්‍රාමීය බැංකුවෙන් ණයක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා තවම ෆොටෝ කොපි මැෂින් එක ගත්තේ නැහැ නේ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒක තමයි. අපේ වරප්‍රසාදයක් නේ? අපේ පඩියෙන් අය කරන්න දෙන එක අපේ වරප්‍රසාදයක් නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කවුද අත්සන් ගත්තේ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ෆොටෝ කොපි මැෂින් එකක් නැතිව අපි වැඩ කරන්නේ කොහොමද? අපට ෆොටෝ කොපි මැෂින් එකක් දුන්නේ නැති එක අපේ වරප්‍රසාදයක්. ගරු සභාපතිතුමනි, මාර කථාවක් නේ? අපේ ගෙදර අපට ෆොටෝ කොපියක් ගහ ගන්න මැෂිමක් නැතිව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි දන්නේ නැහැ. ඒ කාරණාව පෞද්ගලික -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මේ මන්ත්‍රීවරුන්ට තිබෙන වරප්‍රසාද ගැන. මේ මන්ත්‍රීවරුන් 104 ටම. මට විතරක් නොවෙයි නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කවුද අත්සන් ගත්තේ ඔබතුමාගෙන්? ගරු මන්ත්‍රීතුමා, මට ඉස්සෙල්ලා කියන්න ඔබතුමාගෙන් අත්සන් ගත්තේ කවුද කියලා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පඩියෙන් කපා ගෙන නැහැ නේ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

කොපමණ කාලයක් ගියාද? (බාධා කිරීම්) මහ ඇමතිතුමා කථා කරලා මේ ප්‍රශ්නය විසඳලා දීලා, සමූපකාර ඇමතිතුමාට මේක භාර දුන්නා. ඉතින් අද වන තුරු මේක ක්‍රියාත්මක වුණේ නැහැ නේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පඩියෙන් කපා ගෙන නැත්නම් ඒක අදාළ නැහැ. කපාගෙන නැහැ. ඒ ව්‍යාපෘතිය හදපු එක්කෙනෙකුගෙන් අහන්න ඕනෑ. ඔබතුමන්ලා නේ හැදුවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, ඉස්සෙල්ලාම මේ 104 දෙනාගේ වරප්‍රසාද කියන්නේ මොනවාද කියලා, ඉස්සෙල්ලා ඔබතුමා කියන කොට අහගෙන ඉන්න. ඔබතුමා කෑ ගහන්න එපා. ඔබතුමාට කේන්ති යනවා නම්, අපේ පොලේ තිබෙනවා කොහිල. කොහිල අල ටිකක් ගෙනියලා ගෙදර නෝනාට කියලා හදලා කාලා කේන්ති යන එක අඩු කර ගන්න. කොහිල අල තමයි මේකට බේත. කේන්ති යනවාට. අපේ පොළට යන්න. දෙල්කඳ පොලෙන් අර කිරි අල ගන්නවා වාගේ කොහිල අල ටිකක් ගෙනියලා නෝනාට කියලා හදාගෙන කන්න. (බාධා කිරීම්) අපි ඉල්ලන්නේ අපට තිබෙන අයිතිය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර වාඩි වෙන්න. කරුණාකර බාධා කිරීම් කරන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ප්‍රකාශයක් දෙන්න සභාවේ. ඔබතුමාට අයිති දෙයක් මේක. කවදාටද මේ මැෂිම හම්බ වෙන්නේ අපට. කවදාටද අපට මේක හම්බ වෙන්නේ කියලා ඔබතුමා අද ප්‍රකාශයක් කරන්න. (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා කියපු කාරණාව සම්බන්ධයෙන් අපේ පළාත් සභාවේ සමූපකාර ඇමතිතුමාට යොමු කළා. ගරු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් ෆොටෝ කොපි මැෂින් එකක් සමූපකාරය හරහා ලබා දෙන්නය කියලා ඉල්ලීමක් කළා. සහනදායී පදනමක් මත. ඒ අනුව සභා ලේකම්තුමාට ලිපියක් එවලා තිබුණා, සමූපකාර CRB බැංකු සංගමයෙන්. එම ණයා පිටපත් යන්ත්‍ර ලබා දීමට නම් කරුණු කිහිපයක්ම - මගේ ළඟ දැන් ඒ ලිපිය නැහැ. කරුණු කිහිපයක් යටතේ අපි ඒවාට එකඟ වෙන්නට ඕනෑ. මට මතක හැටියට එක කාරණාවක් තමයි, අපි ඒ බැංකුවේ සාමාජිකයෙකු වෙන්න ඕනෑ. රුපියල් පන්සියයක් තැන්පත් කරලා. ඊළඟට මේකට ඇපකරුවන් දෙන්නෙක් අවශ්‍යයි. ඊළඟට පොලියක් ගන්නවා. ඒ නිසා මේ තත්ත්වය තුළ ගරු මන්ත්‍රීතුමන්ලා එකඟ වෙන එකක් නැහැ. මම දන්නේ නැහැ. එකඟ වෙනවා නම් මට ප්රශ්නයක් නැහැ. ඊළඟට අපේ සභා ලේකම් කාර්යාලයත් සමඟ ගිවිසුමකට යන්න ඕනෑ. අදාළ බැංකුවත් එක්ක. ඒ වාගේ කරන්න බැරි යෝජනා කිහිපයක් දාලා තිබුණා. දැන් මේ කියන ක්‍රමයට යන්ත්‍ර ලබා දෙන්න අපහසුයි. කිසිම ආයතනයක් ඒක ලබා දෙන්න කැමැති නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මේක ඇතුළේ අපේ තිබෙනවා, විවිධ කමිටු. රීති කාරක සභාව, ගෘහ කාරක සභාව වාගේ. එතකොට මේක අනුමත කරපු කොමිටියක් තිබුණා නේ? ගේන්න බැරි නම් ඇයි අනුමත කළේ මේක?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනුමත කළේ නැහැ. අනුමත කිරීමක් කළේ නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අපේ කමිටුවේ අනුමත කරලා තමයි, මේක ඇවිල්ලා තිබුණේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මේ සම්බන්ධව අනුමත කිරීමක් කළේ නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒ යෝජනාවක් තිබුණා. අපි අනුමත කළේ නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

නැහැ. අපේ කමිටුවේ අනුමත කරලා තමයි මේක ඇවිල්ලා තිබුණේ. ආණ්ඩුකාරතුමා ළඟටත් ගිහිල්ලා මේක අනුමත කරලා තිබුණා.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු සභාපතිතුමනි, මේ නිසා දිගින් දිගටම සභාවේ කාලය නාස්ති වෙනවා. ඒ නිසා හෙට සභා කටයුතු කාරක සභාවට මේ ප්‍රශ්නය දාලා අපි කථා කරමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ ඇමතිතුමා මොකක් හරි වගකීමක් ගනියි නේ ඒ ගැන. සභා කටයුතු ඇමතිතුමා.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
PERSONAL EXPLANATIONS

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, මහජන නියෝජිත සභාවක රීති සකස් කර ගන්නේ වැඩ කටයුතු විධිමත් කර ගැනීමට විනා එකී රීති දඬමීමා කර ගනිමින් කාලීන වැදගත් සාකච්ඡා මග හැර යාමට නොවේ. පසුගිය සභා වාරයේදී කාර්ය පටිපාටි රීති 107 යටතේ මා විසින් ගෙන ආ යෝජනාව කාලීන වශයෙන් සාකච්ඡා කළ යුතු, රටටත් ජනතාවටත් බලපාන්නාවූ පොදු වැදගත්කමකින් යුතු වූ මාතෘකාවක් විය. විරෝධතා, උද්ඝෝෂණවලට පදනම් වී ඇත්තේ කුමක්ද? එකී විරෝධතා මර්දනය සඳහා භාවිතා කරන මර්දන මෙවලම් අතර නිල රාජකාරී අභිබවා කටයුතු කරන නිලධාරීන්ගේ හැසිරීම්, පොලු මුගුරු අතින් ගත් මැරයින්ගේ ආගමනය, රටේ ප්‍රජාතන්ත්‍රවාදයට නැවත ඇති කරන බලපෑම කෙබඳුද යන ප්‍රස්තුතයන් සාකච්ඡා කිරීම බස්නාහිර පළාත් සභාව නොකළ යුත්තක් ලෙස තීරණය වීම ඉතාමත් කනගාටුවට කරුණකි.

ගරු සභාපතිතුමනි, අපි කවුරුත් කවදා හෝ මැරෙන මිනිසුන් බව කාටවත් අමුතුවෙන් පැහැදිලි කිරීමක් අවශ්‍ය නැත. ඒ බව හොඳින් දන්නා මිනිසුන් අතර, තවමත් මළ ගෙදරකට ගොස් මිය ගිය දේහයට ගෞරව කිරීමට බිය මිනිසුන් මට හමු වී ඇත. මිනී පෙට්ටියක් දෙස නොබලන මිනිසුන් අප සමාජයේ ඇත. පයින් ගමන් කරන පාරේ මිනී කනත්තක් වේ නම් ඒ පාරෙන් නොගොස් වෙනත් පාරක් සොයා ගන්නා මිනිස්සු තවමත් අප සමාජයේ සිටී.

ගරු සභාපතිතුමනි, අවනීතිය වෙනුවට ප්‍රජාතන්ත්‍රවාදය අප සමාජයට අවශ්‍ය බව කවුරුත් දනී. ප්‍රජාතන්ත්‍රවාදයට පිටින් ක්‍රියාත්මක වන මර්දනය, රාජ්‍ය ත්‍රස්තවාදය දෙකේ දෙකේ පොලු අතින් ගත් කුඩු ගහපු මැරයින් අතට ප්‍රශ්න විසඳීමේ බලය දුන් පාලනයන් හරහා සමාජයකට ගෙවන්න සිදු වන වන්දිය කොතෙක්ද යන්න පාඩම් ඉගෙන ගත් රටක අප ජීවත් වේ. එවන් තැනකට තල්ලු වීමේ පෙර නිමිති දකින මුල්ම පැයේ එය සාකච්ඡා කිරීම මෙම සභාව නොකළ යුතු දෙයක්ද? එවන් සාකච්ඡාවක් මග හැර යාම කනත්ත පාර මග හැර යාමට සමානය. මූලික මිනිස් අයිතීන් සමඟ ගැට ගැසී ඇති විරෝධතා උද්ඝෝෂණ පිළිබඳව වෙනත් මතයන් ඕනෑම කෙනෙකුට තිබිය හැක. ඒ පිළිබඳව යෝජනාවක් ලෙස සභාවට ඉදිරිපත් වීමෙන් විශේෂයෙන්ම රීති අත්හිටුවා එන යෝජනාවක් නිසාම ඕනෑම මන්ත්‍රීවරයෙකුට තම අදහස් ඉදිරිපත් කිරීමට වඩාත් හොඳ ඉඩකඩක් විවෘත වේ. එහෙයින් යෝජනාව සාකච්ඡා කිරීමෙන් අනතුරුව එකී යෝජනාවේ හරයට තමන් අකමැති නම් බෙදීමක් ඉල්ලා විරුද්ධ වීමේ අවස්ථාව ද ඇත. එම අවස්ථාව වඩා ප්‍රජාතන්ත්‍රවාදී යැයි අප විශ්වාස කරමු. එම අවස්ථාව උපයෝගී කර නොගන්නේ නම් අප සිතන්නේ බස්නාහිර පළාත් සභාව තවමත් එවන් දියුණු තත්ත්වයකට පැමිණ නැති බවයි.

ගරු සභාපතිතුමනි, පළමු වරට අප පක්ෂය පළාත් පාලන ආයතන නියෝජනය කිරීම ආරම්භ වන්නේ 1997 වසරේදීය. රට පුරා මන්ත්‍රීවරු 101 ක් තේරී පත් විය. බොහෝ සභාවන්වල අපට සිටියේ එක් මන්ත්‍රීවරයෙකි. මම ද ඉන් කෙනෙකි. පළාත් පාලන ආයතනයක සභාපතිවරයාට පුදුමාකාර බලයක් ඇත. සමහර සභාපතිවරුන් අප මන්ත්‍රීවරයාගේ යෝජනාවක් කිසිදා න්‍යාය පත්‍රයට ඇතුළත් කළේ නැත. සමහර විට න්‍යාය පත්‍රයට ඇතුළත් කළ ද යෝජනාව ස්ථිර කිරීමට කෙනෙකු සිටියේ නැත. එහෙයින් ප්‍රජාතන්ත්‍රවාදයේ තරම ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළත් එකී රාමුවෙන් පිටතදීත් අත්විඳ හොඳ අත්දැකීම් අප සතුව ඇත. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම අද දින උදෑසන නිවේදනය කළ පරිදි මේ අවස්ථාවේදී සභා කටයුතු කාරක සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලාට සහ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු ගරු අමාත්‍යවරුන්ට ආරාධනා කරනවා, මගේ නිල කාමරයට ගරු ආණ්ඩුකාරතුමා විසින් ඉදිරිපත් කරන ලද 154 (උ) (2) අනු ව්‍යවස්ථාව අනුව මෙම පළාත් සභාවේ අදහස් ප්‍රකාශ කරනු පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳව ඔබේ අදහස් හා ඔබේ යෝජනා ලබා ගැනීමට. මම ඒ සඳහා ආරාධනා කරනවා. ඒත් එක්කම ගරු මන්ත්‍රීතුමන්ලා සභාවේ ගණ පූරණය පවත්වාගෙන යෑමට උදව් කරන්න.

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පක්ෂ විපක්ෂ භේද නොසලකා අවංක දේශපාලඥයින් සුරැකීම සම්බන්ධව අදහස් ප්‍රකාශ කිරීමට රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියට අවස්ථාව ලබා දෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බොහොම ස්තුතියි. ඇත්ත වශයෙන්ම අපි දේශපාලඥයින්ගේ වැරදි තමයි වැඩියෙන්ම දැන් ප්‍රකාශ වන්නේ. ජනමාධ්‍ය මගින් සහ පොදු රැස්වීම්වලදී කවුරු හරි කථා කළොත් කථා කරන්නේ, මේ දේශපාලඥයින්ගේ වැරදි. සමහර විට ඡන්ද කාලවලදී මඩ ගසා ගැනීමේ අරමුණිනුත් වැරදි කථා කරනවා. නමුත් මම විශේෂයෙන්ම කියන්නට ඕනෑ. මේ පසුගිය කාල

[ගරු රෝස් ප්‍රනාන්දු]

වකවානුව තුළ අපට හමු වුණා. සැබවින්ම ජනතා හිතවාදී, වැදගත් දේශපාලනයක් කරන මහත්ම මහත්මීන් මේ පළාත් සභාව තුළත්, පාර්ලිමේන්තුව තුළත් විශාල පිරිසක් ඉන්නවා. ඒ අය ගැන ඇගයීමක් වෙන්නේ නැහැ. මේ ජනමතය තුළ විකෘති හැඟීම් ඇති කරලා තිබෙන්නේ. මම දන්නවා, මේ පළාත් සභාවේ සියලු දෙනාත් කුතුහලයෙන් ඇති මේ කවුරු ගැන ද කථා කරන්නේ කියලා. මෙහිදී එක පුද්ගලයෙකු අරමුණු කර ගෙන නොවෙයි මම කථා කරන්නේ. අපි ඇගයීමට ලක් කරන්නේ නැති වැදගත් මන්ත්‍රීවරු ඉන්නවා. හැමදාම මේ සභාවේ කථා නොකෙරුවාට ඒ කාර්යභාරය හරියට කරනවා. අපි විශේෂ කොට එවැනි අවංක දේශපාලන නායකයින්ට අවස්ථාවක් දෙන්නට ඕනෑ. ඇගයීමක් කරන්න ඕනෑ. ඒ කර්තව්‍යය සාර්ථකව ඉස්සරහාට කර ගෙන යන්න. දැන් එහෙම නැතිව මේ වැදගත් යැයි සලකන දේශපාලනයේ තිබෙන තත්ත්වයන් එක්ක කලකිරිලා පැත්තකට වුණොත් ඒ අයගෙන් සමාජයට, රටට ගන්න පුළුවන් සේවාවන් ගැනීමේ හැකියාව නැති වෙනවා.

ඒ වාගේම අද අපි දන්නවා. යහපාලන ආණ්ඩුව පිහිටුවලා වසර දෙකක් සම්පූර්ණ වෙලා තිබෙන කොට, පැරදුණු මන්ත්‍රීවරු පවා එක එක පක්ෂවල උවමනාව මත මේ ආණ්ඩුවට සම්බන්ධ වෙලා තිබෙනවා. ජනමතයක් නැති අය. මෙහිදී මා විශේෂයෙන් සඳහන් කරනවා, අපි කුමන පරමාර්ථ මත දේශපාලන පක්ෂ අරගෙන ගියත්, මේ සම්බන්ධ වන අය කරන වැරදි - සමහර විට ඒ අය තමන්ගේ දේශපාලන ප්‍රතිරූප හදා ගන්න කරන ප්‍රකාශ හරහා අර වැදගත් දේශපාලන නායකයින්ට ඒ තැන අහිමි වෙනවා. ඒ නිසා මේ විකෘති වෙලා තිබෙන දේශපාලනයේදී ජනතාව අතරට වැදගත් මතයක් ගෙනියන්න මේ බස්නාහිර පළාතේ අපි කටයුතු කරන්න ඕනෑය කියන මතයේ මම ඉන්නවා. විශේෂයෙන්ම තුනෙන් දෙකක ජනගහනයක් නියෝජනය කරන - අනික් එක අපව තමයි හැම පළාත් සභාවක්ම බොහෝ දුරට ආදර්ශයට ගන්නේ. ඒ වාගේම මේ කරන නිර්මාණ තමයි ජනතාව අනුගමනය කරන්නේ. ඒ නිසා මේ උඩු යටිකුරු වෙලා තිබෙන දේශපාලනයේදී වැදගත් දේශපාලන නායකයෝ ඉස්සරහාට බිහි කරන්න නම් අපි මේ පූර්වාදර්ශය දෙන්නට ඕනෑ. ඒ වාගේම යම්කිසි අඩුපාඩුවක් අපි තුළ පවා තිබෙනවා නම්, අපි පක්ෂ විපක්ෂ කියලා බොරුවට විවේචනය කරන්නේ නැතිව ඇත්ත කථා කරන්න ඉදිරිපත් වෙන්න ඕනෑ. දැන් එක්සත් ජාතික පක්ෂයේ කෙනෙකු වැරදි කරනවා නම්, ඒක නොබියව කියන්න අපි භය වෙන්නෙත් නැහැ. ඒ වාගේම මේ පළාත් සභාවේ ආණ්ඩු පක්ෂයේ කෙනෙකු ඉන්නවා නම් වැරදි කරන, ඒක කියන්න අපි භය වෙන්නෙත් නැහැ. ඒ නිසා මම විශේෂයෙන්ම කියන්නට ඕනෑ. මේ අවුරුදු දෙකක කාලය ගත වෙන කොට මේ ආණ්ඩු පිහිටුවන්න ඇත්ත වශයෙන්ම වැදගත් ජනතාවක් කැප වුණා. ඉතින් ඒ නිසා මේ වැදගත් ජනතාව, වැදගත් වෙනසක් බලාපොරොත්තුවෙන් කැප වුණා. ඒ සඳහා වැදගත් දේශපාලඥයෝ කැප වුණා. ඒ නිසා ඒ වැදගත් දේශපාලඥයින්ගේ අනන්‍යතාවය සහ වැදගත්කම ආරක්ෂා කරන්න මේ බස්නාහිර පළාත් සභාවේ අපි කැප වෙන්න ඕනෑය කියන එක ප්‍රකාශය කරමින්, දැනට විශේෂ කාරක සභාවක් යෙදී සිටින බැවින් ඔබතුමාගේ අවසරය ඉල්ලා සිටිනවා. ඒ වාගේම මේ අවස්ථාව ලබා දීම ගැන ස්තූතිවන්ත වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කටාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් වෙන්දේසි ඉඩම් සම්බන්ධව අක්‍රමිකතා පිළිබඳව කථා කරන්න රජිත හපුආරච්චි ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් මේ සම්බන්ධයෙන් අද මම ප්‍රශ්න දෙකක් සභාවට යොමු කරලා තිබුණා. ඒ ලැබුණු පිළිතුරුත් එක්ක මම තීරණය කළා, කථා කරන්න අවශ්‍ය නැහැයි කියලා. මම දැනුවත් කිරීමකුත් කළා. නමුත් අවස්ථාව ලැබුණු නිසා ඒ කාලය මම ගන්න සූදානම්. විශේෂයෙන්ම මම මතු කරලා තිබෙන්නේ, කටාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයිති සබ්ඩියාවත්ත ඉඩම කියන වෙන්දේසි ඉඩම සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන ගැටළුවක් සම්බන්ධයෙන්. ඇත්තටම කටාන ප්‍රාදේශීය සභා බල සීමාව තුළ ගත්තාම පසුගිය අවුරුදු දහය ඇතුළත ඉඩම් වෙන්දේසි කිරීම්, ඒ කියන්නේ එවැනි ව්‍යාපෘති 145 ක් පමණ පසුගිය අවුරුදු දහය ඇතුළත සිද්ධ වෙලා තිබෙනවා. එතකොට මේ 145 කෙසේ වෙතත් වැඩි ප්‍රමාණයක් අධ්‍යයනය කරලා බැලුවාම, ඒවායේ යම් යම් අක්‍රමිකතා තිබෙනවා. අඩු වැඩි වශයෙන් අක්‍රමිකතා තිබෙනවා.

ගොඩක් ඉඩම්වල අපි දැක්කා, පොදු භූමි විධියට නිර්දේශ කරලා තිබෙන ඉඩම්. නමුත් පොදු භූමි ප්‍රාදේශීය සභාවට නිසියාකාරව පවරා ගැනීමක් කරලා නැති ඒවා. ඒ සම්බන්ධයෙන් මම පසුගිය සභාවේදීත් ප්‍රශ්න කිරීමක් කළා. ඒ අනුව මට පිළිතුරු වාර්තාවක් ඉදිරිපත් කරලා තිබුණා. එතකොට ඒ ඉදිරිපත් කරලා තිබුණු වාර්තාවේ ප්‍රාදේශීය සභාවට පවරා ගත්තේ නැති ඉඩම් තිබෙන වෙන්දේසි ව්‍යාපෘති ඒ වාර්තාවෙන් හිතාමතාම ඉවත් කරලා තිබෙනවා. එතකොට වාර්තා වෙන්නේ සියලුම ඉඩම් ප්‍රාදේශීය සභාවට පවරා ගත්තා කියලා තමයි ඇවිල්ලා තිබෙන්නේ. මේ වාර්තාවට අනුව. හැබැයි, මේ වාර්තාවේ නැති ඉඩම්වලට අදාළ ඒ පිඹුරුපත් මගේ අතේ තිබෙනවා. ඒ නිසා හිතාමතාම මේ සභාවත්, අපිවත් නොමග අරින්න පසුගිය ඒ ප්‍රශ්නයත් එක්ක කටයුතු කරලා තිබෙනවා. ඒක වෙනම කථාවක්. එතකොට ඒක තිබෙන කොට තමයි ඒක ඇතුළේ තිබෙන මේ සබීඩියාවත්ත වෙන්දේසි ඉඩම ගැන මම මේ කථා කරන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ඉඩම වගුරු බිමක්. අක්කර හතහාමාරක වගුරු බිමක්. එතකොට මේ අක්කර 7 ½ ක වගුරු බිමක් වෙන්දේසි කිරීමේ හැකියාවක් නැහැ. ඒ නිසා ඒ හැකියාව ලබා ගැනීම සඳහා වංචනික ලෙස - දැන් මහ ඇමතිතුමා පිළිගත්තා. ප්‍රෝඩාකාරී ක්‍රියා පිළිවෙතක් අනුගමනය කරලා, මේ ඉඩමේම එහා පැත්තේ වැවක් හාරලා, ඒ වැවේ තිබෙන පස් ටික අරගෙන මේ පොදු භූමිය, මේ වගුරු භූමිය ගොඩ කරලා ඒ ඉඩම වෙන්දේසි කරන්න කටයුතු කරලා තිබෙනවා. ඒක තමයි පළමුවැනි වැරැද්ද. හැබැයි, දැන් එතැනින් එහා පැත්තට ගිහිල්ලා විශේෂයෙන්ම දැන් ඒ වගුරු බිම ගොඩ කරන්න, ඒ වැව හදන කොට කටාන ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිතුමා ගොවි ජන සේවා කොමසාරිස්ට ලියුමක් ලියනවා. මාගේ සහ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනියගේ - මගේ ළඟ තිබෙනවා ලියුම. අගෞරවයක් කරන්න නොවෙයි. මගේ ළඟ ලියුම තිබෙනවා. ඉල්ලීම පරිදි තමයි මේ වැව හදලා සභාවට පවරන්නය කියලා ඉල්ලීම කරලා තිබෙන්නේ කියලා. එතකොට දේශපාලඥයින්ගේ උවමනාව අනුව තමයි, සභාපතිතුමාගේ සහ ආසනයේ සංවිධායකවරයාගේ උවමනාව අනුව තමයි ඒ වැව හාරලා තිබෙන්නේ. ඒ හාරලා පස් ටික අරගෙන, ගොඩ කරලා ඉඩම විකුණුවා. ඒක එක පැත්තක්.

අනික් පැත්ත ගත්තාම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් අද වන කොට තත්ත්වය මොකක්ද? ඉඩම් කට්ටි 60 ක් විකුණලා තිබෙනවා. ඉඩම් කට්ටි 60 ක් කියන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගමක් හැදුවා වාගේ වැඩක්. ඉඩම් කට්ටි 60 ක්. පවුල් 60 ක් පදිංචි වෙනවා. එතකොට ඒ 60 ට අදාළව අද වන කොට ඉඩම ප්‍රාදේශීය සභාවට පවරා ගෙනත් නැහැ. පොදු ඉඩම. තිබෙන ඉඩම් කට්ටි අනුමත කරලත් නැහැ. ඒ නිසා ඒ ගැනුම්කරුවන් විශාල ලෙස අපහසුතාවයකට පත් වෙලා තිබෙනවා. ඇත්තටම මම කනගාටු වෙනවා. අපි මෙවැනි කාරණා කථා කරන කොට වගකිවයුත්තෝ කවුරුත් නැහැ. අපි කාටද මේවා කියන්නේ? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මේ කටාන ආසනයේ තිබෙන ප්‍රශ්නයක්, මිනිස්සුන්ගේ ප්‍රශ්නයක් අද සභාවේ කථා කරනවා. දැන් මම කාටද මේක කියන්නේ? ඉතින් වගකිවයුත්තෙක් නැහැ. ධූරධාරියෙක් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ කථාව හැන්සාඩ් ගත වෙනවා. ඒක අදාළ අමාත්‍යාංශවලට යනවා. ආණ්ඩුකාරතුමාට යනවා. විශේෂයෙන්ම ගරු ආණ්ඩුකාරතුමා මේ සියල්ලක්ම කියවනවා.

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, මේවාට යම්කිසි සාධාරණයක් වෙයි කියලා. විශේෂයෙන්ම දැන් අද දිනයේ මේ ප්‍රශ්නය මතු කරන කොට අපේ මහ ඇමතිතුමා ප්‍රකාශයක් කළා, අපේ ගැනුම්කරුවෝ ඉඩම මිලදී ගන්න වෙලාවේ සොයලා බලන්නේ නැහැයි කියලා. එතැන වැරැද්දක් තිබෙනවා තමයි. හැබැයි, එහෙම කියලා අපට මේ වගකීමෙන් නිදහස් වෙන්න පළාත් සභා මන්ත්‍රීවරු විධියටත්, පළාත් පාලන ආයතනය විධියටත්, පළාත් සභාව විධියටත් අපට එහෙම පුළුවන්කමක් නැහැ. ඒ අයට අවශ්‍ය නියාමනයක් කරන්න, ඒ අයට මග පෙන්වීමක් කරන්න, ඒ අයට සාධාරණයක් ඉෂ්ට කරන්න තමයි මේ සභාවල් තිබෙන්නේ. ඒ සභාවේ වගකීම ඉෂ්ට කරපු නැති නිසා තමයි අද පවුල් 60 ක් විතර අසාධාරණයට ලක් වෙලා තිබෙන්නේ. හැබැයි, මේ අසාධාරණයට ලක් කරපු වෙන්දේසිකරුවන් දිගින් දිගටම තවමත් නිදැල්ලේ මේ වෙන්දේසි කිරීම් කටයුතු කර ගෙන යනවා. අදටත්.

ඒ නිසා අපි කියන්නේ. අපට කාත් එක්කවත් පුද්ගලික ප්‍රශ්නයක් නැහැ. අපි ජනතාව වෙනුවෙනුයි පෙනී සිටින්නේ. ඒ නිසා මේ ඉඩම් 60 ක් මිලදී ගත් ඒ ගැනුම්කරුවන්ට සාධාරණයක් ඉෂ්ට කරන්න හැකි ඉක්මණින් ක්‍රියාමාර්ග ගන්නය කියන ඉල්ලීම මම මේ වෙලාවේ ඔබතුමා මගින් ඒ අදාළ බලධාරීන්ට කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තූතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

වර්තමාන දේශපාලන පසුබිම පිළිබඳව බස්නාහිර පළාත් සභාවේ. ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම මම කනගාටු වෙනවා, යහපාලන රජයේ පාර්ශවකරුවෙකු හැටියට. දැන් අපි පසුගිය අවුරුද්දේ අදාළ උසස් අයව හම්බ වෙලා අපි කිහිප වතාවක්ම පැමිණිලි කළා. මේ බස්නාහිර පළාත් සභාවේ වෙන අසාධාරණය ගැන. අපි කිව්වා, අපි යහපාලනයේ ඉන්නවා නම්, මේ සම්පත් අපිත් එක්කත් බෙදා ගන්න ඕනෑය කියලා. අද වන තෙක් තවම එහෙම වෙලා නැහැ. අද වන කොට ඉතාමත් සූක්ෂම ලෙස - මම අද කනගාටු වෙනවා, මේ ඇමති මණ්ඩලයත්, මහ ඇමතිතුමාත් මෙතැන නැති එක ගැන. විශේෂයෙන්ම ජා-ඇළ ආසනයේ නගර සභාව, ප්‍රාදේශීය සභාව, මේ ජනතාවගෙන් බදු එකතු කරන මුදල්වලින්, මහජනතාවගෙන් යෝජනා අරගෙන ඒ මුදල්වලට ඇස්තමේන්තු හදලා අද වන කොට මහ ඇමතිතුමා විසින් විශේෂ නියෝගයක් යටතේ සියලුම වැඩ කටයුතු තහනම් කරලා තිබෙනවා. මම මේක මීට ඉස්සෙල්ලත් කියන්න හැදුවා. අපි කනගාටු වෙනවා. මම අද එන කොට දැක්කා මහ ඇමතිතුමා ලොකු බෝඩ් එකක් ගහලා තිබෙනවා. මෛත්‍රිපාල සිරිසේන ජනාධිපතිතුමාගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, කෝට්ටේ. සුභ පතලා. එක පැත්තකින් ජනාධිපතිතුමාට සුභ පතනවා. අනික් පැත්තෙන් වක්‍රව ඒකාබද්ධ විපක්ෂයට අවශ්‍ය පහසුකම් ටික ලබා දෙනවා. (බාධා කිරීම්) මේක ඉතාමත් කනගාටුදායක තත්ත්වයක්. අපි දිගින් දිගටම කිව්වා. මේ රජයට කිව්වා. ජනාධිපතිතුමාට කිව්වා, මේක නවත්වන්නය කියලා. අද වන කොටත් නැවතිලා නැහැ. ඒ නිසා අපි ඉතාමත් කනගාටුවෙන් අද කියන්නේ. අද අපේ පළාත් පාලන ආයතන සියලුම බලතල අද අතට අරගෙන එතුමා, එතුමාට ඕනෑ ඕනෑ විධියට, එතුමාට ඕනෑ ඕනෑ අයට සලකන්න අද අවස්ථාවක් අරගෙන තිබෙනවා. මේවා මහජනතාවගේ බදු මුදල්. මහ ඇමතිතුමාගේ, අපේ පළාත් සභාවෙන් එන මුදල් නොවෙයි. ඒක අද ජනතාව අපට ඇවිල්ලා කියනවා, අපේ පාර හදලා නැහැ. අපි ඇස්තමේන්තු අරගෙන තිබෙනවා එවපුවා. බජට් එකේ රිපෝට් එක අපි අරගෙන තිබෙනවා. ඒකේ තිබෙනවා, මේ මේ පාරට මෙපමණ වෙන් කරලා තිබෙනවා. ඇස්තමේන්තු කරලා තිබෙනවා. මෙපමණ මුදලක් වෙන් කරලා තිබෙනවාය කියලා. අද වෙන කොට ඒක හැදෙන්නේ නැහැ.

අද විශේෂයෙන්ම ජා-ඇළ ආසනයේ ප්‍රාදේශීය සභා, නගර සභා කරන වැඩවලට මහ ඇමතිතුමා ලියුම ගහනවා. නෝට් එකක් දාලා දෙනවා. ඊට පස්සේ මෙරිල් මන්ත්‍රීතුමා ගිහිල්ලා බෝඩ් එකක් එල්ලා ගන්නවා. මගේ ඉල්ලීම පරිදි, මගේ මැදිහත්වීමෙන් මේ මාර්ගය කාපට් කළා. නැත්නම් තාර දැම්මාය කියලා. මේක නවත්වන්න ඕනෑ. අපි හැමදාම අත උස්සලා - මම නම් මීට පස්සේ අත උස්සන්න ලැහැස්ති නැහැ. මීට පස්සේ අත උස්සන්න ලැහැස්ති වෙලා නැහැ. මින් ඉදිරියට මේ යහපාලනය මෙහෙම නම් ගෙනියන්නේ, මේ පළාත් සභාව තුළ මගෙන් සහයෝගයක් බලාපොරොත්තු වෙන්න එපා කියලා මම විශේෂයෙන්ම අවධානය කරනවා. මේක බොරුවට මුහුණ දාගෙන අනික් පැත්තෙන් ඒකාබද්ධ විපක්ෂයට අවශ්‍ය, ඡන්දයට යන්න අවශ්‍ය සියලුම දේ සපයන එක තමයි අද මහ ඇමතිතුමා කරන්නේ. මම භය නැතිව කියනවා. මගේ ඊළඟ අවුරුද්දේ ලක්ෂ 25 කැපුවත් මට කමක් නැහැ. මට ඒක අදාළත් නැහැ. ඕනෑත් නැහැ. හැබැයි, හරි දේ කරන්න බැරි නම් අපි මහ ඇමතිතුමාට ඉතාමත් කරුණාවෙන් කියනවා. වෙන කෙනෙකුට භාර දීලා අයින් වෙලා යන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කියන කල් හිටියේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

යහපාලනයේ බෝඩ් ගහගෙන ඉන්න එපා. යහපාලනයේ බෝඩ් ගහගෙන, මහින්ද රාජපක්ෂගේ කණ්ඩායම

පෝෂණය කරන්න හදන්න එපා. එහෙම කරනවා නම්, මම මීළඟ අයවැයේදී මගේ ඡන්දයත් බලාපොරොත්තු වෙන්න එපාය කියන එක ඉතාමත් පැහැදිලිව කියනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

සන්ධානේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දැන් සන්ධානයක් නැහැ. ඒක ඔබතුමන්ලා තේරුම් ගන්න. සන්ධානයේ කාලය ඉවරයි. ඔබතුමන්ලා ඉන්නේ ඒකාබද්ධ විපක්ෂයේ. ඔබතුමන්ලා ඉන්නේ ඒකාබද්ධ විපක්ෂයේ. ඒ නිසා දැන් බොරුවට සන්ධානය ගාන්න එපා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්. කථාව අවසන් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කොන්ද කෙළින් තියාගෙන කථා කරන්න ඉගෙන ගන්න. ඒකාබද්දේ නම් ඒකාබද්දේ කියන්න. (බාධා කිරීම්) ඉන්නේ මහින්ද රාජපක්ෂ එක්ක නම් මහින්ද රාජපක්ෂත් එක්ක ඉන්න. අපි අවුරුදු 20 ක් විපක්ෂයේ ඉඳගෙන අපි බොරුවට පන්දම් ඇල්லුවේ නැහැ එක එකාට වැඩ කර ගන්න. තේරුණාද? අපි විපක්ෂයේ ඉන්න විධියට හිටියා. දැන් තමුන්නාන්සේලාත් ඒක පුරුදු වෙන්න. විපක්ෂයේ ඉන්න. බොරුවට පන්දම් අල්ල අල්ලා ගිහිල්ලා, (බාධා කිරීම්)

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මහින්ද රාජපක්ෂ නොවෙයි කියන්නේ. විජයදාස රාජපක්ෂ කියන්නේ. ආණ්ඩුවේ යම පාලනය ගැන මේ තිබෙන්නේ. විජයදාස කියන්නේ. ආණ්ඩුවේ කැබිනට් ඇමති.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

යහපාලනයේ අපේ ඡන්දය අවශ්‍ය නම් හරියට හැන්දෙන් බෙදන්න පුරුදු වෙන්න කියලා අපි මහ ඇමතිතුමාට ප්‍රකාශ කරනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36(1). මේ අපේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා මේ පළාත් සභාව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට වුණු අසාධාරණයක් -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඔව්. මට වුණු අසාධාරණයක්. මොකද, මම මහින්ද පිලේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ නම කිව්වේ නැහැ නේ?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මහින්ද පිලේ. ඒකාබද්ධෙ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කොන්ද පණ තිබෙන මිනිහෙක්.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් සභාව පත් කළේ මහින්ද මහත්තයා යටතේ. පළාත් සභාව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට අවස්ථාව දෙන්න බැහැ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඒ නිසා ඉසුර දේවප්‍රියගෙන් පටන් ගත්තාම අපි හැම කෙනෙක්ම ආණ්ඩු පක්ෂයේ. අපි විපක්ෂයේ නොවෙයි. අපි මහින්දගේ තමයි. මන්ත්‍රී වුණේ මහින්දගෙන් තමයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර වාඩි වෙන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

පළාත් සභාවට ඒකාබද්දේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට සමඟි ව්‍යාපාරය හා සමෘද්ධි නිලධාරීන්ගේ ගැටළු සම්බන්ධව, සහනාධාර කප්පාදුව පිළිබඳව කථා කරන්න ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා. කරුණාකර නිශ්ශබ්ද වෙන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඉල්ලීමක් කරනවා, පසුගිය වතාවේදීත් මේ කාරණාව කියන්න ගියාම වර්තමාන පළාත් සභාවේ විපක්ෂය, ඒ වාගේම ආණ්ඩු පක්ෂය විධියට මධ්‍යම රජයේ ඉන්න අය මේ කාරණාවලට විරුද්ධව අදහස් ප්‍රකාශ කරන්න ගිහිල්ලා මගේ කාලය ගත්තා. ඒ නිසා හැමෝගෙන්ම ඉල්ලවා. ඕනෑම අදහසක් පස්සේ කියන්න. මට තිබෙන කාලය ඇතුලේ මේ කාරණය ඉදිරිපත් කරන්න දෙන්න. විශේෂයෙන්ම මේ රටේ අමාරුවෙන්ම ජීවත් වන ජන කොට්ඨාශයක් සහ ඒ අය වෙනුවෙන් වැඩ කරන නිලධාරීන් ගැන කථා කරන්නයි මම මේ අවස්ථාව ගන්නේ. පසුගිය දිනවල ඔබතුමන්ලා හොඳින්ම දැක්කා. මේ රටේ සෑම තැනකම ඊයේ දවසේත් සමෘද්ධි සහනාධාර කප්පාදු කිරීමක් සම්බන්ධව යම් විරෝධතා මතු වුණා. මේ සම්බන්ධව පාර්ලිමේන්තුවේත් යම් විරෝධතාවයක් මතු කළා. අපේ කරුණු දැන්වීම් මත. වෘත්තිය සමිතියක් විධියට මම නියෝජනය කරන - මම ප්‍රධාන ලේකම්වරයා විධියට කටයුතු කරනවා. සමස්ත ලංකා සමෘද්ධි කෘෂි නිලධාරී සංගමය. මේ සම්බන්ධව අතිගරු ජනාධිපතිතුමා ඇතුළු රජයේ පාර්ශව වෙත සහ විෂය භාර ඇමතිතුමාත් දැනුවත් කළා. මේ සහනාධාර කප්පාදුව තුළ මේ රටේ අසරණ දුප්පත් ජනතාව කබලෙන් ලිපට වැටෙනවාය කියන තත්ත්වයකට, පත් වෙනවාය කියන කාරණාව සම්බන්ධව එදා මේ සභාවේ සමහරු කිව්වා, නැහැ. එහෙම එකක් වෙන්නේ නැහැයි කියලා. මේ කාරණාව සම්බන්ධව රට පුරාම විරෝධතා මතු වෙද්දී අතිගරු ජනාධිපතිතුමා ප්‍රකාශයක් කළා. අපි කිසිම සහනාධාරයක් කපන්නේ නැහැ. කිසිම සහනාධාර මුදලක් අඩු කරන්නේ නැහැ. අපි තව ලක්ෂ ගණනකට සහනාධාර දෙන්න කටයුතු කරනවාය කියලා.

හැබැයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සිදු වෙමින් තිබෙන්නේ ඊට වඩා වෙනස් තත්ත්වයක්. ජනාධිපතිතුමාත් නොමග යවමින් යම් නිලධාරීන් හෝ අමාත්‍යවරයා කටයුතු කරන බවයි පේන්නේ. සමෘද්ධි ව්‍යාපාරයේ අලුතින් ලක්ෂ ගණනක් ලබා දෙන්න තවත් කෝටි ගණනක මුදලක් අවශ්‍යයි. ජනාධිපතිතුමා කිව්වේ, සියලු මුදල් අඩු කරන්නේ නැහැ. හැබැයි, අලුතෙන් දෙන එකක් කිව්වේ නැහැ. ඒ නිසා අලුතෙන් රජය කිසිම සහනාධාරයකට මුදල් වෙන් කිරීමක් කරලා නැහැ. එහෙම නම් අලුතෙන් ලක්ෂ ගණනක් තෝරා ගනිමින් ඉන්නවා. ඒ අයට ලබා දීම සඳහා දැනට සහනාධාර ලබන අයගේ සහනාධාර අඩු කරන්න ඕනෑද? ඒ සඳහා අලුතෙන් තෝරා ගැනීම සඳහා 2017.06.23 සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල් විසින් අඩු ආදායම්ලාභී පවුල් සමීක්ෂණ පදනම් කර ගෙන විද්‍යාත්මක ක්‍රමවේදයක් අනුව සමෘද්ධි සහනාධාරලාභීන් තෝරා ගැනීම කියලා චක්‍රලේඛයක් රට පුරා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට නිකුත් කළා. මේ චක්‍රලේඛය අනුව ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පවුලේ සාමාජිකයෙකු සාමාන්‍ය පෙළ අධ්‍යාපනය ලබා තිබෙනවා නම්, සහනාධාර ලබන්න සුදුසුකමක් නැහැ. ඒ වාගේම ගෘහ මූලිකයා අට සමත් නම් ඒ සුදුසුකමක් නැහැ. පාසල් යන වයසේ සිටින නමුත් පාසල් නොයන ළමයෙකු ඉන්නවා නම්. එතකොට තමයි ඒ සුදුසුකමක් ඇති වෙන්නේ. පාසල් යනවා නම් අඩු මට්ටමින් හරි ඒ සුදුසුකමක් නැහැ. මේ අතර තිබෙනවා, මේ පවුලේ නිවාස සම්බන්ධ කාරණා. පවුලේ තිබෙනවා නම් TV එකක්, පාපැදියක්. ඒක විතරයි සුදුසුකමක් වෙන්නේ. හැබැයි ශීතකරණයක් තිබෙනවා නම්, එයා සුදුස්සෙක් නොවෙයි. වර්ග අඩි 500 ට වැඩි ගෙයක්

තිබෙනවා නම්,ගෙයි පිදුරුද සෙවිලි කරලා තිබෙන්නේ. ඉලුක්ද? එහෙම නැත්නම් සෙවිලි කරලා තිබෙන්නේ පොල් අතුද ආදී වශයෙන් අහනවා. ඒවාවලට එහෙම පිදුරු පොල් අතුවලට ලකුණු දෙනවා. ඊට එහා තිබෙනවා නම්, ලකුණු දෙන්නේ නැහැ. ලකුණු කැපෙනවා. මේ විධියට මේ සමීක්ෂණය ඇතුළේ සිදු වුණේ මේ රටේ අද තිබෙන තත්ත්වය නොවේ. මේ රට දැන් තව අවුරුදු 60 කට විතර පස්සේ පරණ තත්ත්වයක් තමයි සොයලා බලන්න ඕනෑ. මේ වනකල් ආපු කාලේ නොවෙයි. පසුගිය දශක තුනක ත්‍රස්තවාදය අවසන් කළාට පස්සේ, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ සීඝ්‍ර සංවර්ධනයක් වුණා. මේ රටේ විවිධ ක්ෂේත්‍රවල මංමාවත් ඉදි වෙලා, අලුත් ගමනක් ආරම්භ වුණා.

දැන් මේ ගමන තුළ පවුල් සංවර්ධනය වෙලා, මිනිස්සුන්ගේ ආර්ථිකය ශක්තිමත් වුණා. 25% ක සමෘද්ධි ව්‍යාපාරය 1994 දී පටන් ගන්න කොට තිබුණ දුප්පත්කම 6% දක්වා අඩු වුණා. හැබැයි, ඒ වුණත් තවත් අඩු ආදායම්ලාභී, සහනාධාර ලැබිය යුතු අය ඉන්නවා. එතකොට ඒ සහනාධාරලාභීන් සම්බන්ධව අලුතෙන් තෝරා ගැනීම් කරන කොට මෙන්න මේ නිර්නායක - අවසානයේ දැන් මේ විරෝධතාවය ආවාට පස්සේ ඇමතිතුමා කිව්වා, නැහැ මේක මේ කොම්පියුටරයට වැරදිලා. අර කැකිල්ලේ නඩු තීන්දු දෙනවා නේ? කවුරු හරි වැරදිකාරයෙක් කරලා. ඒ නිසා ඇමතිවරයා කියන්න ගත්තා, කොම්පියුටරයට වැරදිලා. ඒ නිසා දත්ත දැමීමේදී වැරැද්දක් කියලා. මේ දත්ත කම්පියුටරයට ඇතුළත් කරන්න එක ඇප්ලිකේෂන් එකකට රුපියල් විස්සක් ගියා. පවුල් ලක්ෂ 25 ක තොරතුරු. ලක්ෂ 500 ක් මේ ඇප්ලිකේෂන් ඇතුළත් කිරීමට විතරක් වියදම් කළා. කාගේද සල්ලි? දුප්පත් මිනිස්සුන්ගේ සල්ලි. එතකොට ඇමතිතුමා දැන් මේක තාවකාලිකව නවත්වලා. මේ විරෝධතාවය නිසා. එදා මම කථා කරන කොට කිව්වා, එහෙම වෙන්නේ නැහැයි කියලා. හැබැයි, දැන් නතර වුණා. නතර කළාම ඔබතුමන්ලාට පැහැදිලියි. කාටත් මෙහෙම එකක් ආවා. දැන් නතර කළා. හැබැයි, නතර කළේ මේ අහක යන කම්පියුටරයක්. කම්පියුටර් නොවෙයි. මේ නිර්නායක ජාත්‍යන්තර මට්ටමින් තෝරා ගත් ඒවා තිබෙන්නේ, පිදුරු සෙවිලි කළ පැල්පත සොයලාද? එහෙමද මේ ආදායම් තත්ත්වය බලන්නේ. ඉතින් අපි රටේ ජනාධිපතිතුමාගෙනුත්, අගමැතිතුමාගෙනුත් ඉල්ලනවා. මේවා දන්නවාද කියලා අපි දන්නේ නැහැ. දන්නේ නැත්නම්, මේවා දැන ගෙන ඔබතුමන්ලා දැනුවත් කරන්න ඔබතුමන්ලාගේ පක්ෂයේ නායකතුමන්ලාව. කොයි පක්ෂයේත් මේ අඩු ආදායම්ලාභී ජනතාව ඉන්නවා. අපි කාටත් ඡන්දය දුන්න, දුප්පත් මිනිස්සු ඉන්නවා. ඒ මිනිස්සු වෙනුවෙන් කථා කරන්න, හඬක් නගන්න පිරිසක් නැහැ. ඒ නිසා තමයි අපි මේ සභාවලට ඇවිල්ලා තිබෙන්නේ. මේ රටේ තැලෙන, පෑගෙන, පොඩි වෙන මිනිස්සු වෙනුවෙන් කථා කරන්න. ඒ නිසා අපි පැහැදිලිව කියනවා. මේ නිර්ණායකම වැරදියි. කොම්පියුටරය නොවෙයි වැරදි. ඒ වාගේම මේ සඳහා වියදම් කළා, ඔය ලක්ෂ 500 ට අමතරව තවත් ලක්ෂ හය හත්සියයක්. ලිපි ලේඛන සකස් කරන්න සහ වෙනත් තොරතුරු ගැනීම සඳහා නිලධාරීන්ට ගෙවීම සඳහා ආදී වශයෙන්. එතකොට ලක්ෂ දෙතුන් දාහකට ආසන්න ප්‍රමාණයක්. අඩුම ගණනේ මේ සමීක්ෂණ කටයුතු සඳහා 1500 ක ප්‍රමාණයක්වත් වියදම් කළා. ඒ නිසා මේවා ජාතික අපරාධ. මේ ජාතික අපරාධ කරලා, තවත් දුප්පත් මිනිස්සු කබලෙන් ලිපට ඇදලා දානවා. ඒ අතර තිබෙනවා. පරිපූරක ඇස්තමේන්තු දාලා, ඇමතිවරුන්ට තව තවත් වාහන දෙන්න. තව තවත් නායකයින්ට. මේ දුප්පතාගේ සහනාධාරය කපන්නේ නැතිව ඕනෑ එකක් කර ගන්න. හැබැයි, දුප්පතාට ගහලා, බිම වට්ටලා, ඒ මිනිස්සුන්ගේ සහනාධාර නැති කරලා තමුන්නාන්සේලාට කවදාවත් ආයිත් ඡන්දයකට යන්න වෙන්නේ නැහැ. ඒ වාගේම අපි ඉල්ලනවා. ඡන්ද ගැන හිතන්නේ නැත්නම් - ඡන්ද කල් දාන්න නේ අදත් 20 වන සංශෝධනය එන්නේ. මේ කල් දාන්න නේ? ඒවා ඔබතුමන්ලාගේ පැතිවලින් ඒ ආණ්ඩු නායකයෝ කරපුදෙන්. හැබැයි, මේ රටේ ජනතාව ඡන්දය තිබ්බ වෙලාවට මේ රට නැවත විශාල පරිවර්තනයක් කරා ගෙනියනවා. මේකට විරුද්ධව. ඒ නිසා අපි ඉල්ලනවා. මේ දුප්පත් මිනිස්සුන්ගේ සහනාධාර කපන, මේ ක්‍රමවේදය සම්පූර්ණයෙන් ඉවත් කර ගන්න කියලා.

ඒ එක්කම තව එක කාරණාවක් මතක් කරන්න ඕනෑ. සමෘද්ධි නිලධාරීන් සම්බන්ධයෙන් මහින්ද රාජපක්ෂ මැතිතුමා දිවි නැගුම පනත ගෙනැල්ලා, උසාවියෙන් විශාල අභියෝගයකට ලක් වුණා. පාර්ලිමේන්තුවේ 2/3 ක බහුතරයක් ගත්තා. මේ පළාත් සභාව ඇතුළු පළාත් සභා නවයේම අනුමැතිය ගත්තා. ඒ සඳහා විශාල කැප කිරීමක් කරලා ඒ රජය යටතේ නිලධාරීන්ට විශ්‍රාම වැටුපක් හැදුවා. මේ ආණ්ඩුවේ ඇමතිවරු ගත්ත ගොන් තීන්දු

[ගරු ජගත් කුමාර]

නිසා ඒ නිලධාරීන් 8,100 කට අද විශ්‍රාම වැටුප නැති වෙන තත්ත්වයට පත් වෙලා. ඒ පසුගිය කාලයේ ලබා දුන්න සහනය. මගේ ළඟ තිබෙනවා. 2016 ජූලි 12 වැනිදා කැබිනට් මණ්ඩලය ගත්ත තීන්දුවක්. මේ කැබිනට් පත්‍රිකා අනුමැතිය ලැබුණු එක. අබේසිංහ - අමාත්‍ය මණ්ඩල ලේකම් මේකේ කියලා තිබෙනවා, මේ පරණ සේවකයන් විධියට ගිය සමෘද්ධි නිලධාරීන් සඳහා අර්ථ සාධක අරමුදල් ගෙවලා තිබෙනවා නම්, ඒ අයට විශ්‍රාම වැටුප ලබා ගන්න විධියක් නැහැ. එහෙම නැත්නම් ඒ මුදල නැවත ගෙවන්න ඕනෑ. මේ වාගේ බරපතළ අපරාධ ප්‍රමාණයක් සමෘද්ධි නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප නැති කිරීමේ සිට ප්‍රතිලාභියා මහ පාරට ඇද දමන තත්ත්වයට ගෙනැල්ලා තිබෙනවා. ඒ නිසා වර්තමාන ඇමතිතුමා අනික් පැත්තෙන් සමෘද්ධි ව්‍යාපාරයේ අරමුදල් කෝටි ගණන්. කෝටි 145 ක්, 2016 ජනවාරි සිට ජූනි දක්වා විවිධ, සමෘද්ධි ව්‍යාපාරයට පටහැනි ව්‍යාපාර ජනතාවගේ අවශ්‍යතාවයන් නොවන විවිධ වැඩ කටයුතු සඳහා යොදා ගෙන තිබෙනවා. ඒ නිසා ඒ දුප්පත් මිනිස්සුන්ට මරණයකදී, විවාහයකදී, දරු උපතකදී රෝහල් ගත වීමකදී ලබා දෙන්න තිබුණු මුදලත් දැන් ඇමතිවරයා තමන්ගේ පුතා ඉන්න ආසනවලට වෙන වැඩවලට යොදවමින් තිබෙනවා.

ඒ නිසා ඔවුන්ගේ දේශපාලන ප්‍රතිරූප ගොඩ නගා ගන්නේ දුප්පත් මිනිස්සුන්ගේ සල්ලිවලින්. එක්සත් ජාතික පක්ෂයේත් ඇති අවංක මිනිස්සු වෙනුවෙන් වැඩ කරන මන්ත්‍රීවරු. අපි කියනවා, සොයලා බලන්න. මේ ව්‍යාපාරය ඇතුළේ යම් ප්‍රමාණයකට මහා බරපතළ වංචාවන්, දූෂණයන් සිද්ධ වෙනවා. ඒවා සම්බන්ධව සොයලා බලලා, දුප්පත් මිනිස්සු වෙනුවෙන් හඬ නගලා, මේ සහනාධාර කප්පාදුවත්, නිලධාරීන්ගේ අයිතිවාසිකම්, විශ්‍රාම වැටුප අහිමි වීමටත් එරෙහිව හඬ නගන්න මේ යෝජනාව මේ අදහස මධ්‍යම රජයට දන්වා යවන්න කියලත්, ඒ සඳහා නිහඬව අපට සහයෝගය දුන් සියලුම මන්ත්‍රීතුමන්ලාට මගේ ගෞරවය පිරිනමමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ කොළඹ දිස්ත්‍රික්කයේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමට හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතන්නේ මගේ පැහැදිලි කිරීමේ මාතෘකාව වෙලා තිබෙන්නේ, බස්නාහිර පළාතේ මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය ඇගයීම කියලා. මම හිතන්නේ, මේ ප්‍රස්තුත කරුණු කාරණාව පිළිබඳව මේ විධියේ ඇගයීම් වෙලා තිබෙනවාය කියලා මම විශ්වාස කරන්නේ නැහැ. මේ වාගේ පැහැදිලි කිරීමකදී. නමුත් මගේ හෘදය සාක්ෂිය කිව්වා, ඒක කරන්න ඕනෑය කියලා. මොකක්ද ඒකට හේතු භූත වුණු කාරණාව තමයි. මගේ ගෙදරට යන පාර කියන වචනයෙන් මම හඳුන්වන්නේ නැහැ. නමුත් මගේ ප්‍රදේශයේ තිබෙන වැදගත්ම පාරක් වන පෙරේරා මාවත මම හිතන්නේ, අවුරුදු අටක පමණ වෙලේ ඉඳන් එවකට හිටපු මහ ඇමතිතුමාගෙන්, එවකට හිටපු පළාත් සභාවේ මාර්ග පිළිබඳ ඇමතිවරයාගෙන්, ඇමතිවරුන්ගෙන් කාලයක් තිස්සේ ඉල්ලීමක් කළා, මේ පාර හදලා දෙන්නය කියලා. මමත් හැමදාම උදේ හවස යන්නේ ඒ පාරේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. නමුත් ඒක කෙරුණේ නැහැ. නොයෙකුත් දේශපාලන කාරණා, කුහකකම් නිසා කෙරුණේ නැහැ. නමුත් මම ස්තුතිවන්ත වෙනවා. අපේ වර්තමාන ප්‍රධාන අමාත්‍යතුමාට මේ කාරණාව ඉදිරිපත් කළාට පස්සේ එතුමාගේ නිලධාරීන් එවලා ඒ කාරණාව සැබෑ කාරණාවක් බව තේරුම් අරගෙන, මේකට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන වෙන් කළා, ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ තිබෙන ප්‍රතිපාදන මත. මේකේ මම කියන්න යන කාරණාව, දැන් මේ සල්ලි වෙන් වුණත්, වෙන් කළත් මීට ඉස්සෙල්ලා තිබෙන අත්දැකීම් අනුව මේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ගේ එහෙම ඉක්මන්කමක් තිබුණේ නැහැ. මීට අවුරුදු ගණනකට ඉස්සෙල්ලා මාර්ග සංවර්ධන අධිකාරියට ඉල්ලීම් කළොත්, එක්කෝ ඒ කාලයේ හිටපු සභාපතිවරයා මොනවා හරි හුරතල් උත්තරයක් දෙනවා. සාමාන්‍යාධිකාරීතුමා හරි සර්, හරි ඇමතිතුමා, හරි මන්ත්‍රීතුමා. ඒ කාලේ මම ඇමතිවරයෙක් වෙලත් හිටියා නේ. ඒ නිසා එහෙම කියනවා. නමුත් එහෙම ප්‍රතිචාරයක් දැක් වුයේ නැහැ. ඒවා නිකම් වචනවලට විතරයි සීමා වුණේ. නමුත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ මුදල් ටික වෙන් කරලා, මේක කඩිනම් කර ගන්න මම උත්සුක වෙන කොට

මටත් වඩා ඉස්සරහායින් මේ මාර්ග සංවර්ධන අධිකාරියේ කොළඹ දිස්ත්‍රික්කයේ නිලධාරීන් හරිම කාර්යක්ෂමව කටයුතු කළා. විශේෂයෙන් දැන් වර්තමානයේ පත් වෙලා ඇවිල්ලා ඉන්නේ ඉංජිනේරුතුමියක්. ඉස්සෙල්ලා හිටියේ ඔක්කොම පුරුෂ පක්ෂයෙන්. මේ ඉංජිනේරුතුමිය පෞද්ගලිකව ඇවිල්ලා මාව හම්බ වෙලා. ඒක හරිම විරල අවස්ථාවක්. එතුමියගේ නිලධාරීන් එක්ක ඇවිල්ලා, මේ පාරේ සංවර්ධනය පිළිබඳව සම්පූර්ණ විශ්ලේෂණයක් කරලා, ඒකට උනන්දු වෙලා කර ගෙන යනවා.

ඉතින් මම කල්පනා කළා. මෙවැනි නිලධාරීන් පිළිබඳව ඇගයීමක් කරන්න ඕනෑ. මොකද, හුඟක් වෙලාවට අපේ නිලධාරීන්, අමාත්‍යාංශ කිහිපයක ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. දුරකථන ඇමතුමක් ගත්තාම ඇමතුම් දහයක් ගත්තත් කථා කරන්නේ නැහැ. සමහර විට ඇමතිවරු කථා කරනවා. ඉතින් මම මේ සභාවේදී ඒ කාරණාවත් ප්‍රකාශ කරන්න ඕනෑ. කරුණාකරලා මේ පළාත් සභාවේ ඉන්න හැම නිලධාරියෙකුටම කියන්න. මේ පළාත් සභාවේ ඉන්නේ මන්ත්‍රීවරු 104 දෙනයි. 104 දෙනාගේම නම් ටෙලිෆෝන් අංක තමාගේ දුරකථනයේ දුරකථන නාමාවලියට ඇතුළත් කර ගන්නය කියලා. මොකද, නොදන්නා දුරකථන අංකයක් ආවාම කථා නොකළාට කමක් නැහැ. නමුත් අපි කථා කළාම අපේ නම තිබෙනවා නම්, ඒකේ අනිවාර්යෙන්ම වැටෙන්න ඕනෑ. මම හිතන්නේ, ඒක චක්‍රලේඛයකින් කිව්වත් කමක් නැහැ. ඇයි? අපි කථා කරලා පස්සේ හරි කථා කළේ නැත්නම්, ඒ නිලධාරියාගේ යුතුකම පළාත් සභාවේ මන්ත්‍රීතුමා නැත්නම් අමාත්‍යවරයා වෙනුවෙන් කෙරෙන්නේ නැහැ. මම මේ කියන්න ගිය කාරණාව ටිකක් පිට පැන්නා. මේ නිලධාරීන් දුරකථනයෙන් කථා කළාම පෙරළා කථා කරනවා. ඇවිල්ලා බලනවා. මේක ඉතාමත් ආකර්ෂණීය තත්ත්වයක්. මේ නිසා මම මේ අවස්ථාවේදී මේ පළාත් සභාව තුළ, මේ පාර්ලිමේන්තුවට පමණක් දෙවැනි වන උත්තරීතර සභාවේ මට වුවමනාවක් වුණා ඒ නිලධාරීන්ව අගයන්න. නම් ගම් වශයෙන් කියන්න මට තේරෙන්නේ නැහැ. මම හිතන හැටියට, කොළඹ දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරුතුමිය ඇතුළු අනෙකුත් කාර්ය මණ්ඩලය ඉතාමත් කාර්යක්ෂමයි කියන එක මේ පළාත් සභාවේ වහළ යටදී මම ප්‍රකාශ කරන්නයි ඕනෑ වුණේ. හැබැයි, මේ කාරණාවේදී ඒ ගෞරවය, අපේ ප්‍රවාහන ඇමතිතුමාට, නැත්නම් සමුපකාර ඇමතිතුමාට යන්න එපාය කියනවා නොවෙයි. මම හිතනවා, එතුමා මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළොත් හොඳයි. ඇයි? මේ කාර්යක්ෂමතාවයේ යෙදෙන්න සභාපතිතුමාගේත් යම්කිසි දෝලනයක් තිබෙන්න ඕනෑ. ඉන්න සභාපතිතුමා මම කවුද කියලා දන්නේ නැහැ. හැබැයි, මේ කාරණාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක සමුපකාර අමාත්‍යාංශයෙන් ඒ දේ කෙරෙන්නේ නැහැයි කියන එකත් මට කියන්න ඕනෑ. සමුපකාර කොමසාරිස්වරයා කථා කළොත් ආපහු කථා කරන්න හරි අමාරුයි. මොකද, දන්නවා මේ මොනවා හරි කවල් එකක් තමයි එන්නේ කියලා. කවදාවත් කථා කරන්න බැහැ. දකුණු කොළඹ සමුපකාර සමිතිය පිළිබඳව, ඒ තිබෙන තත්ත්වය පිළිබඳව, විටින් විට කථා කළා. කරුණු කාරණා ඉදිරිපත් කළා. රීති හදන්න කියලා අද වනකල්වත් නැහැ. ඒකට වගකියන්න ඕනෑ ලේකම්තුමිය. උපදේශක කාරක සභාවේ එක දවසක් කිව්වා, ඊළඟ සභාවේ කෙරෙනවා කියලා. නැහැ. කථා කරන්නේ නැහැ. ඒ නිසාම ඒ වගකීම ඇමතිවරයාටත් යනවා. අද ඇමතිතුමා මෙතැන නැති වුණත්. ඒ නිසා මේ කාරණාවේදී කියන්නේ, අපේ සමුපකාර අමාත්‍ය, ඒ වාගේම මාර්ග සංවර්ධන අමාත්‍ය ලලිත් වනිගරත්න මැතිතුමාගේ අමාත්‍යාංශයෙන් හොඳ පැතිකඩ තිබෙනවා වාගේම, නරක පැතිකඩත් තිබෙනවාය කියන කාරණාව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ. ඉතින් එසේ ප්‍රකාශ කරමින් කොළඹ දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන ඉංජිනේරුතුමිය ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයට මගේ ප්‍රණාමය, ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කවදාවත් වෙන්නේ නැති කථාවක් අපේ හිටපු ඇමතිතුමා කළේ. ඇත්තටම නිලධාරීන්ව ඇගයීමකට ලක් කළා. මම ඉල්ලීමක් කරනවා. අපේ බෙත්මගේ ඇමතිතුමා කියපු කථාව, නිලධාරීන්ව උද්යෝගිමත් කරන්න තිබෙන හොඳ අවස්ථාවක්. එතුමාගේ කථාවේ පිටපතක් ඒ මාර්ග සංවර්ධන අධිකාරියට, ඒ අදාළ අංශයට යවන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම හොඳයි. ඒක ඒ ආකාරයෙන් සිදු වෙයි.

# පළාත් සභාවේ රැස්වීම
PROVINCIAL COUNCIL MEETING

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"අද දින (2017.08.22) විසිර යෑමෙන් අනතුරුව මෙම සභාව 2017.09.04 (සඳුදා) දින පෙ.ව. 9.30 ට රැස් විය යුතු අතර, 2017.09.05 (අඟහරුවාදා) දිනය සභා රැස්වීම නොපැවෙත්වෙන දිනයක් ලෙස සලකා ක්‍රියා කළ යුතුය."* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පළාත් සභාවේ කටයුතු
PROVINCIAL COUNCIL AFFAIRS

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය."* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"2017.08.09 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලද එකඟතාවයන්ට අනුව අද දින එනම්, 2017.08.22 වන දින සභා රැස්වීමේ පොදු කටයුතු විෂයයන්හි වැඩ කටයුතුවල ප්‍රමුඛතා අනුපිළිවෙළ න්‍යාය පත්‍රයේ විෂය අංක 2, 1 වන පරිදි විය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතුය."* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම හිතන්නේ, හදිසි කටයුත්තක් සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් එවන ලද 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳ ඉදිරි වැඩ කටයුතු සම්බන්ධව සාකච්ඡාවක් යනවා, ගරු සභාපතිතුමාගේ නිල කාමරයේදී. ඒ නිසා අපි පළමුවැනි එක මුලින්ම ඉදිරිපත් කරනවා. ඒ සඳහා ගරු ප්‍රධාන අමාත්‍යතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"බස්නාහිර පළාතේ 2017 අංක .... දරන පළාත් පාලන ආයතන බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රඥප්තිය දෙවන වර කියවීම සඳහා"* යෝජනා කරනවා.

ඒකේ පැහැදිලි කිරීමක් කරන්න ඕනෑද? ඕනෑ නැහැ නේ? හරි නේද?

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මුලින්ම 02 වන යෝජනාව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නැහැ. අපි මුලින්ම 01 අර ගත්තා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඇයි ඔබතුමාට මොකක් හරි ප්‍රශ්නයක්ද? කථා කරන්න එපා. මගේ මන්ත්‍රීවරු අරගෙන ගිහිල්ලා පැය 18 ක් බස් වල තියලා. මගේ යකා අවුස්සන්න එපා.

ඊළඟට බස්නාහිර පළාතේ 2017 අංක දරන බඩු උකස් ගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය මෙම සභාවට ඉදිරිපත් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒක තමයි මම සභාවේ එකඟතාවය ඇහුවේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමා, ගරු මහ ඇමැතිතුමා විසින් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

විනාඩියක් ඉන්න. ඒ සඳහා සභාවේ එකඟතාවය? ගැටළුවක් නැහැ නේ?

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

එකඟතාවය ගැන තමයි මම මේ කියන්නේ. දෙවැනි එක ගැන. ගරු මහ ඇමැතිතුමා විසින් අද දින දැන් පළාත් සභාවට ඉදිරිපත් කළා, 2015 අංක 01 දරන උකස් බඩු ප්‍රඥප්තිය සම්බන්ධයෙන් සංශෝධිත ප්‍රඥප්තියක්. මේ කාරණය ඉදිරිපත් කිරීමේ ප්‍රධානතම අරමුණ වන්නේ උකස් බඩු ප්‍රඥප්තියේ 20(2) වගන්තිය සංශෝධනය කිරීමයි. 20(2) වගන්තිය කියලා කියන්නේ උකස් ආයතනයකට යම් බඩුවක් උකස් කළාට පස්සේ, ඒ උකස් භාණ්ඩය උකස් ආයතනයේ තබා ගත යුතු කාලය පිළිබඳව තීරණය කරලා, මුල් ප්‍රඥප්තිය හදපු එක. මම මේ වගන්තිය ගැන කියන්න යන්නේ නැහැ. හැබැයි, මේ ප්‍රඥප්තිය හදලා තවම අවුරුද්දක් ගියේ නැහැ. මේක ක්‍රියාත්මක වෙලා. ප්‍රඥප්තිය හදලා ආණ්ඩුකාරතුමා අත්සන් කරලා අවුරුද්දක් ගියේ නැහැ. මේ උකස් ප්‍රඥප්තිය සම්බන්ධයෙන් එන දෙවැනි සංශෝධනය. මේක ප්‍රඥප්ති හා රීති කාරක සභාවේ මම ශ්‍රිනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමාටත් කථා කළා. එතුමා අර රැස්වීමේ ඉන්න නිසා එතුමාට අදහස් පළ කරන්න අවස්ථාව නැති වෙයි. මම මේ කාරණය සඳහන් කළා. මේ ප්‍රඥප්තිය හදලා අවුරුද්දක් යන්න කලින් දෙවැනි වරටත් සංශෝධනය වෙනවා නම් ඒ සංශෝධනය කරන්නේ මොන පදනමක් මතද කියන කාරණය පළමුව ප්‍රඥප්ති හා නීති කාරක සභාවට එවන්න ඕනෑ. එහෙම නැතිව සංශෝධන ප්‍රඥප්තියක් හදලා සභාවට දාපු එක වැරැදියි කියන එකයි මගේ අදහස. එහෙම පදනම මොකක්ද? එහෙමනම් අපෙන් අහන්න ඕනෑ. ඇයි ප්‍රඥප්ති කාරක සභාව මෙහෙම වගන්තියක් එකතු කළේ කියන කාරණාව. ඒ එකතු කරන්න හේතු කාරණා වුණු කාරණය, සංශෝධනය කළ යුත්තේ ඇයි? කියන කාරණය ප්‍රඥප්ති හා නීති කාරක සභාවට එවන්න තිබුණා. ප්‍රඥප්ති හා නීති කාරක සභාවට දාලා ප්‍රඥප්ති හා නීති කාරක සභාව මේ කාරණය සම්බන්ධයෙන් නැවත සාකච්ඡා කරලා මේක ඒ ආකාරයේ සංශෝධනයක් විධියට ආවා නම් තමයි හොඳ. නැත්නම් ප්‍රඥප්ති හා නීති කාරක සභාවක් තිබීමේ ඵලයක්, ප්‍රතිඵලයක් නැතිව යනවා. මේ වගන්තිය පිළිබඳව නැවත සටහන් අරගෙන බලන්න පුළුවන් නම් අරන් බලන්න. ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ නීති නිලධාරිතුමිය සහ ඒ ළඟ ලේඛිකාවගේ සටහන් අරගෙන බලන්න. ඉතා දීර්ඝ කාල පරාසයක් අරගෙන තිබුණු ප්‍රඥප්තිය, යෝජිත ප්‍රඥප්තිය, සම්මත ප්‍රඥප්තියට එන කොට ඉතා දීර්ඝ වශයෙන් කරුණු සාකච්ඡා කරලා තමයි මේ ප්‍රඥප්තියට මේ වගන්තිය එකතු කළේ. හැබැයි, දැන් අවුරුද්දක් යන්න කලින් මේක සංශෝධනය කරනවා. ඒකට හේතුවක්වත් ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ අපි දන්නෙත් නැහැ. මේ සභාව දන්නෙත් නැහැ. මෙහෙම හේතුවක් එන්නේ ඇයි කියන එක. ඒ නිසා පළමුව ප්‍රඥප්ති කාරක සභාවට එවන්න. ප්‍රඥප්ති හා නීති කාරක සභාව ඒ පදනම් වුණු කාරණය එවන්න. මේක උකස් බඩු ගන්න ඒ උකස් හිමියන් ලියුම් එවලා ඇති. ඒක අදාළ වන්නේ නැහැ. ඊට වඩා කාරණා තිබෙනවා, මේක ගන්න හේතු වුණු. මේකට කලින් ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා තේරුම් ගත්ත විධිය හරි. අපි පිළිගන්නවා. මේකේදී පළමුවැනි වර කියැව්වාට පස්සේ තමයි නැවත වතාවක් අපේ ප්‍රඥප්ති හා නීති කාරක සභාවට එවන්නේ. එතකොට පළමුවැනි වර තවම මේක කියැව්වේ නැහැ. දැන් කියවනවා. පළමුවැනි වර කියැව්වාට පස්සේ, ඒ සංශෝධන සඳහා ප්‍රඥප්ති හා නීති කාරක සභාවට මෙය එවනවා. ඒක නිසා ඒ අවස්ථාව එනතුරු පොඩ්ඩක් ඔබතුමා ඉන්න ඕනෑ. තේරුම් ගත්ත විධිය හොඳයි.

ගරු ප්‍රධාන අමාත්‍යතුමාට අවස්ථාව ලබා දෙනවා, යළිත් මේ ප්‍රඥප්ති පළමුවර කියැවීම සඳහා සභාවට ඉදිරිපත් කරන්න.

## 2017 අංක .... දරන බඩු උකස්ගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය : පළමුවර කියැවීම
PAWN BROKERS' (AMENDMENT) STATUTE NO … OF 2017 : FIRST READING

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, "*බස්නාහිර පළාතේ 2017 අංක ..... දරන බඩු උකස්ගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය*" පළමුවන වර කියැවීම සඳහා පළාත් සභාවට ඉදිරිපත් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ සම්බන්ධ පූර්විකාව ඉදිරිපත් කිරීමට ලේකම්තුමාට ආරාධනා කරනවා.

*[පූර්විකාව ]
[Preamble]*

**හේමන්ත සමරකෝන් - සභා ලේකම්වරයා**
Hemantha Samarakoon - Secretary of the Council

ගරු නියෝජ්‍ය සභාපතිතුමාගේ නියමය පරිදි ප්‍රඥප්තියේ පූර්විකාව ලෙසින් වූ,

*"2015 අංක 01 දරන බඩු උකස්ගන්නන්ගේ ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි"* යන පාඨය මම මෙම සභාව හමුවේ ප්‍රකාශ කරනවා. ස්තූතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අර අරුණ දීපාල් ගරු මන්ත්‍රීමාගේ අදහසත් එක්ක දැන් අපට පුළුවන් ප්‍රඥප්ති හා නීති කාරක සභාවට මේක ඉදිරිපත් කරන්න. ඒ අනුව ඒ අවශ්‍ය සංශෝධනය සලකා බලා දෙවැනි වර කියැවීම සඳහා නැවත සභාවට එවීම සඳහා ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට න්‍යාය පත්‍රානුකූලව තිබෙන්නේ පෞද්ගලික මන්ත්‍රී යෝජනා. ඒ අනුව පළමුවැනි යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා නිරෝෂා අතුකෝරල ගරු මන්ත්‍රීතුමියට අවස්ථාව ලබා දෙනවා.

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
PRIVATE MEMBERS MOTION:

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ළමා හා කාන්තා පොලිස් ස්ථාන පිහිටුවීම සඳහා යෝජනාව. ශ්‍රී ලංකාව තුළ ළමුන් හා කාන්තාවන්ට සිදුවන අපරාධ සීඝ්‍රයෙන් වැඩිවන කාලවකවානුවක නියෝජ්‍ය පොලිස්පතිවරයෙකුගේ සෘජු අධීක්ෂණය යටතේ පාලනය වන ළමා හා කාන්තා පොලිස් ස්ථාන සෑම දිස්ත්‍රික්කයකම පිහිටුවීම සඳහා වූ යෝජනාව.

*"ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 51% කට වැඩි ප්‍රමාණයක් කාන්තාවන් ය. එමෙන්ම ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ වැඩි බරක් උසුලන විදෙස්ගත ශ්‍රමිකයන් හරහා එන ධනයෙන් වැඩි පංගුව ගෙන එන්නේද කාන්තාවන්ය. තවද අතීත ශ්‍රී ලංකාව තුළ කාන්තාව මූලික කරගත් කාන්තාවටම වැඩි ගරුත්වයක් හිමිවන පරිද්දෙන් ගොඩ නැගුණු සාමාජ ආර්ථික වටපිටාවක් ද උරුම වී තිබුණි.*

*කරුණු එසේ වුවද වත්මන් ශ්‍රී ලංකාව තුළ කාන්තාවන්ට හා ළමුන්ට සිදුවන අපරාධ හා අඩත්තේට්ටම් ඉතා සීඝ්‍රයෙන් ඉහළ යමින් පවතී. කාන්තාවන් ඉලක්ක කර ගෙන සිදු වූ කොටකෙතන සමූහ ඝාතන සිදුවීම් ක්‍රියාදාමය ඊට ඇති ප්‍රබල උදාහරණයකි.*

***BBC** ලෝක සේවය මැතදී කළ පරීක්ෂණ වාර්තාවකින් හෙළි වූයේ ශ්‍රී ලංකාවේ පොදු ප්‍රවාහන සේවයේදී කාන්තාවන් 75% ක් විවිධ අතවර වලට ලක්වන බවයි. තවද සේවා ස්ථානවලදී කාන්තාවන් ලිංගික හිරිහැර වලට පවා කෲර ලෙස සැලකීම් වලට ලක්වන අවස්ථා ඉතා විශාල ප්‍රමාණයක් වාර්තා වී ඇත. ශ්‍රී ලංකාව තුළ දරුවන්ට සිදුවන අපරාධ සඳහා කොටදෙනියාවේ සේයා සදෙව්මිණි දැරියගේ ඝාතනය ආදී උදාහරණ ඕනෑ තරම් ඇත.*

*මෙහිදී ඇති වැදගත් කරුණක් නම් කාන්තාවන්ට හා ළමුන්ට සිදුවන අපරාධ ප්‍රමාණය ඉතා ඉහළ අගයක් ගත්තද ඒවා වාර්තාවන ප්‍රමාණය අඩු වීමත් එම වාර්තා වන සිද්ධීන්ට එරෙහිව පියවර ගන්නා අවස්ථාවන් ඊටත් වඩා අඩු අගයක් ගැනීමයි. මේ සඳහා ඇති මූලිකම කාරණාව වන්නේ නීතිය ක්‍රියාත්මක කිරීමේ ඇති ප්‍රමාදය හා පොලිස් ස්ථානවලදී පැමිණිලිකරුවන්ට (අතවරයට ලක් වූ කාන්තාවන්ට) සිදුවන හිරිහැරයි. කාන්තාවන්ට හා ළමුන්ට සිදුවන අපරාධ හා අඩත්තේට්ටම් පිළිබඳ පැමිණිල්ල ලියා ගැනීමේ සිට පිරිමි පොලිස් නිලධාරීන් අභිමුව කටයුතු කිරීමේ දී කාන්තාවන්ට නැවත නැවතත් සිදුවන හිරිහැරයන් පිළිබඳව අමුතුවෙන් ප්‍රකාශ කළ යුතු නැත.*

*මේ සඳහා පිළියමක් ලෙස නියෝජ්‍ය පොලිසිපතිවරයෙකුගේ සෘජු අධීක්ෂණය යටතේ පාලනය වන කාන්තා පොලිස් නිලධාරිනියන්ගෙන් සමන්විත පොලිස් ස්ථානයක් සෑම දිස්ත්‍රික්කයකම පිහිටුවන ලෙස මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයෙන් ඉල්ලයි."*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතුමියගේ යෝජනාව කාලෝචිත යෝජනාවක්. එය ස්ථිර කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සංශෝධනයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම යෝජනාවේ තිබෙනවා, **BBC** ලෝක වාර්තා සේවයේ පරීක්ෂණයක් අනුව ලංකාවේ 75% ක් කාන්තාවන් අතවරයට ලක් වෙනවා කියලා. මම එතුමියගෙන් ඇහුවා, මේක කොහෙන්ද ගත්තේ කියලා. එතුමිය කිව්වා, මේක අන්තර්ජාලයෙන් ගත්තේ කියලා. එතකොට ඇහුවා, කොයි කාලයෙන්ද කියලා. දැනට වසරකට ඉස්සෙල්ලා අන්තර් ජාලයෙන් කියලා කිව්වා. එක පැත්තකින් ගත්තාම මේ යහපාලන ආණ්ඩුව හොඳ නැහැ. මොකද, දැනට වසරකට ඉස්සෙල්ලා මෙහෙම දෙයක් ගියා නම් මේ යහපාලන ආණ්ඩුව ඇවිල්ලා අවුරුදු 2 ක් වෙනවා. ඒ 75% ත් -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

සංශෝධනය මොකක්ද කියන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

සංශෝධනය කියන්න යන්නේ. පැහැදිලි කරන්න එපැයි. එක පාර කියන්න පුළුවන්යැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒක නිසා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, සංශෝධනයට අවස්ථාව ලබා දෙන්න. ඔබතුමා සංශෝධනය කෙටියෙන් කියන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

**BBC** ලෝක සේවයේ 75% ක් කියන එක අයින් කරලා මේක කථා කරන්න කියන්න. ඒක ලංකාවට හොඳ නැහැ. ඒ නිසා නිරෝෂා අතුකෝරල ගරු මන්ත්‍රීතුමියගේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාවේ ඇති, *"**BBC** ලෝක සේවය මැතදී කළ පරීක්ෂණ වාර්තාවකින් හෙළි වූයේ ශ්‍රී ලංකාවේ පොදු ප්‍රවාහන සේවයේදී කාන්තාවන් 75% ක් විවිධ අතවර වලට ලක්වන බවයි."* යන වචන ඇතුළත් වගන්තිය ඉවත් කරමින් යෝජනාව සංශෝධනය විය යුතු බවට යෝජනා කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

හරි. ඒකට එකඟයි.

***ප්‍රශ්නය සංශෝධිතාකාරයෙන් සභාභිමුඛ කරන ලදී.***
*Question, as amended proposed*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. ඒ සංශෝධනයට යටත්ව ගරු මන්ත්‍රීතුමියට අවස්ථාව ලබා දෙනවා.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පොඩි සංශෝධනයක්. මම හිතන්නේ එතුමිය යෝජනා කරනවා පොලිසියක් කියන එක. පොලිස් කාර්යංශයක් කියන ලෙස සඳහන් විය යුතුයි.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

නැහැ. වෙනම පොලිසියක්. කාන්තාවන්ගෙන් සැදුම්ලත්. දිස්ත්‍රික්කයට එකක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමියට, විනාඩි 10 ක කාලයක් ලබා දෙනවා. ඔබතුමිය ඒ සම්බන්ධව දරන අදහස මොකක්ද කියලා කථා කරන්න.

[ පූ.භා.11.46 ]

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට කථා කරන්න අවසර දෙන්න. ලෝකය පවතින්නේ හිරු එළියෙන් සහ අම්මාගේ ආදරයෙන් කියලා ප්‍රසිද්ධ කියමනක් තිබෙනවා. ඒ වාගේම අහසට නිදහසක් නැහැ වාගේ අම්මාට නිදහසක් නැහැයි කියලා කියමනක් තිබෙනවා. විශේෂයෙන්ම අපේ රටේ මීට පෙර අම්මා මූලික කරගත් - අදටත් එහෙමයි. අම්මා මූලික කරගත් සමාජ වටපිටාවක් මේ රටේ තිබෙන්නේ. නමුත් මෑත කාලයක සිට කාන්තාවන්ට ඇතිවන හිරිහැර දවසින් දවස වැඩි වෙමින් පවතිනවා. වාර්තාවන් අනුව. මෙහිදී එක ගැටලුවක් ලෙස අපි දකින්නේ විශේෂයෙන්ම කාන්තාවන් එක්ක වැඩ කරන කාන්තාවක් විධියට. මට ඇතිවන ප්‍රශ්නත් එක්කයි මම මේ යෝජනාව ගේන්නේ. විශේෂයෙන් කාන්තාවන් ක්‍රම තුනකින් දූෂණයට ලක් වෙනවා. එකක් ශාරීරිකව. එකක් මානසිකව. එකක් දූෂණය කිරීම. ඉතින් මෙවැනි අවස්ථාවලදී කාන්තාවන් - හැම පොලිස් නිලධාරියෙක් ගැනම නොවෙයි අපි කියන්නේ. ගොඩක් අවස්ථාවන්වලදී පොලිස් ස්ථානවලට පැමිණිලි කරන්න ගිය හැම අවස්ථාවකම කාන්තාවන් ඊටත් වැඩියෙන් දූෂණයට ලක් වෙනවා. ඒ කියන්නේ, කාන්තාවන්ට පැමිණිල්ලක් කරන්න ගියාම විශාල හිරිහැරයක් ඇති වෙනවා. ඒ වාගේම කාන්තාවන්ගේ සමහර පැමිණිලි දූෂණයට, අපයෝජනයට ලක් වන දේවල් ගැන පැමිණිලි කරන්න පොලිස් ස්ථානවලට ගියාම ඉතාම අපහසුතාවයක් ඇති වෙනවා. ඉතින් අද තිබෙන ප්‍රධාන ගැටලුවලට මේ කාන්තාවන් දූෂණය කිරීම අසීමිත විධියට වැඩි වෙමින් පවතින නිසා මේ පැමිණිලි කරන අයට අමතරව පැමිණිලි නොකරන විශාල පිරිසක් ඉන්නවා. මේ වන විට වසරකට දූෂණ, අපයෝජන, අපචාර 15,000 කට අධික ප්‍රමාණයක් සම්බන්ධයෙන් පැමිණිලි වෙනවා. ඒ වාගේම ප්‍රමාණයක් පැමිණිලි නොවෙනවා. වෙන්නේ නැහැ. මොකද, පොලිස් ස්ථානවලට පැමිණිලි කරන්න, එන්න කැමැති නැහැ. ඒ නිසා මේ ප්‍රශ්නවලට විසඳුමක් විධියටයි මම මේ යෝජනාව කාන්තාවක් හැටියට ගෙන එන්නේ.

ඉතින් ඒ නිසා මම මේ සභාවෙන් සහ සියලු දෙනාගෙන්ම මේකට සහයෝගයක් ඉල්ලනවා. මම හිතන්නේ මේ හැම කෙනෙකුටම අම්මා කෙනෙක්, නංගි කෙනෙක්, සහෝදරියක්, කාන්තාවන් ඉන්නවා. ඉතින් මේ හැම කෙනෙකුගේම ආරක්ෂාව සඳහා ගැහැණියක් පිරිමියෙකුට ගිහිල්ලා යම් දෙයක් පවසන කොට ඒකේ පොඩි පැකිලීමක් තිබෙනවා. ඒ නිසා ගැහැණියක් ගැහැණියකට තමන්ට වෙන අසාධාරණය ගැන විවෘතව කථා කරන්න පුළුවන්. මොකද මම ඒක අත්දැකීමෙන්ම දන්නවා.

ඒ වාගේම අපේ රටේ ප්‍රධාන ආදායම් තුනම ගේන්නේ කාන්තාවෝ. වැඩ කරන පිරිස විධියට හැඳින්වෙන්නේ කාන්තාවෝ. මේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ, ඕනෑම රජයේ ආයතනයකට ගියොත් වැඩිපුර ඉන්නේ කාන්තාවෝ. හැබැයි, අපට තිබෙන ප්‍රශ්නය මේ රටේ තීන්දු තීරණ ගන්න තැන්වල කාන්තාවෝ ඉතාමත් අඩුයි. ඒ වාගේම පොලීසියේ වෙනම කාන්තා කාර්යංශයක් තිබෙන බව ඇත්ත. නමුත් එතැන තිබෙන්නේ පොලිස් ස්ථානාධිපති පිරිමි කෙනෙක් වීම. අපි කැමැතියි, කාන්තාවන්ටම තීරණය ගන්න පුළුවන් ස්ථානයක් හැදීම. අද අපේ රටෙත් ප්‍රධාන දේශපාලන පක්ෂවලත්, හැම එකකම ප්‍රධාන තනතුරුවල කාන්තාවෝ නැහැ. කාන්තාවෝ වැඩ කරන පිරිසක් බවට විතරයි පත් වෙලා තිබෙන්නේ. ඉතින් ඒ නිසා කාන්තාවෝ තීන්දු තීරණ ගන්න කොට මීට වැඩිය යහපත් වෙයි කියලා මම විශ්වාස කරන නිසයි මම මෙවැනි මෙවැනි යෝජනාවක් ගෙන එන්නේ. ඉතින් ඒ නිසා ඒකට ඔබතුමන්ලා සියලු දෙනා අදහස් දක්වන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමිය, බොහොමත්ම ස්තුතියි. මීළඟට ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමාට විනාඩි 07 ක කාලයක් ලබා දෙනවා.

[ පූ.භා.11.50 ]

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම මෙතුමිය විසින් ගෙනාපු යෝජනාව නම් නරකම නැහැ. නමුත් ඔය කියන සංඛ්‍යා ලේඛන එක්ක නම් හිතුවාම අපට හරි විහිලුවක් බවට පත්වෙලා තිබෙන්නේ. එතුමිය කථාවේදී කියන විධියට මට පෙනෙන්නේ, මේ පොදු ප්‍රවාහන සේවය කිව්වාට වැඩියෙන් දූෂණය වන්නේ, පොලිසි ගියාම කියලයි. ඒ එතුමිය කියන

විධියට මට හැඟීම තිබෙන්නේ එහෙමයි. ඇත්තටම කාන්තාව ගැන කථා කරන එක නම් නරක නැහැ. හැබැයි, මම හිතන්නේ කාන්තාවන්ට වැඩිය අසාධාරණයට ලක් වෙලා තිබෙන්නේ දැන් පිරිමි. කුමන ආයතනයට ගියත් කාන්තාවන්ට හිමි කොයි තැනද නැති වෙලා තිබෙන්නේ? දේශපාලනයට ගියත් කාන්තාවන්ට ඒ අවශ්‍ය තැන තිබෙනවා. තමන්ගේ දක්ෂතාවය අනුව පොලිස්පති වෙන්නත් මම හිතන්නේ කාන්තාවට බැරිකමක් නැහැ. ASP ලා, DIG ලා ඉන්නවා. මම හිතන්නේ ඒක දක්ෂතාවයත් එක්ක යන වැඩ පිළිවෙළක්. මේකට රටේ නීතියක් තිබෙනවා නම්, මම හිතන්නේ යම්කිසි වෙලාවක කාන්තාවකට හිංසාවක් වෙනවා නම්, ඒ රටේ නීතිය හරියාකාරව ක්‍රියාත්මක නොවෙනවා කියලයි මේ යෝජනාව තුළ මම දකින්නේ. පොදු ප්‍රවාහන සේවයේ කාන්තාවක් යනවා නම් ඒකට යම්කිසි නීත්‍යානුකූලව අසාධාරණයක් වෙනවා නම්, හිංසාවක් වුණා නම් ඒකට නීතිය ක්‍රියාත්මක කරලා වැඩ කටයුතු කළා නම් මම හිතන්නේ, ඒක අඩු කරගන්න පුළුවන්. නැතුව තවත් පොලිසියක් දාලා, වෙනත් ආයතනයක් මගින් කරනවාට වඩා මම දකින්නේ, වර්තමානයේ මේ රටේ නීතිය සාධාරණීකරණය වෙලා නැහැ. නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැති නිසා තමයි මෙවැනි යෝජනා ගෙනෙන්න වෙලා තිබෙන්නේ. මොකද අපි දන්නවා, සාමාන්‍ය පොදු ප්‍රවාහන සේවයේ බස් එකක යන කොට දුම් බොන්න බැහැයි කියලා තිබෙනවා. දඩය මෙච්චරයි කියලා තිබෙනවා. එහෙමනම් අර කාරණයත් තිබෙනවා. අපි දන්නවා, අපේ ගම්වල තිබෙන පොලිසිවල, නගරවල තිබෙන පොලිසිවල කාන්තා අංශයක් වෙනම තිබෙනවා. ඒ කාන්තාවන් වෙනුවෙන් ඇහුම්කන් දෙන්න, සාමාන්‍යයෙන් කාන්තාවක් අත්අඩංගුවට ගන්න පරීක්ෂණයකට යනවා නම් අනිවාර්යයෙන් පොලිස් කාන්තාවක් යන්නම වෙනවා. එහෙම නීතියක් තිබෙනවා. කාන්තාවක් සිරගත වෙලා ඉන්නවා නම්, පොලිස් හිර කුඩුවේ අනිවාර්යෙන් කාන්තාවක් එතැන ඉන්න ඕනෑ. පොලිසිය නැතත් වෙනම කාන්තාවක් හරි එතැන ඉන්නවා අපි දකිනවා.

හැබැයි මම විශ්වාස කරන්නේ, මීට වැඩිය අපි කාන්තාවන් වෙනුවෙන් කථා කරන්න ඕනෑ. අද බහුතරයක් කාන්තාවන් තමයි මේ පෙර පාසල් කරන්නේ. ඒ පෙර පාසල් කරන අයට මේ රජයෙන් මොනවද දීලා තිබෙන්නේ? පෙර පාසල් 99% ක්ම කරන්නේ කාන්තාවෝ. ඒ පෙර පාසල් පාලිකාතුමියන්ලා. ඒ වාගේම විදේශගත වෙලා ඉන්න අපේ කාන්තාවෝ මොනතරම් දුක් විඳිනවාද? ඒ අය ගැන කථා කරන්නේ කවුද? ඒ අය ඇණ ගහගෙන, පිටවල් පුච්චාගෙන, ඔළු පලාගෙන, අර උඩ තට්ටුවලින් පැන්නයි කියලා තල්ලු කරලා, ඇතුළේ තිබෙන හදවත අරගෙන, ඒ අයගේ අවයව අරගෙන. ඒ අය ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ. ඒකයි කථා කරන්න ඕනෑ. ඒ අය අපේ රටට විදේශ විනිමය ගේනවා. ඒ විදේශ විනිමය ගේනවා විතරක් නොවෙයි. දුක් විඳින වැඩිම කොටස බවට පත් වෙලා තිබෙන්නේ ඒ අය. ඇත්තටම අන්න ඒක ගැන තමයි අපි ඇත්තටම කථා කළ යුත්තේ. මෙතුමිය කියන සංඛ්‍යා ලේඛන එක්ක බැලුවොත් බස් එකක 100 ක් යනවා නම් 75 ක්ම දූෂණය වෙනවා. හැබැයි, එතකොට බස් එකේ 100 නම් ඉතිරි 25 තමයි පිරිමි වෙන්නේ. එතකොට බැලුවොත් එහෙම එක පිරිමියෙක් තුන් දෙනා ගණනේ දූෂණය කරන්න ඕනෑ. මේ සංඛ්‍යා ලේඛන බැලුවොත් එහෙම. එක පිරිමියෙක් බස් එකක යන ගැහැණු තුන් දෙනෙක් දූෂණය කරන්න ඕනෑ, මේ සංඛ්‍යා ලේඛනත් එක්ක. ඇත්තටම අපේ රට හැටියට කාගේවත් නිර්ණායකවලට අපි කටයුතු කරන්න ඕනෑ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒක අයින් කළා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

අයින් කළේ මේකට ඇවිල්ලා. එහෙම නම් මේක දාන කොට නොදා ඉන්න ඕනෑ. ගණන් හදලා. අපේ රටේ අභිමානයක් තිබෙනවා. අපට සංස්කෘතියක් තිබෙනවා. අපට ඉතිහාසයක් තිබෙනවා. අපේ ගම්වල ඉස්සර රෙද්දයි හැට්ටෙයි ඇන්දාම කළගෙඩිය ඉනේ තියාගෙන එන ළඳ කොච්චර ලස්සනද? නමුත් කවදාවක්වත් ඒ අයට ඒ ආකාරයෙන් කටයුතු කළේ නැහැ. හැබැයි, ඔය කියන දේවල් සාමාන්‍යයෙන් සිද්ධ නොවෙනවා නොවෙයි. වෙන්න ඇති. හැබැයි ඒකට භාගයක් වගකීම ඒ කාන්තාවටත් දෙන්න ඕනෑ. බඩ පේන්න අඳිනවා. බුරිය පේන්න අඳිනවා. පිරිමින්ගේ ඇඟ කුපිත කරන විධියට, ඇඟ පසහ එළියට එන විධියට අඳින අයට දඬුවමක් දෙන්නේ කවුද කියන එකයි මම අහන්නේ. එහෙමත්

[ගරු ලලිත් වර්ණකුමාර]

නැත්තේ නැහැ නේ? එහෙමත් තිබෙනවා. ගුරුවරිය වුණත් ක්‍රමයක් තිබෙනවා.

ඇත්තටම උදාරහණයකට බැලුවොත්, අපි බස්වල යන මිනිස්සු. අර අතේ ඉන්න දරුවාට පියයුරු අරගෙන කිරි දෙනවා. කිසි කෙනෙකුට කිසි හැඟීමක් එනවාද? නැහැ. කිසිම හැඟීමක් එන්නේ නැහැ. ඒක අපේ සංස්කෘතියේ එක අංගයක්. දරුවාට කිරි දෙන කොට මොන දෙයක්වත් අපට එහෙම ඇති වෙන්නේ නැහැ. හැබැයි එහෙම නොවෙයි. බස් එකේ වාඩි වෙලා බිම බලන කොට පේන දේවල් එක්ක ඊට වැඩිය හැඟීම් එනවා. ඉතින් ඒවා නැති වෙන්න ඕනෑ. ඒ ශීලාචාරකම තිබෙනවා නම් මීට වැඩිය ගොඩක් වෙනස්.

විශේෂයෙන්ම දෙම්පියන් දරුවන්ට අන්දාගෙන යන්නේ මොනවාද? දරුවාට අන්දන දේ තුළ ඒ දරුවාගේ අනාගතය කොයි ආකාරයද කියලා අපට හිතන්න පුළුවන්. ඇත්තටම මුල ඉඳලාම හුරුව තිබිය යුතුයි. අපේ ඉතිහාසයත් එක්ක, අපේ සංස්කෘතියත් එක්ක අපි ඔයිට වැඩිය හරි ලස්සනට ජීවත් වුණු කොටසක්. ඇත්තටම ඒ කාලයේ මේ ප්‍රශ්න තිබුණේ නැහැ. තාක්ෂණයත් එක්ක දියුණු වෙන කොට, රටක් හැටියට දියුණු වෙන කොට මේවා එනවා. මේවා මැඩ පවත්වාගන්න අපිම දැනගන්න ඕනෑ. එතුමිය ඇත්තටම රට රටවල්වල ඇවිදලා, ජාත්‍යන්තර රටවල්වල ගිහිල්ලා ඇත්තටම හැම තැනම ඒ වටපිටාව දන්න කාන්තාවක් හැටියට පිටරටවල්වලත් අපේ රටවල්වලත් ගත්තාම වෙනසක් පේනවා ඇති. මීට වැඩිය ජනගහනය 100% කින් විතර වැඩි රටවල් තිබෙනවා. සමහර රටවල කාන්තාවන්ට රෑ 12 ට 1.00 ට වුණත් පාරේ බැහැලා යන්න පුළුවන්කම තිබෙනවා. එහෙම ක්‍රමවේදයක් අපි හැදිය යුතුයි. මම ඒකට ප්‍රධානයෙන්ම ඉල්ලා සිටින්නේ, කාන්තාවන් වෙනුවෙන් රටේ නීතියක් නැතිව නොවෙයි. මේ යහපාලන ආණ්ඩුවෙන් ඒ නීතිය හරියාකාරව ක්‍රියාත්මක කරනවා නම් මේ තරම් ප්‍රශ්න එන්නේ නැහැයි කියන එකයි මම දකින්නේ. ඒ නිසා එතැනට අපි යොමු කරමු. එතැනින් එහාට වෙනත් පොලිසි හදනවා කියන එක මම විශ්වාස කරන්නේ නැහැ. එහෙමනම් තව කෙනෙකුට තව අසාධාරණයක් වෙනවා නම් තව පොලිසියක් හදන්න වෙයි. තව පැත්තක තව පොලිසියක් හදන්න වෙයි. දැන් මහින්ද රාජපක්ෂ මැතිතුමන්ලාගේ පවුලේ නමට දැන් උසාවි හදන්න යන්නේ. අන්න ඒ වාගේ යෝජනාවක් තමයි මේක. ඒක ප්‍රායෝගිකද? නැද්ද? කියන එක රටේ ජනතාව තේරුම් ගනියි. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, බොහොමත්ම ස්තුතියි. ඊළඟට සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාට විනාඩි 07 ක කාලයක් ලබා දෙනවා.

[ පූ.භා.11.57 ]

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම නිරෝෂා අතුකෝරල ගරු මන්ත්‍රීතුමියගේ මෙම යෝජනාවේ හරය වෙන්නේ, සමාජයක් ඉස්සරහා පොදුවේ කාන්තාවකගේ ඇතිවන සුරක්ෂිතතාවය. ඇත්ත වශයෙන්ම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙහිදී අපි හුදෙක් කාන්තා ප්‍රශ්නය පමණක් හුදකලා කරලා ගන්න ටිකක් අමාරුයි. විශේෂයෙන්ම එතුමිය මේ සඳහන් කරලා තිබෙන විධියටම සේයා සඳෙව්මි දැරිවියගේ ඝාතනය. දූෂණයට ලක් කොට ඒ දැරිවිය ඝාතනය වුණේ කාගෙන්ද? එක්තරා සල්ලාලයෙකු අතින් මේ දැරිය දූෂණයට ලක් වුණා. එතකොට මේ සිද්ධිය වෙන්නේ පොදු සමාජයේ කුලකයක් ලෙස. පොදු සමාජයේ දූෂණයක් තිබෙනවා. සමස්ත සමාජයේ දූෂණයක් තිබෙනවා. ඒ සමස්ත සමාජයේ දූෂණයේ ක්‍රියාවලියක් හැටියට සඳෙව්මි දැරිය දූෂණයට ලක් වුණා. කිළිනොච්චියේ විද්‍යා දැරිවිය. එතකොට ඇය පාසල් යමින් සිටියා. ඇය පාසල් යමින් සිටින අතරතුර සල්ලාලයන්ට ගොදුරු වුණා. ඒ සල්ලාලයෝ කියලා කියන්නේ කවුද? සමාජය. සමාජයක් විධියට අද සල්ලාල සමාජයක් බිහි වෙමින් තිබෙනවා. ඒ සල්ලාල සමාජයේ ගොදුරක් බවට විද්‍යා දැරිවියව පත් වෙනවා. එතකොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි බලන්න ඕනෑ, සමස්ත සමාජයේ අර්බුදය ගැන. පොදු සමාජයේ දූෂණයක් තිබෙන කොට ඒ පොදු සමාජයේ දූෂණයෙන් කාන්තාවකට පමණක් විශේෂයෙන් වූ නීති සෑදීමෙන් අපට ඔවුන්ගේ සුරක්ෂිතතාවයක් ඇති කරගන්න පුළුවන්ද කියන කාරණය පිළිබඳව අපේ අවධානය යොමු වෙන්න ඕනෑ. සමස්ත සමාජයේ සුරක්ෂිත තාවයට ආණ්ඩුවක් විධියට, රජයක්

විධියට කටයුතු කළ යුතු වන්නේ සමස්ත සමාජයට ශීලාචාර සමාජයක් බවට පරිවර්තනය කිරීමේ කටයුත්තයි.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට පුළුවන් නම් ගරු මන්ත්‍රීතුමියගේ යෝජනාව අනුව යමක් අවම කරගන්න, ඒකට අපි සහයෝගය දෙමු. කිසි ප්‍රශ්නයක් නැහැ. මම හිතන්නේ පොලිස් හා කාන්තා ළමා කාර්යංශය කියලා එකක් දැනට තිබෙනවා. ඊට අමතරව ඒක සෑහෙන්නේ නැති අවස්ථා ඕනෑ තරම් උදාහරණ මගින් පේනවා. ඇතැම් අත්අඩංගුවට ගැනීම් සිද්ධ වෙනවා. ඒ අත්අඩංගුවට ගැනීම් සිද්ධ වෙද්දී කාන්තාවන් අත්අඩංගුවට ගැනීම් සිද්ධ වෙනවා. හැබැයි, කාන්තා නිලධාරිනියක් එන්නේ නැහැ .පිරිමි නිලධාරීන් තමයි ඇවිල්ලා ජීප් රථයෙන් අර කාන්තාව දාගෙන යන්නේ. ඇතැම් උද්ඝෝෂණවලදී අපි දැකලා තිබෙනවා. සරසවි ශිෂ්‍යයන්ගේ උද්ඝෝෂණවලදී පවා කාන්තා පොලිසියක් නැතිව - වරාය පොලිසියේ සිටියා එක්තරා වෛද්‍ය ශිෂ්‍යාවක්. තනිකර පිරිමි නිලධාරීන් තමයි පසුගිය උද්ඝෝෂණයේදී ඒ වෛද්‍ය ශිෂ්‍යයාව අරගෙන ගියේ. එතකොට මහේස්ත්‍රාත්වරයා ප්‍රශ්න කළා. ඇයි කාන්තා පොලිසියෙන් සිටියේ නැද්ද කියලා. ඉතින් මේක නිකන් ආධුනික තත්ත්වයක් නොවෙයි. මෙච්චර අත්දැකීම් සහිත සමාජයක යම් අත්අඩංගුවකට ගැනීමකදී කාන්තා පොලිස් නිලධාරීන්ගේ මැදිහත්වීම අත්‍යවශ්‍යයි කියන සාධකය තහවුරු වෙලා තිබෙන්නේ.

ඒ කාරණාත් එක්ක ගත්තාට පස්සේ අපට එක දෙයක් පේනවා. විශේෂයෙන්ම අර ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමාගේ අවධානයට ලක් වුණා වාගේ විශේෂයෙන් පොදුවේ කාන්තාවකට ලක් වී තිබෙන, මුහුණ දීමට ඇති වී තිබෙන තත්ත්වය. විශේෂයෙන් විදේශගත කාන්තාවන්. විදේශගත කාන්තාවන් ඉතාමත්ම අමාරු තත්ත්වයකට වැටිලා තිබෙන්නේ. ඒ අයට රක්ෂණයක් ගත්තත්, ඒ අය සම්බන්ධයෙන් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නීතීන් මොනතරම් තිබුණත්, හැබැයි ඇයගේ මළකඳ අපට පෙට්ටියකින් මෙහෙට ගෙනැල්ලා දෙනවා. ඇතැම් අවස්ථාවල මළකඳ ගෙන්නා ගන්න හැකියාවක් නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ අය තට්ටු නිවාසවලින් පනිනවා. ඒ අයට ඇණ ගහනවා. ඒ අය විවිධ වස පානය කරනවා. හැබැයි, අපට මේ විදේශ විනිමය සොයන්න ගිහිල්ලා තමයි මේ සියල්ලටම ගොදුරු වෙලා තිබෙන්නේ. ඉතින් ගරු සභාපතිතුමනි, අපි සමාජයක් විධියට මෙන්න මේ ගැන හිතන්න ඕනෑ. අද කාන්තාවට අත් වී ඇති ඉරණම. මේ තිබෙන සමාජ අර්බුදය විසින් පවුලේ පවතින අර්බුදය විසින් ඇයට බල කරලා තිබෙනවා, විදේශයේ ගිහිල්ලා කඹුරන්න. එතකොට මේ විදෙස් රටවල කැඹීරීම කියන කාරණය ගත්තාට පස්සේ ඉතාමත්ම දරුණු තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මෙහෙන් යන කාන්තාව මිනී පෙට්ටියෙන් ගෙදර එනවා. එතකොට මේක සමස්ත සමාජයේ අර්බුදයක්. සමස්ත සමාජයේ ඛේදවාචකයක්. ඒක නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි කියන්නේ හැකි නම් මේ කාන්තාවන් සඳහා විශේෂ වූ එකක් තිබෙනවා නම් ඒකට වැඩි අවධානයක් යොමු වෙයි. දැන් පොලිසියට පුළුවන්. පොලිස් ආඥා පනත යටතේ යම් යම් පොලිස් කොට්ඨාශ බිහි කරන්න. ඒක ගැන වාදයක් නැහැ. අද සමාජයේ ලොකු වාදයක් ඇති කරන් තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කිසියම් පොලිස් කොට්ඨාශයක් ඇති කළාට පස්සේ පොලිස්පතිතුමාට පොලිස් ආඥා පනත යටතේ පොලිස් කොට්ඨාශ පිහිටුවීමේ බලතල තිබෙනවා. එතකොට ඇතැම් අය ඒ අර්ථ දක්වනවා, ආ.......FCID එකක් ආරම්භ කරලා තිබෙනවා. ඒක මේ වෙනත් ප්‍රශ්නයක්. අපි කියන්නේ මෙහෙමයි. පටු පෞද්ගලික දේශපාලන අභිලාෂයන්වලට පොලිස් කොට්ඨාශ බිහි කරන්න එපා. ඒක ඇත්ත. නමුත් යම් අපරාධයක් මර්දනය කිරීමේ උවමනාවක් තිබෙනවා නම් පොලිස් කොට්ඨාශයක් බිහි කිරීමේ හැකියාව තිබෙනවා.

අද ඇවිල්ලා තිබෙන ලොකුම විවාදය තමයි විශේෂ වූ අධිකරණය. මම කියන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හරි විහිළුවක්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තිබෙනවා. ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම් යම් රීතීන්ට යටත්ව අපි දන්නවා, අග්‍රවිනිශ්චයකාරතුමාට, නීතිපතිවරයාට ඔවුන්ගේ එකඟත්වයෙන් යම් යම් අධිකරණයන් නිර්මාණය කිරීමේ හැකියාව තිබෙනවා. ඒ කියන්නේ මහාධිකරණයක්, ඒකේ බලතල සහිත නැති මහාධිකරණයක් නිර්මාණය කිරීමේ හැකියාවක් නැහැ. දැන් තිබෙන මහාධිකරණ ක්‍රමයේම තවත් ඒකකයක් පිහිටුවන්න පුළුවන්. දැන් වැලිකඩ සිරමැදිරිය තුළ හෙරෝයින් පානය කරන්නන් සම්බන්ධයෙන් වෙනම අධිකරණයක් පිහිටෙව්වා. ඒකට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළේ නැහැ. නමුත් අපට පුළුවන් නම් ඇත්තටම මුදල් විශුද්ධි කරන පනතේ තිබෙන නඩුවලට සම්බන්ධයෙන් වෙනම මහාධිකරණයක්

[ගරු සුනිල් වටගල]

පිහිටුවන්න. මම කියන්නේ ඒකට කමක් නැහැ. එතකොට මේක දැන් වාදයක් පටලවාගෙන තිබෙනවා. එක එක්කෙනාව දඬයම් කරන්න තමයි මේ වෙනම මහධිකරණයක් පිහිටුවන්නේ කියලා. ඒ සංවාදය අනවශ්‍ය සංවාදයක්. ඕනෑ නම් අග්‍රවිනිශ්චයකාරවරයාට, නිතිපතිවරයාටත් එහෙම හැකියාවක් තිබෙනවා. ඒ වාගේම හැකියාවක් පොලිස්පතිවරයාටත් තිබෙනවා. කාන්තාවන්ට යම් ව්‍යසනකාරී තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා නම්, කාන්තා අපරාධ වැඩි බව තිබෙනවා නම් ඒ සම්බන්ධයෙන් වෙනම කොට්ඨාශයක් ඇති කරගන්න. ඉතින් අපි මේ කියන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක හුදෙක් කාන්තාවගේම ප්‍රශ්නයක් නොවෙයි. සේයා සඳෙව්මි ගොදුරු වුණේ සල්ලාලයන්ට. විද්‍යා දැරිවිය ගොදුරු වුණේ සල්ලාලයන්ට. ඒ සල්ලාලයන් බිහි කළේ මේ සමාජය. එතකොට මේ සමාජය තමයි මේ සියල්ලටම වගකිව යුත්තේ. ඒක නිසා පවතින ආණ්ඩුවල වගකීමක් බවට පත් වෙනවා. සමාජයේ සංවිධානාත්මක අපරාධ වාගේම කාන්තාවන් සම්බන්ධයෙන් සිදුවන අපරාධ මර්දනය කරලා ඒක යහපත් ශීලාචාර සමාජයක් රටට දායද කරන්න.

ඒක නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවසාන වශයෙන් එහා පැත්තේ කුණු ගොඩ තිබෙනවා කියලා, එහා පැත්තේ වත්තේ තමයි ඒක තිබෙන්නේ කියලා අපේ වත්ත හොඳ වෙන්නේ නැහැ. ඒක නිසා එහා පැත්තේ වත්තේ කුණු ගොඩ තිබෙන කොට ඒකේ ඩෙංගු මදුරුවා බෝ වෙලා අපට හිමින් සැරේ ඇවිල්ලා විදිනවා. ඒක නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාන්තාව විතරක් හොඳ වෙන්න ගත්තාට, මේ සමාජය කුණු වෙලා නම් කාන්තාවට කවදාවක්වත් පැවැත්මක් නැහැ. ඒක නිසා මේකේ තිබෙන අර්බුදය, සමාජයේ තිබෙන අර්බුදයක්. මේ සමස්ත සමාජය විධියටම හොඳ සමාජයක් බවට පත් වුණු දාට ඔය කියන වෙනම කාන්තා පොලීසි අපට අවශ්‍ය වෙන එකක් නැහැ. මේ තිබෙන පොලිසියත් විසුරුවා දාන්න පුළුවන්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, බොහොමත්ම ස්තුතියි. මීළඟට කීර්ති කාරිවසම් ගරු මන්ත්‍රීතුමාට විනාඩි 07 ක කාලයක් ලබා දෙනවා.

[ අ.භා.12.05 ]

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නිරෝෂා අතුකෝරල ගරු මන්ත්‍රීතුමිය කාන්තාවන්ගේ ආරක්ෂාව වෙනුවෙන් ඉදිරිපත් කරපු යෝජනාව පිළිබඳව අදහස් කීපයක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. මූලික වශයෙන්ම ඇය සඳහන් කරපු ආකාරයට අද අපේ රටේ ආර්ථිකය සම්බන්ධයෙන් කාන්තාවන්ගෙන් ලැබෙන දායකත්වය අති විශාලයි කියන එක අපට පිළිගන්න වෙනවා. ශ්‍රමිකයින් හැටියට විදේශ රටවලට ගිහිල්ලා රැකියාවේ යෙදෙන උදවිය, ඒ වාගේම ඇඟලුම් කාර්මාන්තය වැනි ක්ෂේත්‍රයන්හි විශාල වැඩි පිරිසක් සේවය කරමින් රටේ ප්‍රධාන ආර්ථික මරමස්ථානයන් තුළින් ඒ අය රටට ලබා දෙන ආර්ථික ශක්තිය ගෞරවයෙන් සඳහන් කරන්න ඕනෑය කියන එක විශේෂයෙන්ම මම සඳහන් කරන්න ඕනෑ. ඒ වාගේම අද පවුල් ඒකකයක් හැටියට ගත්තත් පවුල් ඒකකය වඩා ශක්තිමත් කරලා, ඒ වාගේම දරුවන්ගේ අධ්‍යාපනය පැත්තෙන් ගත්තත්, දරුවන්ගේ අධ්‍යාපනය වඩාත් හොඳ තැනකට ගෙන එන්න මෙවැනි කටයුතුවලදී කාන්තාව ලබාදෙන දායකත්වය වෙනදාට වඩා විශාල වශයෙන් වැදගත් වෙලා තිබෙනවා, වැඩි වෙලා තිබෙනවා කියන කාරණාව සඳහන් කරන්න ඕනෑ. අපි ගමක ස්වේච්ඡා සංවිධානයක රැස්වීමක් දිහා බැලුවත්, මේ ස්වේච්ඡා සංවිධානයක පැවැත්වෙන රැස්වීම්වලදී 80% කට වැඩි ප්‍රමාණයක් සහභාගි වන්නේ කාන්තාවන්.

ඒ නිසා කාන්තාවන්ගේ අයිතිය පිළිබඳව, කාන්තාවගේ ආරක්ෂාව පිළිබඳව, ඒ වාගේම කාන්තාවගේ දියුණුව පිළිබඳව රජයක් හැටියට වාගේම සමාජයක් හැටියට අපි කාටත් වගකීමක් තිබෙනවා කියන කාරණාව සැලකිල්ලට අරගෙන කටයුතු කරන්න ඕනෑය කියලා අපි විශේෂයෙන්ම විශ්වාස කරනවා. මේ සඳහා ඇය යෝජනා කරන පරිදි මේ කටයුත්ත තනිකර පොලීසියක් පිහිටුවීමෙන් හෝ ඒ වෙනුවෙන් වෙනත් නීතියක් ගෙන ඒමෙන් පමණක් මේක කරන්න පුළුවන්ද කියන ප්‍රශ්නය මතු වෙනවා කියන කාරණය විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ.

ලෝකයේ දියුණු රටවල් දිහා බැලුවත්, බටහිර රටක් දිහා බැලුවත් කාන්තාවන්ට තිබෙන ආරක්ෂාව සහ සුරක්ෂිතතාවය පිළිබඳ තත්ත්වයේදී අපට වැඩිය ඉහළ

තැනක ඒ රටවල් ඉන්නවා. ඒ රටවල්වල ඒ කාන්තාවන්ට තිබෙන ස්වාධීනත්වය සහ ඔවුන්ගේ ආරක්ෂාව අපට වැඩිය ඉහළ තැනකයි තියෙන්නේ. අපේ රට දිහා ගත්තාම අපේ රටේ තිබෙන දත්තයන් දිහා බැලුවාම - විශේෂයෙන්ම අපේ ළමා පරපුරේ කාන්තාවන්, ඒ වාගේම තරුණ කාන්තාවන් බොහෝ වෙලාවන්වලට වැඩිපුරම අපයෝජනයට ලක් වෙලා තිබෙන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බාහිර සමාජයෙන් නොවෙයි. අපේ රටේ අපරාධ පිළිබඳ දත්ත ගත්තාම වැඩිපුර ඒ අය අපයෝජනයට ලක් වෙන්නේ එක්කෝ තමන්ගේ පෙම්වතා අතින්. එහෙමත් නැත්නම් තමන්ගේ පවුලේ අය අතින්. එහෙමත් නැත්නම් ඉතාම කිට්ටුවෙන් ආශ්‍රය කරන අය අතරින් තමයි මේ සිද්ධීන් බොහෝ වෙලාවට වාර්තා වෙලා තිබෙන්නේ. ඉතින් මේක සමාජයේ කොටසක ගැටලුවක් විධියට තමයි අපට දකින්න තිබෙන්නේ. ඒක නිසා මේක නීතියට පමණක් සීමා කරන්න පුළුවන් කාරණාවක් වෙනවා කියලා අපි හිතන්නේ නැහැ. අර කියපු දියුණු රටක අද කාන්තාව වඩාත් සුරක්ෂිතතාවයෙන් ජීවත්වන රටක් දිහා බැලුවොත් ඒ රටවල්වල අපි දැකලා නැහැ කාන්තාවන් වෙනුවෙන් වෙනම පොලිසි තිබෙනවා. එහෙම නැත්නම් ඒ අය වෙනුවෙන්ම වෙනම කටයුතු කරන එවැනි පොලිසි පිහිටුවලා නොවෙයි ඒ රටවල්වලට ඒ තැනට එන්න පුළුවන්කම ඇති වෙලා තිබෙන්නේ. ඒ රටවල්වල මිනිස්සුන්ගේ ජීවන තත්ත්වය ඉහළට ගන්න ආණ්ඩුවක් හැටියට සහ සමාජයක් හැටියට කටයුතු කිරීම තුළ තමයි ඒ අයගේ ඒ ආරක්ෂාව ගොඩනඟා ගන්න පුළුවන් පදනම ඇති කරලා තිබෙන්නේ.

අද අපේ කාන්තාවන් මැද පෙරදිගට ගියාම ඒ අය හිරිහැරයට ලක් වෙනවා. ඒ වාගේම ඒ අයගේ දරුවන් මේ රටේ ඉන්න අය, විශේෂයෙන්ම කාන්තා දරුවන් ඒ කාල පරිච්ඡේදය තුළ විශාල ලෙස අපයෝජනයන්ට ලක් වෙනවා. ඉතින් මේකට හේතු වෙලා තිබෙන්නේ දුප්පත්කම. ඒ දුප්පත්කමට විසඳුමක් හැටියට ඒ අයට පිටරටට යනවා. ඒකෙන් විශාල සමාජ ගැටළුවලට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා. කාන්තාවන් පිටරට යවන එකට වඩාත් ප්‍රමුඛත්වයක් දෙන්නේ නැතිව, අපට පුළුවන් වෙනවා නම් වෙනත් ආකාරයට රටට, ආර්ථිකයට හයියක් වෙන විධියට, වෙනත් ශ්‍රමිකයන් ලෙස පුහුණු ක්ෂේත්‍රයක් තුළ පිටරට යවන විධියට රැකියාවකට ඇතුළු කිරීමට පුළුවන් වෙන විධියට කටයුතු කරන්න පුළුවන් නම් මේ කාන්තාවන්ගේ තත්ත්වය ආරක්ෂා වෙනවාය කියන එකයි අපි විශේෂයෙන් සඳහන් කරන්න බලාපොරොත්තු වෙන්නේ.

ඒ වාගේම කාන්තාවන් රටේ පාලනයට අදට වඩා වැඩි සම්බන්ධයන් ගොඩ නගන්න ඕනෑ. ඒක පළාත් පාලන ආයතනවලදී වෙන්න පුළුවන්. පළාත් සභාවකදී වෙන්න පුළුවන්. පාර්ලිමේන්තුවකදී වෙන්න පුළුවන්. කාන්තා නියෝජනත්වයට අදට වඩා ඉඩක් තිබෙන්න ඕනෑය කියන එකයි අපි විශ්වාස කරන්නේ. ඒ සඳහා නීතියක් හැටියට අපි 25% ක නියෝජනත්වයක් ඇති කරන්න ඕනෑය කියන තැනට ආපු එක මම හිතනවා, වැදගත් පියවරක් හැටියට අපට සලකන්න පුළුවන් වෙනවා. ඒ නිසා අපි විශ්වාස කරන්නේ, නීතියකින් පමණක් නොවෙයි. සමාජ සම්බන්ධතාවයන්, සමාජයේ ආර්ථික සම්බන්ධතාවයන් තුළ තමයි මේ කාන්තාවන්ගේ ආරක්ෂාව ඇති කරන්න පුළුවන් වෙන්නේ. එහෙම නැතිව කාන්තාවන් වෙනමම කොටසක් හැටියට අරගෙන ඒ කටයුත්ත කරන්න පුළුවන්කමක් ඇති වෙන්නේ නැහැ. කෙසේ නමුත් ඇය උත්සාහ ගන්නේ, මේ කාන්තාවන්ගේ අයිතීන් වෙනුවෙන් පෙනී සිටින්න. මම හිතන්නේ, ඒකේ කිසි වැරැද්දක් නැහැ. ඒ වෙනුවෙන් අපේ සහයෝගය තිබෙනවා. නමුත් පෞද්ගලිකව මෙවැනි කාන්තාවන් වෙනුවෙන් වෙනමම පොලීසියක් පිහිටුවීමෙන් මේ ප්‍රශ්නයට විසඳුමක් සොයන්න පුළුවන් වන තැනට පත් වෙන්න පුළුවන්කමන් නැති බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[ අ.භා.12.12 ]

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම අද මෙම යෝජනාව ගෙනාපු අපේ නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමියට අපේ ස්තුතිය ප්‍රකාශ කරන ගමන් අපේ කාන්තාවන් හතර පස් දෙනෙකු මේ සභාව නියෝජනය කරනවා. අද එතුමිය විතරයි කාන්තාවන් ගැන කථා කරන්න ඉන්නේ. අපේ පිරිමි පාර්ශවයෙන් වැඩි පිරිසක් කථා කරන්නේ කාන්තාවන් ගැන. ඒ නිසා කාන්තාව ආරක්ෂා වෙන්නේ විශේෂයෙන්ම පිරිමියා අතින්. ඒ ආරක්ෂා වන මොහොතේ අර අපේ වටගල ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, සල්ලාලකම මේ රට වෙලා

[ගරු සුමිත් ලාල් මැන්දිස් - අමාත්‍යතුමා]

ගත් නිසා අද කාන්තාවෝ විශාල ප්‍රමාණයෙන් අවහිරතාවලට ලක් වෙන බව අපි දකිනවා. ඒ නිසා ඒකට අර කිව්වා වාගේ, පොලීසිම ඇති කරලා මේක මර්දනය කරන්න ටිකක් අමාරු බව අපට පේනවා, සමාජයේ හැසිරෙන කොට. කෙසේ වෙතත් කාන්තාවගේ තිබෙන අභිමානය - මම හිතන්නේ හුහක් නැති වුණේ විදේශීය රටවලට ගිහිල්ලා අපේ කාන්තාවන් හිරිහැරවලට ලක් වන නිසා තමයි කාන්තාවන්ගේ අභිමානය අද හුහාක් ඈත් වෙලා තිබෙන්නේ. ඈත අතීතයේ අපේ කාන්තාවෝ බොහොම ගෞරවාන්විත විධියට, මේ රටේ ජීවත් වුණා. අපේ පුංචි කාලේ අපේ අම්මලා, තමන්ගේ දරුවෝ හැදුවේ බොහොම හොඳින්. බොහොම ආරක්ෂා ඇතිව දරුවෝ හැදුවා. දැන් සමාජයේ සමහර වෙනස්වීම් නිසා සමහර කාන්තා දරුවෝ දෙමව්පියන්ට අකීකරු වෙන යුගයකුත් අද පොලීසිවල වාර්තා අරගෙන බලන කොට තිබෙනවා. ඒ නිසා මේක සමාජයෙන්ම ඇති විය යුතු දෙයක්. අපේ රටේ සමාජය සංස්කෘතිය, රටේ පිරිහෙන කොට මේ හිංසාව වැඩි වෙන්න පුළුවන්. ඒ නිසා කාන්තාව පිළිබඳව මම හිතන්නේ අපි රටේ වගකිවයුත්තෝ මීට වඩා විමසිලිමත් වෙන්න ඕනෑ. කෙසේ වෙතත් අපි සන්තෝෂ වෙනවා. දැන් පළාත් පාලන ආයතනවල මේ තිබෙන සංශෝධනය අනුව, මැතිවරණ ක්‍රමය අනුව 25% ක් කාන්තාවන් නියෝජනය වෙන්න ඕනෑය කියලා ඒ වගන්ති වෙනස් කරලා, අණ පනත් වෙනස් කරලා, දැන් පාර්ලිමේන්තුවට මම හිතන්නේ 24 වැනිදා ඉදිරිපත් කරනවා. ඒ නිසා කාන්තාවට තිබෙන අයිතිය එයින් ආරක්ෂා වෙනවා.

අපි කාන්තාවන් ගැන කථා කරන කොට මම හිතන්නේ, අපේ රටේ ප්‍රථම අග්‍රාමාත්‍යවරිය වුණේ, මේ රටේ කාන්තාවක්. ලෝකයේම එය ප්‍රසිද්ධ වුණා. ඒ වාගේම ප්‍රථම ජනාධිපතිනිය වුණෙත් අපේ රටේ කාන්තාවන්. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය. ඒ නිසා ඒ අභිමානය අපේ රටට ලැබුණත්, නිරෝෂා ගරු මන්ත්‍රීතුමිය කිව්වා වාගේ අපේ කාන්තා පාර්ශවය ආරක්ෂා කර ගැනීම පිරිමි අපගේ ලොකු යුතුකමක්. ඒ නිසා අපි පළාත් සභාව හැටියට එතුමිය ගෙනෙන යෝජනාව, ආරක්ෂාව පිළිබඳව යෝජනාවක් හැටියට තමයි, කාන්තාවන්ගේ ආරක්ෂාව ගැන හිතලා තමයි එතුමිය ඒ යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ. ඒ නිසා අපි මෙම කාරණය පිළිබඳව මධ්‍යම ආණ්ඩුවේ කාන්තා කටයුතු අමාත්‍යාංශය හරහා තවත් කථිකාවතක් ඇති කරලා, මේ පිළිබඳව විසඳුම් සොයන්න ඕනෑ.

මගේ අමාත්‍යාංශයේ තිබෙනවා, කාන්තා කටයුතු විෂය. නමුත් ලැබෙන අරමුදල බොහොම සීමිතයි. මේ අවුරුද්දේ ලැබිලා තිබෙන්නේ, රුපියල් මිලියන නවයයි. මිලියන නවයෙන් අපේ මන්ත්‍රීවරු 104 දෙනෙකු සිටිනවා. දිස්ත්‍රික්ක තුනක් තිබෙනවා. කාන්තාවන් සවි බල ගැන්වීමේ වැඩ පිළිවෙළක් කරන්න බොහොමත්ම අමාරු තත්ත්වයක තමයි ඒ මුදල් වෙන් කිරීමේදී කෙරෙන්නේ. ඒ නිසා අපි රජයට කියන්න ඕනෑ. පළාත් සභාවලට. මීට වැඩිය කාන්තාවන් ස්වයං රැකියාවලට මෙහෙයවන්න - මම විශේෂයෙන් දකින දෙයක්. අපි ධීවර ප්‍රදේශවල ඉන්න නිසා. වාරකන් කාලයට ධීවර පවුල්වලට ජීවත් වෙන්න බොහොම අමාරුයි. පුරුෂයා මුහුදු යාම නැවැත්වුවොත් ඒ පවුල කඩාගෙන වැටෙනවා. ඒ නිසා ධීවර වෘත්තියේ යෙදෙන කාන්තාවන් නොසිටියත්, ධීවරයන්ගේ ඒ පැවැත්ම සඳහා, ඒ පවුල්වල පැවැත්ම සඳහා ධීවර පවුල්වල කාන්තාවන් ස්වයං රැකියාවලට යොදවන්න ආණ්ඩුව මීට වැඩිය වැඩ පිළිවෙළක් යොදන්න ඕනෑ. ධීවර කාන්තාවන් ගත්තාම. ධීවරයින්ගේ පවුල්වල විෂය ගත්තාම. ඒ නිසා අපි කාන්තාවන් පිළිබඳව අපේ අමාත්‍යාංශය වැඩි අවධානයක් යොමු කරලා තිබෙනවා. ඒ අවශ්‍ය කරන සැලසුම් හදලා තිබෙනවා. අපි ලබන අවුරුද්දේ බලාපොරොත්තු වෙනවා, මීට වඩා මුදලක් අපට ලැබුණොත්. අපි ඉල්ලලා තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය කටයුතු කරනවා. ආරක්ෂාව පිළිබඳව අපේ රටේ ඉහළ තැන්වලට මේ අවධානය යොමු වෙන්නය කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[ අ.භා.12.18 ]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා මේ කාලය ලබා දීම ගැන. විශේෂයෙන්ම අපේ නිරෝෂා අතුකෝරළ මන්ත්‍රීතුමියගේ යෝජනාවට කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. අද මම හිතන්නේ, ඉතාමත් හොඳ යෝජනාවක්. නොයෙකුත් අදහස් පළ කළාට අද කාන්තාවට තිබෙන තැන ගැන අපි කථා කළොත් අද රජයේ සේවයේ මම හිතන්නේ, 60% ත් 70% ත් අතර ඉන්නේ කාන්තාවන්. වැඩිපුරම. අද අපේ

රටේ කවදාවත් නැති තරමට කාන්තාවෝ උසස් මට්ටමකට ගිහිල්ලා ඉන්නවා. ඒක අපි අධ්‍යාපනයෙන් බැලුවත්, විශේෂයෙන්ම වැඩිපුරම සමත් වෙන්නේ කාන්තාවෝ. විශ්ව විද්‍යාලය ගත්තත් වැඩියෙන්ම විශ්ව විද්‍යාලයට යන්නෙත් කාන්තාවන්. ඒ වාගේම රජයේ සේවය ගත්තත්, රජයේ සේවයේත් 60% ක් ඉක්මවා ඉන්නේ කාන්තාවෝ. ගුරුවරුන් 92% ක්. ඉතින් අපේ රටේ කාන්තාවන්ට තිබෙන තැන ගැන කථා කරද්දී මම හිතන්නේ, කිසිම භේදයක් නැහැ. වෘත්තීමය වශයෙන් කාන්තාවෝ ඉතාමත් ඉහළ මට්ටමක ඉන්නවා. නමුත් අපේ රටේ තිබෙන ප්‍රශ්නය තමයි, සමාජය වශයෙන් ගත්තාම කාන්තාවට තිබෙන පීඩනය, හිරිහැර, කරදර ඒ වාගේම - මම හිතන්නේ නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමිය උදාහරණ කිහිපයක් තමයි පෙන්වලා තිබෙන්නේ. සේයා දැරියගේත්, අනික් දැරියගේත් ප්‍රශ්නය ගැන. මේක අද ඊයේ වුණු දෙයක් නොවෙයි. කාන්තාවෝ දූෂණය වන එක, අසාධාරණයට ලක් වෙන එක මේ රටේ නොවෙයි ඉතිහාසයේ හැම තැනම තිබුණු දෙයක්. හැම රටේම තිබෙන දෙයක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

බුදු රජාණන් වහන්සේගේ කාලයේ ඉඳන්ම.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔව්. බුදුරජානන් වහන්සේගේ කාලයේ ඉඳන්ම. දැන් වෙලා තිබෙන්නේ, අපේ රටේ මේවා ඉලිප්පිලා පේන්නේ මාධ්‍යයත් එක්ක. නොයෙකුත් මාධ්‍ය ජාල තිබෙනවා. මේවාවලින් හැම එකක්ම උලුප්පලා පෙන්වනවා. ඒ කියන්නේ අද එදාට වැඩිය වෙනවාය කියන තර්කය නම් මම පිළිගන්නේ නැහැ. නමුත් අද සමාජය තුළට මේක යන ප්‍රවණතාවය වැඩි වෙලා තිබෙනවා. ඒක තමයි මේ අද කියන්නේ. මම හිතන්නේ, මේක අද වැඩියෙන් වෙනවාය කියලා. එදාටත් වැඩිය. මම හිතන්නේ, අපි ගම්බද ගත්තාම, ගම්වල ජනතාව ගත්තාම ඒ ගෙවල්වල තමන්ගේ දෙමව්පියන් අතින්ම කාන්තා දරු දැරියෝ දූෂණය වන එක - මම කියන්නේ දැරියෝ විතරක් නොවෙයි. පිරිමි ළමයින් දූෂණය වන එක මම හිතන්නේ, අනන්ත අප්‍රමාණ තිබෙනවා. ඉතින් මේකට මම හිතන්නේ හොඳම උදාහරණය තමයි සමාජයක් වශයෙන් අපි අපේ ආකල්ප ටික වෙනස් වෙන්න ඕනෑ. කාන්තාවන් ගැන තිබෙන. ඒක තමයි මේ රටේ තිබෙන ප්‍රධානම ප්‍රශ්නය කියන එකයි මම හිතන්නේ. මොකද, අපේ අර මන්ත්‍රීතුමා උදාහරණයකට ගත්තා, බස් එකක යද්දී කොට ගවුමක් ඇඳගෙන හිටියොත් යට ගිහිල්ලා බලනවාය කියලා. ඒක ඇවිල්ලා අපේ සමාජයේ ප්‍රශ්නයක්. දැන් මුහුදට නාන්න ගියාම බිකිණියක් ඇඳගෙන ඉන්න ගැහැණු ළමයාගේ ගිහිල්ලා යටින් බලන්නේ නැහැ නේ කවුරුත්. ඒක මිනිස්සුන්ගේ තිබෙන සමාජ ප්‍රශ්නයක්. එහෙම පීඩනයට පත් වුණු සමාජයකුත්, පිරිමි කණ්ඩායමකුත් අද මේ රටේ ඉන්නවා. ඒක අපි හඳුනාගන්න ඕනෑ. එහෙම නැත්නම් මේ ගවුමක් ඇඳගෙන ගියාය කියලා යටින් බලනවා කියලා, (බාධා කිරීම්) බාධා කරන්න එපා. මේ සමාජයේ ප්‍රශ්නයක් ගැන මම කථා කරන්නේ. ඒ නිසා අපි එහෙම ඉලක්ක කර ගෙන ඒ ගැන කථා කරන්න හොඳ නැහැ.

මම හිතන්නේ නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමිය ගොඩක් කියන්නේ. දැන් කාන්තාවක් දූෂණය වුණොත් ගෙදරක - තමන්ගේ ස්වාමියාගෙන් දූෂණය වන කාන්තාවෝ ඕනෑ තරම් ඉන්නවා. ඒ කාන්තාවට ගිහිල්ලා පැමිණිල්ලක් කරන්න බැහැ. හයයි. ලැජ්ජාව තිබෙනවා. අපේ රටේ කාන්තාවට ලැජ්ජාව කියන එක තිබෙනවා. පිටරට කාන්තාවට මොනවා හරි නිකම් කෙනිත්තුවත් පොලීසියට ගිහිල්ලා පැමිණිල්ලක් දාන්න ඒ කාන්තාවෝ භය නැහැ. මොකද, ඒ සංස්කෘතිය හැදිලා තිබෙන හැටි. අපේ රටේ කාන්තාවෝ එහෙම නොවෙයි. අපේ රටේ ගෙවල්වල හැදිලා හුඟක් දෙනෙක් බලාපොරොත්තු වෙන්නේ, මිනිස්සු, පුරුෂයෝ බලාපොරොත්තු වෙන්නේ, ගෙදර කෑම ටික උයාගෙන, ගෙදර අස්පස් කර ගෙන, මිදුල අතු ගා ගෙන, ළමයි හදලා, ඉස්කෝලේ යවලා ඒක තමයි කාන්තාවන්ගෙන් අපේ පිරිමි කට්ටිය ගොඩක් අද බලාපොරොත්තු වෙන්නේ. නමුත් දැන් ඒක අද ගොඩක් වෙනස් වෙලා තිබෙනවා. ඒ වෙනස් වෙනවාත් එක්කම සමාජය - එදා සමාජය නොවෙයි අද තිබෙන්නේ. ඒ වෙනස්කමත් එක්ක අද අපි කිව්වොත් කොටට ගවුමක් අඳිනවාය කියලා. දැන් ඕනෑ තරම් ඉන්නවා කොටට ගවුම් ඇඳගෙන යන අය. ඉස්සර එහෙම හිටියේ නැහැ. නමුත් දැන් ඉන්නවා. නමුත් එහෙම වුණාය කියලා පිරිමියෙකුට අයිතියක් නැහැ ගිහිල්ලා ඒ කාන්තාව දූෂණය කරන්න. දැන් සමහර කට්ටිය කියයි, එහෙම හින්දා තමයි එහෙම වෙන්නේ කියලා. ඉතින් එහෙම ජොලියක් ගන්න බැහැ කාටවත්. ඒක තමන්ගේ අයිතිවාසිකමක්. අපි කියන්නේ

[ ගරු ශ්‍රීනාත් පෙරේරා ]

නැහැ ඔක්කොම කොට ගවුම් ඇඳගෙන යන්න ඕනෑය කියලා. ඒක නොවෙයි මම මේකෙන් අර්ථකථනය කරන්නේ. නමුත් එහෙම වුණාය කියලා ඒ කාන්තාව දිහා වැරදි විධියට බලනවා නම් - නැත්නම් මෙයා කොටට ඇඳගෙන ඉන්නේ කියලා ඒ කාන්තාව දූෂණය කරන්න ඕනෑ කියලා එහෙම හිතනවා නම්, ඒක සමාජයේ තිබෙන බරපතළ වැරැද්දක්. ඒක තමයි අපි අද හදන්න ඕනෑ. ඒකට තමයි අපි පිළිතුරු සොයන්න ඕනෑ. නැත්නම් නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමියගේ යෝජනාවේ එක පැත්තක් මම පිළිගන්නවා.

අද ඒ කාන්තාවට ගිහිල්ලා පැමිණිල්ලක් කරලා, සාධාරණයක් ඉෂ්ට කර ගන්න බැරි අවස්ථා ඕනෑ තරම් තිබෙනවා. අද ගිහිල්ලා පැමිණිල්ලක් කරන්නවත් ඒ අවස්ථාව ලැබෙන්නේ නැතිව තිබෙනවා. මොකද, ඒ තරම් පීඩනයකට, සමහර වෙලාවට ඒ දූෂණය වුණු අයගෙන්ම පත් වෙනවා. සමහර වෙලාවට දූෂණය වුණාම ගිහිල්ලා පිරිමියෙකුට කථා කරන්න හයයි. පොලීසියකට ගියාම ඉන්නේ බහුතරයක් - පොලීසියක ඕනෑ නම් පනහක් ඉන්නවා නම්, කාන්තා පොලිස් නිලධාරීන් තුන් හතර දෙනෙක් ඇති. ඉතින් අර තිහක්, හතලිහක් පිරිමි ඉන්න තැනකට දූෂණය වුණු කෙනෙක් යන්න හයයි. ඒක තමන්ගේ මනසට ලොකු පීඩනයක් ඇති වෙනවා, එහෙම වුණාම. එහෙම වුණාම ඒ අයට යන්න, ඒ අයට සරණක් හදා ගන්න තැනක් තිබෙන්න ඕනෑ. ඒක තමයි මම හිතන්නේ එතුමිය අදහස් කරන්නේ. අද අපේ පාසල් ගත්තත් ඕනෑ තරම් ළමයින් දූෂණය වෙනවා. හැබැයි, ඒවා එළියට එන්නේ නැහැ. ඒක තමයි ඇත්ත කථාව. අපි කවුරු මොනවා කිව්වත්, අපේ පාසල් තුළ ළමයින් දූෂණය වන එක ඉතාමත් ඉහළ මට්ටමක තිබෙන්නේ. හැබැයි, මේවා එළියට එන්නේ නැහැ. එකක් දෙකක් එළියට ආවාට මම හිතන්නේ, අවුරුදු තුන හතරකට ඉස්සෙල්ලා මමත් කිව්වා, මේ දරුවන් සඳහා විශේෂයෙන්ම අඩුම තරමින් counseling service එකක් පාසල තුළ පවත්වන්න ඕනෑය කියලා. මොකද, ඒගොල්ලන්ට කථා කරන්න, තමන්ගේ තිබෙන ප්‍රශ්න ගැන කථා කරන්න කෙනෙක් නැහැ. අම්මාට තාත්තාට කියන්න බැහැ. එහෙම නැත්නම් ඒගොල්ලන්ට පොලීසියට කියන්න බැහැ. ඒ පාසල තුළ තිබෙන්න ඕනෑ ඒකකයක්. මෙහෙම අපචාර අපට සිදු වෙනවාය කියලා කියන්න තැනක් තිබෙන්න ඕනෑ. එහෙම අසරණ වුණාම හුහක් දෙනෙක් කියන්නත් හයයි. යන්නෙත් නැහැ. එහෙම ප්‍රශ්න තිබෙනවා. කාන්තාවටත් අද තිබෙන්නේ, විශාල වශයෙන් මේ වාගේ ප්‍රශ්න. මේවා අපේ සමාජයේ තිබෙන ප්‍රශ්න. අද විශාල වශයෙන් මත්ද්‍රව්‍ය නිසා තමයි මේ ප්‍රශ්න ගොඩක් අද ඇති වෙලා තිබෙන්නේ. මොකද, අද ලොකු ලොකු තැන්වල, ලොකු ලොකු අයගේ පුත්තු, ලොකු ලොකු අයගේ ඥාතීන්, එහෙම නැත්නම් සගයෝ තමයි මේ මත්ද්‍රව්‍ය ජාවාරම කර ගෙන යන්නේ. ඒක තමයි ඇත්ත කථාව. මේ ළඟදීත් බිරින්දෑවරු අහු වුණා. ඔය ජා - ඇළ පැත්තෙත් මම දැක්කා ටීවී එකේ පෙන්වනවා. මේකෙත් හිටියේ ලොකු ලොකු ව්‍යාපාරිකයන්ගේ පුත්තු. දූවලා පුතාලා තමයි. කුඩු ගහලා, අරවා මේවා කරලා ගිහිල්ලා අනවශ්‍ය විධියට හැසිරෙන්නේ. ඉතින් මේවා සමාජයේ තිබෙන ප්‍රශ්න. මේක විශාල ප්‍රශ්නයක්. අද හැම හන්දියක්ම ගත්තාම, හැම හන්දියකම මේ මත් කුඩු හරි මත් පෙති හරි ජාවාරමක් යනවා. ඉතින් මේවා තමයි අපි නවත්වන්න ඕනෑ. මේවා ගැන අපි යම්කිසි පාලනයක්, නීතිය ක්‍රියාත්මක වුණොත් අර සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේකේ ප්‍රධාන ප්‍රශ්නය නීතිය හරියාකාරව ක්‍රියාත්මක වෙන්නේ නැතිකමයි. මේක හරියට ක්‍රියාත්මක වෙනවා නම්, මේ ප්‍රශ්න ගොඩක් දුරට විසඳෙනවා. අද කනගාටුවෙන් හරි කියන්න ඕනෑ.

අද ඇති වෙලා තිබෙන අලුත් තත්ත්වයත් මේකට අපේ විජයදාස රාජපක්ෂ මහත්තයාගේ ප්‍රශ්නයත් - සමහර වෙලාවට මට ප්‍රශ්න එන්නත් පුළුවන්. නමුත් කියන්න ඕනෑ. එතුමා කියන කථාවේ ඇත්තක් තිබෙනවා. මොකද, නීතියක් එක කට්ටියකට විතරක් නවන්න විධියක් නැහැ. ඒ වාගේම තමයි දැන් නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමියටත් අපි කියන්නේ, කාන්තාවන්ට කියලා නොවෙයි. නමුත් නීතියක් තිබෙනවා නම්, නීතිය හැම කෙනාටම සාධාරණ වෙන්න ඕනෑ. නීතිය හැම කෙනාටම එක හා සමානව ක්‍රියාත්මක වෙන්න ඕනෑ. නැත්නම් ඒක නීතියක් වෙන්නේ නැහැ. නැත්නම් ඒක ප්‍රජාතන්ත්‍රවාදයක් වෙන්නේ නැහැ. එහෙම නම් අද සමහර වෙලාවට රාජපක්ෂ පවුල දාන්න පුළුවන්. කවදා හරි ඊළඟ ආණ්ඩුව ආවාම අහිංසක මිනිස්සුන්වත් ගෙනැල්ලා ඔය නීතිය යටතේම ආයේත් වැරදිකාරයා කරලා ඇතුළට දාන්න පුළුවන්. ඉතින් එහෙම නොවේවා කියලා අපි ප්‍රාර්ථනා කරනවා. හොරකම් කරලා තිබෙනවා නම්, වැරදි වැඩ කරලා තිබෙනවා නම් ඒකට නීතිය අනුව ක්‍රියාත්මක කරලා

එක එක කට්ටියට විශේෂත්ව දක්වන්නේ නැතිව නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ. හැම කෙනාටම සාධාරණ වන විධියට. අපට හොරකම් අල්ලන්න ඕනෑ. හොරුන්ව අල්ලන්න ඕනෑ. හොරකම් කරපු සල්ලි ගේන්න ඕනෑ. හොරුන්ව අල්ලලා මදී. හොරකම් කරපු සල්ලිත් නැවත වරක් ගේන්න ඕනෑ. රජයට. මේ ආණ්ඩුවට. මේ මිනිස්සුන්ගේ සල්ලි. ඒ නිසා නීතිය හැම කෙනාටම සාධාරණව ඉෂ්ට වෙන්න ඕනෑය කියන එකත් මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair*

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මම නැති වෙලාවේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා මට චෝදනාවක් කරලා තිබෙනවා. මම ඩබල් ගේම් ගහනවාය කියලා. ගරු සභාපතිතුමනි, ඔබතුමා දන්නවා. මම ඔය ඩබල් ගේම් ගහන ජාතියේ කෙනෙක් නොවෙයි. මම ඩබල් ගේම් ගහන්නේ නැහැ. මම ගහන ගේම කෙළින් ගහන්නේ. ඔලුවටම දෙන්නේ. ෂොට් එකම ඔලුවට දෙන්නේ. ඒ නිසා මේ තමුන්ගේ ගම්වල, බල ප්‍රදේශවල, පළාත් පාලන ආයතනවල තිබෙන ප්‍රශ්න ඒගොල්ලෝ විසඳගන්න ඕනෑ ඒවා. ඒක මගේ ඇඟට දාලා වැඩක් නැහැ. අනික් එක යූ.එන්.පී හරි, ශ්‍රී ලංකා හරි, ජේ.වී.පී. හරි මට මේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් මගෙන් ඉල්ලීමක් කළොත් මම ඒක කරනවා. මම ඒක කවදාවත් කියන්නේ නැහැ - අර ඔබතුමා 10 වන පටුමග - මට ඒක පැහැදිලි වුණේ නැහැ. බොරලැස්ගමුවේ මොකක්ද 10 කණුව පාර. ගරු මන්ත්‍රීතුමා මට කිව්වේ. අපි ගියා. ඒක කාපට් එක දාන්න අපි ලැහැස්ති කළා. ඔබතුමා මට කිව්වේ. 10 කණුව පාර. ඉතින් ඒක ලක්ෂ්මන් නිපුණ ආරච්චි කිව්වේ කියලා මට නිකම් ඉන්න තිබුණා නේ? ඒ නිසා ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, තමුන්නාන්සේලාගේ ප්‍රශ්න තමුන්නාන්සේලා විසඳගන්න. මාව දාන්න එපා.

අනික් එක මම ගරු සභාපතිතුමා මගින් ඒ මන්ත්‍රීතුමාට කියනවා. ඒ මන්ත්‍රීතුමාගේ පියා මන්ත්‍රීවරයෙක් නොවෙයි. ඒගොල්ලෝ අපේ නගර සභාවල ලේකම්ලා ගෙන්වලා හොඳටම දෝෂාරෝපණය කරනවා. ඒ ලේකම්වරු මට චෝදනා කරනවා. දැන් මට හරි ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ. සමහර ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලින් ඇවිල්ලා අපේ පළාත් පාලන ආයතනවලට නියෝග දෙනවා. එහෙම නියෝග දෙන්න පුළුවන්ද? එහෙම දෙන්න බැහැ. එතකොට නිලධාරීන්ට, මේ ඉන්න සම්බන්ධීකරණ කමිටුවේ සභාපති නියෝග දුන්නාට ඒගොල්ලෝ ක්‍රියාත්මක කරන්න බැඳිලා නැහැ. ඉතින් ඒවා මෙරිල් එක්ක ප්‍රශ්නයක් තිබෙන්නේ. මේ ඔක්කොම මෙරිල්, මෙරිල්, මෙරිල්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙරිල් භීතිකාව.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මම මේ අවුරුද්දට රුපියලක්වත් දීලා නැහැ. සංවිධායකතුමා, දීලා තිබෙනවාද? මේ ඉන්නේ. අහන්න කෝ. මාර භීතිකාවක්. මම ඩබල් ගේම් ගහන්නේ නැහැ. ඔබතුමා දන්නවා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම දන්නවා. එතුමා කෙළින්ම කියනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මට මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාටත් කථා කරන්න පුළුවන්. මට මේ ඩබල් ගේම් ගහන්න ඕනෑ නැහැ. ජනාධිපතිතුමා දන්නේ නැහැ. මේගොල්ලෝ - දැන් මෙතැන හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමා නැහැ. මට අගමැතිතුමා - ඔය මොන දේශපාලනය තිබුණත්

[ ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා ]

ගරු විපක්ෂ නායකතුමා පිළිගන්නවා නේ? මට අගමැතිතුමාට කථා කරන්න පුළුවන්. මේගොල්ලන්ට යන්න බැහැ. මම යනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කථා කරන්න පුළුවන් එක වෙනම කථාවක් නේ? මේක වෙනම කථාවක් නේ?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මෙතැන මන්ත්‍රීවරු කිහිප දෙනෙක් නැහැ. මට ප්‍රශ්නයක් නැහැ. මම බස්නාහිර පළාතේ මහ ඇමති. ඒ නිසා මාව ඒ ගොඩට දාන්න එපා. ප්‍රශ්න තිබෙනවා නම් ගිහිල්ලා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමා, වරප්‍රසාද ප්‍රශ්නයක්. එතුමාගෙන් පොඩි ප්‍රශ්නයක් අහන්න තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා කථා කරනවා නේ? එතුමාට අවස්ථාව දෙමු. ඔබතුමාටත් අවස්ථාව දෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ප්‍රශ්න තිබෙනවා. මේ සභාවේ ඇවිල්ලා මම වාගේ මිනිහෙකුට අපහාස කරන්න එපා. හරිද? මේ සභාවේ මන්ත්‍රීවරුත් එක්ක මාව නොමග යවන්න බැහැ. මොකද, මට ප්‍රශ්නයක් ආවොත්, මොනවා හරි කිව්වොත්, මන්ත්‍රීවරුන්ට කන් දීලා මම ඒක කරලා දීලා තිබෙනවා. මම මගේ ළඟට එන මන්ත්‍රීවරයෙක් හරවලා යවලා නැහැ. මෙතුමාටත් මොනවා හරි කෙළින් එන්න කියලා කියන්න. අපිත් එතකොට කෙළින් එන්නම්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මගේ නම කියපු නිසා. මම කවුරුත් පස්සේ දොරෙන් යන මිනිහෙක් නොවෙයි. මම කෙළින් කියන්න තිබෙන එකක් කෙළින් කියනවා. ඉල්ලා ගන්න තිබෙන දෙයක් - දැන් මම එතුමාට ලිපි දෙකක් දුන්නා. එතුමා නියෝගයක් දීලා තිබෙනවා, ජා - ඇළ නගර සභාවටයි, ප්‍රාදේශීය සභාවටයි එතුමාගේ අත්සන නැතිව, දැනුම නැතිව කිසිම දෙයක් කරන්න එපාය කියලා. අයවැයෙන් වෙන් කරපු මුදල් ජනවාරි මාසේ වෙන් කරලා, පාරවල්වලට ඇස්තමේන්තු හදලා වෙන් කරපු ඔක්කොම මුදල් අද ඒ පාරවල් ඔක්කොම කටයුතු නවත්වලා තිබෙනවා. එතුමාගේ නියෝගය යටතේ. දැන් එතුමා කියනවා, එහෙම කරන්නේ නැහැයි කියලා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මම නිලධාරීන්ව නවත්වන්න එතුමා කිව්වා කියලා අනික් පැත්තෙන් නතර කරන ජාතියේ ඇමතිවරයෙක් නොවෙයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඉතින් ඔබතුමා කියන්න, ඔබතුමා එහෙම නියෝගයක් දීලා නැහැයි කියලා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මම එහෙම කියලා නැහැ කාටවත්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා එහෙම නියෝගයක් දීලා නැද්ද?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නැහැ. මම දීලා නැහැ. මම කවදාවත් ඔයාට කෝල් එකක් දීලා, මේ පැත්තෙන් ඒක නතර කරන්නේ නැහැ. මම සිංහ ලග්නයේ මිනිහෙක්. මම ඒ වාගේ කැත වැඩ කරන්නේ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

බජට් එකේ අරමුදල් ඔබතුමාගේ අවසරයක් නැතිව කරන්න එපාය කියලා නැද්ද?

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

පළාත් පාලන ආයතනවල තිබෙන සල්ලි -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පළාත් පාලන ආයතනවල මහජනතාවගෙන් ගත් යෝජනා. මහජනතාවගෙන් ගත් යෝජනා -

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

වරප්‍රසාද කැඩෙන්නේ අපේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මහජනතාවගෙන් ගත් යෝජනා ලේකම්වරුන්ට කරන්න එපා කියලා නැද්ද ඔබතුමා.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

මේ බොරු චෝදනා කරන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේක දිගින් දිගට යන්න බැහැ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මේ සංවාදය මොන රීතිය යටතේද කරන්නේ ගරු සභාපතිතුමා.

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා**
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, මේ පළාත් පාලන ආයතන විසුරුවා හැරලා තිබෙන්නේ. ඒකේ බලය සම්පූර්ණයෙන්ම තිබෙන්නේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විෂය භාර ඇමතිතුමාට.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක හරි. ඒක මම පිළිගන්නවා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ඔබතුමා කෙළින් එන්න කෝ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඉතින් එහෙම නම් ඔබතුමා එහෙම කර ගන්න කෝ. ඒකයි මම කියන්නේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, මේ සංවාදය පවත්වන්නේ මොන රීතියක් යටතේද?

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, දැන් කොළඹ මහ නගර සභාව විසුරුවා හැරියා. ගරු සභාපතිතුමනි, කොළඹ නගර සභාව පාලනය කළේ අපිද? නැහැ. කවුද පාලනය කළේ? ඔබතුමන්ලා. මම අගමැතිතුමාට කිව්වා, සර්, සර්ට ඕනෑ විධියට කර ගන්න. සර්, මොනවා හරි තිබෙනවා නම් මට කියන්න. මම ඒක අත්සන් කරලා දෙන්නම්. වැරදිද? වැරදියි කියලා කියනවාද? හැබැයි, අපේ ඒවාට එන්න එපා. අපි පාලනය කරලා විසුරුවපු ඒවාට කවුරුවත් එන්න එපා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මහ ඇමතිතුමා හරි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මහ ඇමතිතුමා, ඔබතුමාට බලය තිබෙනවා කියලා මම ඒක දන්නවා. ඒ යෝජනා ටික නැවැත්තුවේ ඇයි කියලා මම අහන්නේ. ඇයි ඒවා ඒගොල්ලන්ට කර ගෙන යන්න දෙන්නේ නැත්තේ? ඒකයි මට දැන ගන්න ඕනෑ. (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. අපි දැන් න්‍යාය පත්‍රයට යමු. ඔබතුමන්ලා වාඩි වෙන්න. එතුමා අපේ සහෝදරයෙක් වාගේ. මහ ඇමතිතුමා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමා කියනවා මට ඉස්සරහා දොරෙන් එන්න කියලා. මම එතුමාට ලියුම් දෙකක් දුන්නා. තවම, හරි ශ්‍රීනාත් ඒක හරි කිය කියා ඉන්නවා විතරයි. එතුමා එහෙම නම් මට වෙනම සලකනවා. අනික් මන්ත්‍රීවරුන්ට වෙනම සලකනවා ඇති.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මහ ඇමතිතුමා යමක් කළා නම් ඒක තමයි හරි දේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මේක තේරුම් ගන්න කෝ. මේ මහ ඇමතිතුමා කියන්නේ, බොහොම සරළ පුංචි පන්තියේ මහ ඇමතිවරයෙක් නේ. එතුමාත් එක්ක වැඩ කරන්න පුළුවන්. ඔබතුමා ගිහිල්ලා එතුමාත් එක්ක කථා කරන්න. උදව් ටික ගන්න කෝ. එතුමාත් එක්ක ගේමට ගියොත් අමාරුයි වැඩේ කර ගන්න. කථා බහ කරලා ඕනෑ දෙයක් කර ගන්න පුළුවන්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම ගේමට යන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගේමට යන්න එපා. කථා බහ කරලා එතුමා එක්ක ඕනෑ වැඩක් කර ගන්න පුළුවන්.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මහ ඇමතිතුමා යමක් කළා නම්, ඒක තමයි හරි දේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අන්න මන්ත්‍රීවරයෙක් කියනවා, හරි දේ ඒකලු. හරි දේ ඒක නම් -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා නේ ප්‍රශ්න ඔක්කොටම - දැන් නැගිටලා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් කථා කරන්න දෙන්නේ නැද්ද? රවුමෙන් එන්නේ නැහැ. කෙළින් එන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙයා ඔක්කොම ඇති කරලා, ජා - ඇළ ආසනයේ ඔක්කොම ඇති කරලා දැන් මෙතැන ආයිත් කථා කරනවා ඔයා.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

මෙතුමා, ලාන්සා ඇමතිතුමා ඉන්නකල් එතුමාත් එක්ක එල්ලුනා. දැන් ඉතින් මෙරිල්ව අල්ලාගෙන තිබෙනවා. ගරු සභාපතිතුමනි, අපි මොනවාද කරන්නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෙරිල් මන්ත්‍රීතුමාගේ නොවෙයි. මම මෙරිල් මන්ත්‍රීතුමාට කිසි දෙයක් කිව්වේ නැහැ. සම්පූර්ණ වරද ඔබතුමාගේ. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට මම කිසි දෙයක් කිව්වේ නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, ජා -ඇළ ආසනයේ ව්‍යාපෘති වෙන කොට -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමා කරන්නේ, ඔබතුමාට කියලා අත්සන් කර ගෙන යන එක විතරයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මධ්‍යම ආණ්ඩුවේ ව්‍යාපෘති වෙන කොට කවින්ද ජයවර්ධන ගරු මන්ත්‍රීතුමා එතුමාගේ ප්‍රතිපාදන වෙන් කර ගෙන එතුමාගේ ෆොටෝ ගහගෙන කරනවා. මෙතුමාගේ පියා එහේ සංවිධායක හැටියට මෙතුමාගේ සහ පියාගේ ෆොටෝ දා ගෙන කරනවා. අපි පළාත් සභා ප්‍රතිපාදන හෝ වෙනත් ප්‍රතිපාදනයක් අමාත්‍යාංශයෙන් ගත්තාම අපේ ෆොටෝ දා ගෙන කරනවා. කාගේවත් වරදක් නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අන්න ඒක තමයි ඉතින්. ඒක පිළිගන්නේ නැහැ නේ? ඒක නේ තිබෙන ප්‍රශ්නය.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කවුරුත් ව්‍යාපෘති කරන්නේ. වරදක් නැහැ නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වැරැද්දක් නැහැ. නමුත් ඒක පිළිගන්න බැහැ. එහෙම නම් මහ ඇමතිතුමා, කියන්න ඕනෑ. මම මෙරිල්ට දෙනවා. කරනවා. එපමණයි. ඉවර නේ කථාව? ඒකට විරුද්ධත්වයක් නැහැ නේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පුළුවන් තරම් උපරිමයෙන් වැඩ කරන්න කියන්න. වැඩ කරපු අය දිනයි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මෙරිල් මන්ත්‍රීතුමා කළා නම් වැරදියි. මහ ඇමතිතුමා කළා නම් යමක් හරි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම මෙරිල්ට දෙනවා. මෙරිල් කර ගන්න. ඉවර නේ කථාව. එතුමා කියන්නේ නැහැ නේ එහෙම. එතුමා කියන්නේ එහෙම නොවෙයි නේ වෙන්නේ කියලා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, සභාවේ තවත් යෝජනා තිබෙනවා. සභාවේ කාලය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර දැන් නිශ්ශබ්ද වෙන්න. අපි දැන් න්‍යාය පත්‍රයට යමු.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ගරු සභාපතිතුමනි, හරියට නිකම් අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා එක්ක ගෝවේ ගියා වාගේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමල්ලා වෙත විශේෂ නිවේදනයක් තිබෙනවා. අද උදෑසන ඔබතුමන්ලා වෙත දැනුම් දුන් පරිදි 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා පමණක් විශේෂ මහා සභා රැස්වීමක් 2017.08.28 වන සඳුදා දින පෙ.ව. 9.30 ට පැවැත්වෙනවා. අද දින මාගේ නිල කාමරයේදී ගරු ප්‍රධාන අමාත්‍යතුමා, ගරු අමාත්‍යවරුන්, ගරු විපක්ෂ නායකතුමා සහ සභා කටයුතු කාරක සභාවේ මන්ත්‍රීතුමන්ලාගේ සහභාගීත්වයෙන් පැවැත්වෙන එම සාකච්ඡාවේදී තවත් ගරු මන්ත්‍රීතුමන්ලා කිහිප දෙනෙකු අදහස් ප්‍රකාශ කළා. අපි ජනාධිපති නීතිඥ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාත්. ඒ සියලුම අදහස් කෙරෙහි අපි අවධානය යොමු කරලා, ඒ සම්බන්ධව අපි තීරණය කළා, 2017.08.28 වන දින විශේෂ සභාවක් වශයෙන් පළාත් සභාව රැස්වෙන්නට. ඒ නිසා මම ඉතාමත්ම ගෞරවයෙන්. සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට ආරාධනා කරනවා එදිනට එම සභා රැස්වීමට සහභාගී වෙන්න.

ඒ වාගේම සැප්තැම්බර් මස 04 වන දින පැවැත්වෙන ඒ සභාවත් එහෙම්මම පැවැත්වෙනවා. න්‍යාය පත්‍රය ඒ විධියටම යනවා. මේ න්‍යාය පත්‍රයට මුකුත්ම නැහැ. මේ න්‍යාය පත්‍රයේ තිබෙන්නේ මේ කාරණාව විතරයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, අපි මේ 20 වන සංශෝධනයට වෙනම විශේෂ සභා රැස්වීමක් තැබීමට පෙර සියලුම පළාත් සභා මන්ත්‍රීවරුන්ට මේ 20 වන සංශෝධනය පිළිබඳව අර්ථ කථනය කර ගෙන මේක පැහැදිලි කිරීමක් කරන්න -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඒ ගැන කථා කළා. නමුත් මන්ත්‍රීවරු කිව්වා, ඒක අවශ්‍ය නැහැයි කියලා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒක අවශ්‍යයි. මේක මෙහෙම නේ ? පක්ෂ නායක හා කණ්ඩායම කථා කළාට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බහුතරයක් කථා කරයි. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාත් එදාට ලැහැස්ති වෙන්න. කරුණු ටික අපි දෙන්නම්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

නැහැ. කරුණු දෙන්න දැන ගන්න එපැයි. ඒකේ තිබෙනවා, මම හිතන්නේ අපේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණු කාරණා දෙකයි තිබෙන්නේ ඒකේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කරුණු දෙක වුණාට කරුණු දෙකෙන් පැහැදිලි කරන ඒවා අර්ථ කථනය කරලා නැහැ, මේකේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. අර්ථ කථනය කරන්න ක්‍රමවේදයක් නැහැ මෙතැන මේකේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මේකේ අර්ථ කථනය කරන්න දෙපැත්තටම තිබෙනවා නේ? මේක අපි දන්න නීතිඥ මහත්මයෙකුගෙන් අහ ගන්න ඕනෑ මේකේ තේරුම මොකක්ද කියලා. මේක එදා උදේ 9.30 ට ඇවිල්ලා මෙතැන අහන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. මෙතැනම අහන්න අවශ්‍ය නැහැ. ඔබතුමා අහගන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, මේකට අපි එකඟයි. නැත්නම් අපි උදේ ඇවිල්ලා - නීති ප්‍රශ්නයි වෙනත් තිබෙන ප්‍රශ්නයි -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, එහෙම අහන්න බැහැ නේ? අපි උදේ පාන්දර 8.30 ට ඇවිල්ලා අහගන්න බැහැ. ඒක අපි දැන ගන්න ඕනෑ. නීතිය ගැන දන්න පිළිගන්න කෙනෙකුගෙන් අහ ගන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. ඒක දැන් කරන්න බැහැ. අපි තීරණය කරලා ඉවරයි එහෙම කරමුයි කියලා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේකේ අපි දන්න නීතිඥයෙකුගෙන් ඇහුවාට ඒ නීතිඥතුමාට මේක කියන්න තේරෙන්නේ නැහැ. මේ ගැන දන්න කෙනෙකුගෙන් අහ ගන්න ඕනෑ. මේක අර්ථ කථනය කරලා තිබෙන -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මේකේ අන්තිමට -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කාගෙන්ද? පිළිගන්න කෙනෙක් එපැයි. නිකම් තම තමන් සොයා ගත්තාට හරියන්නේ නැහැ. මේක පැහැදිලි කරන්න ඕනෑ. මේකේ කියලා නැහැ මේකේ වචන අර්ථ කථනය කරලා නැහැ, මොකක්ද කියන එක.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා එතැන හිටියා නේ?

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මම එතැන ඉදලා, විශේෂ ප්‍රකාශයක් කරන්න තිබෙන නිසා මම මෙතැනට ආවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කණ්ඩායම් රැස්වීමේ තීන්දුවක් ගත්තා කියලා, එහෙම තීන්දුවක් ගන්න බැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. ඒ සාකච්ඡාවට අපි ඔක්කොම හිටියා. මහ ඇමතිතුමා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, තරහා වෙන්න එපා මෙහෙම කිව්වාට. මීට ඉස්සෙල්ලා මේ වාගේ දෙයකදී වෙනම සාකච්ඡා කළා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අපට ප්‍රශ්නයක් නොවෙයි. මේ දිස්ත්‍රික්ක තුනේ ඉන්න මන්ත්‍රීවරුන්ට. එහෙම දැනුවත් කිරීමක් කරනවා නම්, අපි දැනුවත් කිරීම 8.30 ට කරලා 9.30 ට සභාව තියමු.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ඒත් ඇති නේ? නැත්නම් ආයිත් දවසක් එන්න එපැයි.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නැත්නම් ආයිත් දවසත් එන්න එපැයි?

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඒක හොඳයි. මෙරිල් මන්ත්‍රීතුමා කියන්නේ, මේ පිළිබඳ පූර්ණ අවබෝධයක්. නැත්නම් මේකේදී අවබෝධය ගන්න ගියොත් -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, ඒක ඒගොල්ලන්ගේ පක්ෂය ඇතුළේ සාකච්ඡා කරලා, ඒකට ඕගොල්ලෝ කථා කරලා ඒක විසඳගන්න. එතකොට ඉවරයි නේ?

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මට මේ දිනයට එන්න පුළුවන්කමකුත් නැහැ. මගේ ශරීරයේ ලේ පිරිසිදු කිරීම් සතියකට තුන් වරක් තිබෙනවා. ඒ නිසා. ඒ දිනය යොදා ගන්න. නමුත් මේ ලියුම ඔබතුමාට මම දන්නා විධියට පැමිණියේ ජනාධිපතිතුමාගෙන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. ආණ්ඩුකාරතුමාගෙන්.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඔව්. ආණ්ඩුකාරතුමාගෙන්. ඒ ආණ්ඩුකාරතුමාට දැන්වුවේ ජනාධිපතිවරයා. එතකොට මේ වැඩේ පිටුපස ඉන්නේ ජනාධිපතිවරයා. ඒක අපට ප්‍රශ්නයක් නැහැ. ජනාධිපතිවරයා ඉන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමන්ලාගේ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඇයි ඔබතුමන්ලාගේ ජනාධිපති නොවෙයිද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය විවාදවලට යන්න එපා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

එහෙම නම් තමුන්නාන්සේලා මුක්කු ගහන්න එපා. හරිද? මුක්කු ගහන්න එපා. අපේ ජනාධිපති නම්, ඒ ජනාධිපතිවරයා එවන ලියුම්වලට මුක්කු තියන්න එපා. මේකේ ඉස්සෙල්ලා අපට තේරුම් ගන්න ඕනෑ -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

විපක්ෂ නායකතුමා ගණන් ගන්න එපා. කථා කරන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

එතුමන්ලා, නීතිඥවරයෙක් හැටියට දැන් මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන ඇමතිවරයා ගෙන්වන්නේ නැහැ නේ? එතුමන්ලාගේ පක්ෂයට හිතවත් නීතිඥවරයෙක් තමයි ගෙන්වන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ස්වාධීන කෙනෙක් ගෙන්වන්නේ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ස්වාධීනයි කියලා කියන්නේ කොහොමද? ස්වාධීන මිනිස්සු නැහැ මේකේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපට ඕනෑ නැහැ. අපට එපා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

දේශපාලනය කරනවාට - මේ මමත් -

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා**
Hon. Gamini Thilakasiri - Minister

කවුරු ගෙනාවත් පක්ෂග්‍රාහී කොහොමත්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට තේරෙන්නේ නැහැ. මෙතුමා එපැයි කියනවා. අර මන්ත්‍රීතුමා ඕනෑයි කියනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඕනෑ කට්ටියට තියන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එයා ගැන මෙයා ගැන බලලා තීන්දුවක් ගන්න එපා. ඒක පැහැදිලි කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කවුද පැහැදිලි කරන්නේ කියන්න මට ඉස්සෙල්ලා. මහ ඇමතිතුමාද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මම හිතන්නේ ජනාධිපති නීතිඥ ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමා මෙතැන ඉන්නවා නේ. අපි එතුමාගෙන් අහමු මේකේ අර්ථ කථනය කිරීමේදී - මේකේ තිබෙනවා පළාත් සභා විසුරුවා හැරීමේ බලය තිබෙනවා කියලා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

නැහැ. එතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමන්ලා එකඟ නම් අපි එතුමාට ආරාධනා කරමු.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

නැහැ. අපේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි ඔබතුමන්ලා එකඟ නම් අපි එතුමාට ආරාධනා කරමු.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ජනාධිපති නීතීඥ හැටියට ගෙන්වමු. යූ.එන්.පී. පළාත් සභා මන්ත්‍රී නොවෙයි.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, අපේ ජනාධිපති නීතීඥවරයෙක් ඉඳගෙන, අපි පිට කෙනෙක් ගෙන්වන්න ඕනෑ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක මමත් පිළිගන්නවා.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

එතුමාට පැහැදිලි කරන්න කියමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මමත් පිළිගන්නවා. එහෙම නම් එතුමාට ඉතාමත් ගෞරවයෙන් ආරාධනා කරනවා. ඔබතුමා -

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, ඒ එක්සත් ජාතික පක්ෂයේ පළාත් සභා මන්ත්‍රීවරයා හැටියට නොවෙයි අපි එතුමාට ආරාධනා කරන්නේ, මේ රටේ ජනාධිපති නීතීඥවරයා හැටියට.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, මේ යෝජිත සංශෝධනය මම හිතන්නේ අපේ පළාත් සභාවලට සෘජුව බලපාන සංශෝධනයක්. මමත් මේ දැන් තමයි කියෙව්වේ. ඒ නිසා එහෙම කියවලා මම හිතන්නේ සාකච්ඡාවකට යා නොයුතුයි. ඒ නිසා අපි කවුරුත් අධ්‍යයනය කරලා - මම ඔබතුමන්ලාට සහතිකයක් දෙනවා. මම ස්වාධීන තැනක ඉඳලා, මට පුළුවන් විධියට මේක කියවලා මගේ අදහස ප්‍රකාශ කරන්න. නමුත් මම හිතනවා, ඔබතුමන්ලාත් ස්වාධීනව ඒ ගැන කල්පනා කරලා බලලා, මම හිතන්නේ අපි සාකච්ඡාවක් කළ යුතුයි. ඒ නිසා ඒක කරන්න ඉස්සෙල්ලා මම හිතන්නේ මටත් මේක අධ්‍යයනය කරන්න අවශ්‍යයි. මොකද, මේක විතරක් නොවෙයි, අපි මේ ව්‍යවස්ථාවේ ඒ අදාළ විධිවිධානත් එක්ක සසඳමින් තමයි මේක අර්ථ නිරූපනය කිරීම සඳහා අඩිය තියන්න ඕනෑ. මම හිතන්නේ, මම අද උදේ පොඩි වැරැද්දකුත් කළාය කියලා මම හිතනවා. ඒ නිසා අපි හරියට ඒක අධ්‍යයනය කරලා, සාකච්ඡා කරලා මේ පිළිබඳව ඔබතුමන්ලා සියලු දෙනාටම ඒ පිළිබඳව අවධානය යොමු කරලා, අපට තීරණයක් ගන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා. මේක අනුමත කරනවාද නැද්ද කියන එක සභාවේ වගකීම.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ තීරණයක් ඒක.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

නමුත් අපි නීතිමය වශයෙන් ඒ ගැන සාකච්ඡා කිරීමේදී අපට විවෘත මනසකින් ඒ ගැන සාකච්ඡා කරන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. එහෙම නම් -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒක තමයි ගරු සභාපතිතුමනි, ඉල්ලන්නේ. දැන් අපට අවස්ථාවක් දෙන්න කියන්නේ. එතුමාත් කියනවා,

[ ගරු මෙරිල් පෙරේරා ]

එතුමාටත් අධ්‍යයනය කරන්න අවශ්‍යයි කියලා. අපිත් නොදන්නා දෙයක් දන්නා කෙනෙකුගෙන් අහ ගන්න අවශ්‍ය නිසයි අපි ඉල්ලීමක් කරන්නේ. මේක නැතිව 28 වැනිදා උදේ 9.30 ට ඇවිල්ලා මෙතැන ගාල ගෝට්ටියක් කර ගන්න ඕනෑ නැහැ. මේක දැනගෙන එන්න එපැයි කථා කරන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

දැන් මේක -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දැන් උතුරු මැද පළාත් සභාව 20 වන සංශෝධනය අනුමත කරලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නම් දැන් ගරු ප්‍රධාන අමාත්‍යතුමා, ගරු විපක්ෂ නායකතුමා ඇතුළු සියලුම මන්ත්‍රීතුමන්ලාගේ අදහස තමයි, එකඟතාවය ලබා දුන්නා, අපේ ශ්‍රීනාත් ම. පෙරේරා ජනාධිපති නීතිඥතුමාගේ සහයෝගය ලබා ගෙන අපි සභාව රැස් වෙන්න පෙරාතුව ඒ පිළිබඳව අපි සාකච්ඡා කිරීමට. ඒ අනුව මට එකඟතාවය දෙන්න. 2017.08.28 වන දින උදේ 8.30 ට ඒ සාකච්ඡාව ආරම්භ කරනවා. අපේ රීති අනුව ඒ සභා රැස්වීම 9.30 ට පවත්වන්න ඕනෑ. නමුත් අපි සභාව යෝජනා කරන්න 10.30 ට අපි රැස්වීම තියමු.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

නැහැ. ඕනෑ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඕනෑ නැද්ද? හරි. මට එහෙම නම් සභාවේ එකඟතාවය දෙන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, 8.30 ට සාකච්ඡාවට කැඳවන්න. 10.30 ට රැස්වීම පවත්වන්න. ප්‍රශ්නයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

යෝජනාවක් වශයෙන් ගේන්න ඒක.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මම යෝජනා කරනවා, 28 වැනිදා පැවැත්වෙන විශේෂ සභා රැස්වීම උදේ 9.30 ට නොවෙයි. 10.00 ට පවත්වන්නය කියලා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නම් ඒ අනුව ගරු ආණ්ඩුකාරතුමා විසින් එවන ලද 20 වන සංශෝධනය සම්බන්ධව ඒ යෝජනාව පිළිබඳව මූලික සාකච්ඡාව 2017.08.28 වන දින උදේ 8.30 ට පැවැත්වෙනවා. ස්ථානය මේ ස්ථානයමයි. අපි උදේ 08.30 ට ඒ පිළිබඳව පුළුල් සාකච්ඡාවක් කිරීමට ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රධානත්වයෙන් අපි මේ සභා ගර්භය තුළ හරි, වෙනත් ස්ථානයක හරි අපි ඒ පිළිබඳව පුළුල් සාකච්ඡාවක් කරමු. එදින පළාත් සභා රැස්වීම උදේ 10.00 ට රැස් වෙනවා. ඒක සම්මතයි එහෙම නම්. ඒක සම්මතයි එහෙම නම්.

2017.09.04 වන දින සභා රැස්වීම සාමාන්‍ය විධියට පැවැත්වෙනවා. ඒකේ කිසිම ප්‍රශ්නයක් නැහැ. ඒ න්‍යාය පත්‍රය අපි ඒ විධියටම යනවා.

ඊත් එක්කම තවත් කාරණයක් මට සිහිපත් කරන්න තිබෙනවා. ඒ සම්බන්ධව න්‍යාය පත්‍රයක් අපි ඔබතුමන්ලාට ලැබෙන්නට සලස්වනවා. සමහර විට තැපෑලෙන් නොලැබුණොත් එහෙම ඒ ගැන එපමණ සලකා හරින්න එපා. අපි දුරකථන මාර්ගයෙනුත් ඔබතුමන්ලාව දැනුවත් කරන්න බලාපොරොත්තු වෙනවා. අපි න්‍යාය පත්‍රය තැපෑලෙන් එවනවා. නොලැබුණාය කියලා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

E-mail කරන්න පුළුවන් නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පුළුවන්. එවන්න පුළුවන්. කිසි ප්‍රශ්නයක් නැහැ.

මීළඟට මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[ අ.භා. 12.48 ]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමිය ගෙනා යෝජනාව සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව සලසා දීම ගැන. මම හිතුවා, මට කථා කරන්න වෙන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයේ ඉන්න කොට කියලා. මම සතුටු වෙනවා, කාන්තාවන්ගේ අයිතිවාසකම් ගැන වඩාත් උනන්දු වන ගරු සභාපතිතුමා මූලාසනාරූඪව සිටින වෙලාවේ කාන්තා අයිතිවාසිකම් ගැන කථා කරන්න අවස්ථාව ලැබීම ගැන.

ගරු සභාපතිතුමනි, නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමිය පටන් ගන්න කොටම කිව්වා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මාධ්‍යවල එහෙම ලියන්න එපා ඔය කියන දේවල්.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අර මැක්සිම් ගෝර්කි කියපු කාරණය. ලෝකය පවතින්නේ හිරුගේ රශ්මියෙන් සහ මවුගේ කිරිවලින් කියලා. මම හිතන්නේ, මැක්සිම් ගෝර්කි කියපු එක ඉතාම හොඳට වැළඳගත්ත පෙරදිග රාජ්‍යයක් විධියට අපේ රාජ්‍යය හැමදාම අම්මාට සැලකුවා. අම්මා කියලා කියන්නේ කාන්තාවක්. ඒ නිසා කාන්තාවන්ට සලකන්න මේ සමාජයට අමුතුවෙන් කියලා දෙන්න ඕනෑ නැහැ. මේ සමාජයේ ඒක, තමන්ගේ සමාජ පුරුද්දෙන්ම දැනගෙන හිටියා. ගරු සභාපතිතුමනි, මේ දවස්වල අපේ මේ සමාජය අධ්‍යයනය කරන කොට අපි දකින කාරණාවක් තමයි, යහපාලන රාජ්‍ය ගොඩ නගන්න මැදිහත් වුණු අය යහපාලනය රාජ්‍යය විවේචනය කරන බරපතළ තත්ත්වයක් සමාජය තුළ අධ්‍යයනය කිරීම. අපි දැක්කා, විජයදාස රාජපක්ෂ ඇමතිතුමා යහපාලන ආණ්ඩුව විවේචනය කරනවා. අපි දැක්කා, යහපාලන ආණ්ඩුව ගොඩ නගන්න කටයුතු කරලා, යහපාලන ආණ්ඩුවේ පළමුවැනි දින 100 හරියටම ක්‍රියාත්මක වෙනවාද කියලා සොයලා බලන්න පත් කරපු විධායක කමිටුවේ හිටපු ජනතා විමුක්ති පෙරමුණ ගිය සතියේ යෝජනාවක් දාලා, විරෝධතාවයක් පවත්වන්න බැහැ. දෙකේ දෙකේ පොලුවලින් ගහනවාය කියලා ආණ්ඩුව විවේචනය කළා. නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමියත් අපි දන්නා විධියට මේ යහපාලන ආණ්ඩුව හදන්න විශාල විධියට දර දිය ඇදපු කෙනෙක්. එතුමිය අද මේ යහපාලන ආණ්ඩුව විවේචනය කිරීමේ ඉඟියක් මේ යෝජනාව ඇතුළේ ඇතුළත් කරලා තිබෙනවාය කියන විශ්වාසය තමයි මට තිබෙන්නේ. මොකද, වර්තමානයේ කාන්තාවන්ට හිරිහැර වෙනවාය කියලා තමයි එතුමිය කියන්නේ.

ගරු සභාපතිතුමනි, මම පෞද්ගලිකව විශ්වාස කරනවා. ඕනෑම සමාජයක කාන්තාවකගේ අයිතිවාසිකම් වාගේම පිරිමින්ගේ පෞරුෂයත් රැකිලා තිබුණොත් තමයි සමාජය යහපත් සමාජයක් වෙන්නේ. මේ යෝජනාව ඇතුළේ කාන්තාවන්ගේ අයිතිවාසිකම් කථා කරන්න ගිහිල්ලා, රටේ පිරිමින්ගේ පෞරුෂය බරපතළ විධියට හීන වෙලා තිබෙනවාය කියලා තමයි මගේ පෞද්ගලික විශ්වාසය. එතුමිය මේ යෝජනාව ගෙනාවාට පස්සේ මේ යෝජනාවට සංශෝධනයක් විධියට ආනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා ගෙනාවා මේ BBC කථාව අයින් කරන්නය කියලා. අපි දන්නේ නැහැ BBC ය මෙවැනි අධ්‍යයනයක් කරලා තිබෙනවාද කියලා. එහෙම කරලා තිබෙනවා නම් අපි කියනවා, ඒක ඉතාම ව්‍යාජ අධ්‍යයනයක් කියලා. මේ රටේ කාන්තාවෝ 75% ක් දූෂණයට ලක් වෙනවා නම්, හිරිහැරයට, ලිංගික අඩන්තේට්ටම්වලට ලක් වෙනවා නම්, ඒක බරපතළ ප්‍රශ්නයක්. ඒකේ අපේ අම්මත් ඉන්න පුළුවන්. අපේ නංගීත් ඉන්න පුළුවන්. මගේ සහෝදරියත් ඉන්න පුළුවන්. එහෙම තත්ත්වයක් අපි සමාජය ඇතුළේ දකින්නේ නැහැ. සිය දෙනෙක් ගත්තාම හැත්තෑ පහක් දූෂණය වෙනවා නම්, බස් එකක යන සිය දෙනෙකුගෙන් හැත්තෑ පහකට ලිංගික අඩන්තේට්ටම් වෙනවා නම්, ඒක බරපතළ තත්ත්වයක්. ඉතාම බේදනීය තත්ත්වයක්. නමුත් එහෙම තත්ත්වයක් මේ සමාජය ඇතුළේ තිබෙනවාය කියලා මම පෞද්ගලිකව විශ්වාස කරන්නේ නැහැ.

[ ගරු මහේෂ් අල්මේදා ]

ඒ වාගේම එතුමිය ගෙනෙන උදාහරණය. කොටකෙතන ඝාතනය කාන්තාවෝ ඉලක්ක කර ගෙන සිද්ධ වුණාය කියන එක එතුමියට මේ සමාජය පිළිබඳව තිබෙන අවබෝධයේ ප්‍රශ්නයක් කියලා තමයි මගේ විශ්වාසය තිබෙන්නේ. තවම ඒ සම්බන්ධයෙන් නඩුවක් විභාග වෙනවා. ඒ සම්බන්ධයෙන් සමාජ විද්‍යාත්මක අධ්‍යයනය කිරීම් තවම සිද්ධ වෙනවා. ඒකේ විශාල දේශපාලන කාරණාවක් තිබුණා. ඒකේ විශාල සමාජයේ දූෂණය වීම පිළිබඳව කාරණාවක් තිබුණා. ඒක කාන්තාවෝ ඉලක්ක කර ගෙන සිද්ධ වුණු ඝාතනයක් නොවෙයි. ඒක වෙනත් ව්‍යසනයක්. ඒක සමාජය කඩා වැටීමක්. සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා කථා කරද්දී කිව්වා, මේ සමාජයේ කඩා වැටීම තමයි මේ හරහා සිද්ධ වෙන්නේ කියලා. මේ යහපාලන රජය යටතේ, නීතියේ ආදිපත්‍ය පිරිහිලා තිබෙනවාය කියලා තමයි එතුමිය කියන්නේ. මේ යහපාලන රජය යටතේ කාන්තාවන්ට වාගේම පොලීසිය අතින්, කාන්තාවන් වෙනුවෙන් නොවෙයි. සමාජයේ සියලු දෙනා වෙනුවෙන් නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැයි කියලා තමයි එතුමිය කියන්නේ. ඒ වාගේම සාමාන්‍ය අහිංසක මිනිස්සුන්ට ගහන පොලිස්පතිවරයෙක් හරහා පොලීසියේ ගිහිල්ලා පැමිණිල්ලක් විභාග කර ගන්න සාධාරණය නැහැයි කියලා තමයි එතුමිය කියන්නේ. ඒ නිසා මේ ආණ්ඩුව යටතේ සිද්ධ වුණු කඩා වැටීම තමයි මේ කියන්නේ. ඒ ඛේදවාචකය ගැන ඉඟියක් තමයි මේ කරන්නේ. ඒ නිසා මේකට වෙනම පොලිස්පතිවරු දාලා, කාන්තාවන් වෙනුවෙන් කටයුතු කරන්න පොලීසි හදලා වැඩක් නැහැ. සමාජ ක්‍රමය වෙනස් කිරීමක් සිද්ධ කරන්න ඕනෑ. මේ සමාජය කඩා වට්ටන්න හදපු තැන් වෙනස් කරන්න ඕනෑ. ඒක තමයි එතුමිය යෝජනා කරන්නේ. ඒකට අපි එකඟයි. කිසි ප්‍රශ්නයක් නැහැ. ඒක තමයි වෙන්න ඕනෑ. ඒකට අපි එකඟයි. ඒ කාරණය ගැන අපේ සතුටක් තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වගන්තියේ කියනවා, සෑම පුරවැසියෙකුටම සමානව සැලකිය යුතුය කියලා. ඒ නිසා කාන්තාවෝ කියන කාරණය හුදෙකලාව අරගෙන වෙන් කරලා අරගෙන වෙනම සාකච්ඡා කරන්න පුළුවන්කමක් නැහැ. ඒ වාගේම පුරුෂයෝ කියන කාරණයත් වෙනම අරන්, වෙනම සාකච්ඡා කරන්න පුළුවන් විධියක් නැහැ. සමස්ත සමාජයකට තමයි නීතිය පොදු වෙන්න ඕනෑ. සමස්ත සමාජයකට තමයි නීතිය සාධාරණව තිබෙන්න ඕනෑ. ඒ නිසා සමස්ත සමාජයේ නීතිය කඩාගෙන වැටෙනවා නම්, ඒක වෙනස් කරන්න ක්‍රමයක්, විධියක්, රටාවක් අපි හදා ගන්න ඕනෑ. ඒකට කාලය එළඹිලා තිබෙනවා. ඒ ගැන කිසිම තර්කයක් නැහැ. අද අපි දකින්නේ ඒකේ අඩුවක්. ඒ අඩුව තමයි මේ සමාජයේ පුපුරා යෑම තුළ පේන්න තිබෙන්නේ. විජයදාස රාජපක්ෂ ඇමතිතුමා කියන්නේ ඒක. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා ගිය සතියේ යෝජනාවක් ගෙනැල්ලා කිව්වේ ඒක. මම විශ්වාස කරනවා, නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමියත් ඒ යෝජනාව තමයි මේ කාරණය හරහා කියන්නේ. ඒ නිසා එතැනට යන්න අපි සූදානම්. ඒ නිසා එතැනට යන්න අවශ්‍ය පරිසරය නිර්මාණය කරන්න අපි සූදානම්. ඒ වෙනුවෙන් මේ සමාජය වෙනස් කරන්න අපි සියලු දෙනා පෙළ ගැසිය යුතු කාලය ඇවිල්ලා තිබෙනවාය කියලා තමයි එතුමිය කියන්නේ.

ගරු සභාපතිතුමනි, මේ BBC ආයතනය කළාය කියන සමීක්ෂණය හරහා අපි දන්නවා, මේ රටේ කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින විවිධ රාජ්‍ය නොවන සංවිධාන තිබෙනවා. ඒ රාජ්‍ය නොවන සංවිධාන මේ කාන්තාවෝ වෙනුවෙන්, අයිතිවාසිකම් වෙනුවෙන් කථා කරනවාය කියලා ලෝකයේ බොහෝ රටවල්වලින් මුදල් මේ රට ඇතුළට ගෙන්වා ගන්නවා. මේ කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින මේ කාන්තා සංවිධාන ඇතුළේ බරපතළ විධියට කාන්තාවෝ හිරිහැරයට, ලිංගික අඩන්තේට්ටම්වලට ලක් වෙනවා. මේ සංවිධාන මුදල් උපයා ගැනීම සඳහාත්, තමන්ගේ ලිංගික අවශ්‍යතාවයන් ඉෂ්ට කර ගැනීම සඳහාත් තමයි මෙවැනි සංවිධාන බිහි කර ගෙන යන්නේ. මේ යෝජනාව හරහා නැවත වතාවක් උත්සාහ කරන්නේ කාන්තා විමුක්තිය වෙනුවෙන්, කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් යම් සංවිධානයක් ගොඩ නගා ගෙන, ඒක ජාත්‍යන්තරයට ගෙනිහිල්ලා, මේ රට අපකීර්තියට පත් කරමින් මුදල් ඉපයීමේ ක්‍රියාමාර්ග තිබෙනවාද කියන සැකයත් මේ යෝජනාව ඇතුළේ මතු වෙනවාය කියන කාරණය අපට මතක් කරන්න ඕනෑ. අපි දන්නේ නැහැ. අවංකව වෙන්න ඇති එතුමිය මේ යෝජනාව ගේන්න ඇත්තේ. නමුත් ඒකේ ව්‍යංගයෙන් මේ කාරණාව සැඟවිලා තිබෙනවා. ඒ නිසා

මේක බරපතළ තත්ත්වයක්. මේ රටේ සමාජය කඩා වැටිලා කියලා ලෝකයට කියන්න හදන යෝජනාවක් මේක. මේ රටේ නීතිය කඩා වැටිලා කියලා ලෝකයට කියන්න හදන යෝජනාවක් මේක.

ඒ නිසා මේ රටේ ආණ්ඩුව, මේ රටේ ආණ්ඩුව නියෝජනය කරන මේ පළාත් සභාව තුළ සිටින මන්ත්‍රීවරු සියලු දෙනා වඩා බරපතළ විධියට මේ කාරණය ගැන හිතන්න ඕනෑය කියලා මම විශ්වාස කරනවා. තමන් නියෝජනය කරන ආණ්ඩුවේ අඩුව තමයි මේ කියන්නේ. ඒ ආණ්ඩුවේ වෙනස් වීම, ආණ්ඩුවේ කඩා වැටීම තමයි මේ කියන්නේ. ඒ නිසා මේ යෝජනාවෙන් ආණ්ඩුවේ නීති පද්ධතියේ, රටේ සාධාරණත්වයේ යම් බිඳ වැටීමක් තිබෙනවාය කියන කාරණය කියනවා නම්, ඒක සම්බන්ධයෙන් අපට එකඟ වෙන්න පුළුවන්කම තිබෙනවා. ඒ නිසා අපි මේ වෙලාවේ කියනවා. කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් විතරක් නොවෙයි. රටේ සමස්ත ජනයාගේ අයිතිවාසිකම් වෙනුවෙන්, රටේ හැමෝගේම, දරුවන්ගේ වෙන්න පුළුවන්. පිරිමින්ගේ වෙන්න පුළුවන්. කාන්තාවන්ගේ වෙන්න පුළුවන්. මේ හැමෝගේම අයිතිවාසිකම් වෙනුවෙන් ඉතාම සාධාරණ වට පිටාවක් ගොඩ නගා ගන්න මැදිහත් වෙන්න, බල කරන යෝජනාවක් බවට මේ යෝජනාව පත් වෙනවා නම්, මේ යෝජනාවට එකඟ වෙන්න පුළුවන්කම තිබෙනවා. එහෙම නැත්නම් මේ යෝජනාව ඇතුළේ යම් ව්‍යංගයෙන් ගෙනෙන කාරණා තිබෙනවා නම්, කිසිසේත්ම මේ යෝජනාවට එකඟ වෙන්න පුළුවන්කමක් නැහැ. BBC ය කරන හෙළිදරව්ව, කරුණු කාරණා ඇතිව මේ සභාවට ඔප්පු කරලා පෙන්වන්න පුළුවන් නම්, මේ සමාජය ඇතුළේ කාවද නියැදි විධියට පාවිච්චි කළේ මේ සමීක්ෂණය කරන්න. ඒ නියැදි හරහා මතු වුණු තොරතුරු මොනවාද? හෙළිදරව් කරපු කාරණා මොනවාද? ඒ සියල්ල සංඛ්‍යාත්මකව විග්‍රහ කරමින් කියනවා නම් මේ යෝජනාවට පදනම විධියට අපට පුළුවන් මේ කියන කාරණාව පිළිගන්න. එහෙම නැතිව කරන යෝජනාවක් නම් මේක රටට කරන අපකීර්තියක්. ඒ වාගේම මේ රටේ පුරුෂයන්ට කරන, ඔවුන්ගේ පෞරුෂයට කරන විශාල හානියක්. මොකද, කාන්තාවක් හිරිහැරයට පත් වෙන්න පුළුවන්කම තිබෙන්නේ මේ කියන විධියට පුරුෂයෙකු අතින්. රටේ, සමාජයේ පුරුෂයෝ 75% ක් කාන්තාවෝ දූෂණය කරන පිරිමින් නම්, ඒ රටේ සමාජය ගැන විශාල වැරදි පින්තූරයක් ලෝකයට, සමාජයට යන්න පුළුවන්කම තිබෙනවා. ඒ නිසා ඒ තත්ත්වය වළක්වා ගැනීමට මේ යෝජනාව වෙනුවෙන් ක්‍රියාමාර්ග ගැනීමත් කළ යුතුව තිබෙනවා. එහෙම නැත්නම් සමස්ත සමාජයටම මේ යෝජනාවෙන් ලොකු පහරක් වදිනවාය කියන කාරණය මතක් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තුතියි. මේ අවස්ථාවේදී හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Hector Bethmage M.P.C took the Chair*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මම ස්තුතිවන්ත වෙනවා, මේ අවස්ථාවේදී මූලාසනාරූඪ වීමට ලැබීම පිළිබඳව. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ඉතාමත් සුවිශේෂී, අර්ථවත්, ඒ වාගේම අභියෝගාත්මක කථාවක් කළා. ඒ පිළිබඳව මම මගේ ප්‍රසාදය මූලාසනාරූඪ වූ විගසම කිරීම මගේ යුතුකමක් හැටියට මම සලකනවා. ඒ වාගේම එතුමා කිව්වා, විශේෂයෙන් කාන්තාවන් කෙරෙහි විශේෂ උනන්දුවක් දක්වන. ඒ වචනය අර්ථ නිරූපනය වෙනවා හරිද දන්නේ නැහැ. විශේෂ උනන්දුවක් දක්වන මන්ත්‍රීවරයෙකු හැටියට ඒ කථාව කිරීමට ලැබීම වාසනාවක් කියලා. ඒ කථාවක් කිරීමේ වාසනාව මට ලැබුණේ නැහැ. නමුත් මූලාසනාරූඪ වීම පිළිබඳව මට පොඩි අවස්ථාවක් ලැබෙනවා. ඉතින් මම හිතනවා, අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාත්, අපිත් ඔක්කොම කාන්තාවන් පිළිබඳව විශේෂ උනන්දුවෙන් කටයුතු කරන සභාවක ඉන්න මන්ත්‍රීවරු හැටියට මේ අවස්ථාවේ මූලාසනාරූඪ වීමට ලැබීමත්, විශේෂයෙන් නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමියට - එතුමියත් ආකර්ශනීය මන්ත්‍රීවරියක්. අපි සියලු දෙනාගේම වාසනාවක් කියලා සලකලා මම සභාව මෙහෙයවන්න බලාපොරොත්තු වෙනවා. මීළඟට ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[ අ.භා. 01.00]

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින මෙම යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව අපේ නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමියට ස්තුතිවන්ත වෙනවා. මම හිතන්නේ, කාන්තාවන්ට වන හිංසා පීඩාවන් අතරතුර මම හිතන්නේ විවිධ - ඔහු මානුෂිකත්වයෙන්, එහෙම නැත්නම් කායික මට්ටමෙන්, ඒ වාගේම ලිංගිකත්වයෙන් නොයෙකුත් ආකාරයෙන් මම හිතන්නේ කාන්තාවන් විවිධ ආකාරයට අද ලෝකය තුළ ඔවුන්ට නොයෙකුත්, නොයෙකුත් ප්‍රශ්නවලට මුහුණ දීමට සිදු වෙනවා. අපි දකිනවා, මේ වන කොට පසුගිය කාල වකවානුව තුළ මේ කාන්තාවන් පිළිබඳව නොයෙකුත් විද්‍යුත් මාධ්‍ය, පුවත්පත් මාධ්‍ය තුළින් මේ කාන්තාවන්ට වන හිංසා ගැන කථා කරලා, අවසානයේ අපි දකිනවා, සමහරුන්ට පමණක් දඬුවම් කරනවා. සමහරුන්ට පමණක් දඬුවම් නොකර ඉන්නවා. මේක මම හිතන්නේ, දූප්පතාට එක විධියක්. සල්ලිකාරයාට එක විධියක්. ඒ විධියට තමයි මේ නීතිය ක්‍රියාත්මක කරලා තිබෙන්නේ. ඒ නිසා අපි දකිනවා, කොතෙකුත් දේවල් කථා කරත්, කාන්තාවන් පිළිබඳව, අපේ ආදරණීය අම්මා ගත්තාම අම්මා හා සමානව ආදරණීය බිරිඳ ඇතුළු අනෙකුත් කාන්තාවන්ට මම හිතන්නේ සමස්ථයක් විධියට අපි පෞද්ගලිකව ඔවුන්ට ආදරය කරනවා. ඒ ආදරය කිරීමක් තුළ අපි ඔවුන්ට අයිතිවාසිකම් දිනා දෙන්න අවශ්‍ය විධියට කටයුතු කරනවා.

හැබැයි, මේ සියලු කථා කරපු මන්ත්‍රීවරු කථා කළා. කාන්තාවන්ට වන හිංසා, ඒ වාගේම ඔවුන් ආරක්ෂා කිරීම. මෙතුමියගේ යෝජනාව අනුව අවශ්‍ය කරන එතුමිය ඉල්ලා සිටින්නේ, මම හිතන්නේ පොලිස් ස්ථානයක් අලුතින් ස්ථාපිත කරලා මේකට අවශ්‍ය කරන කටයුතු. මම හිතන්නේ, අලුතින් පොලීසියක් නොවෙයි. මේ පොලීසියට අවශ්‍ය කරන, ශ්‍රී ලංකා පොලීසියේ කාන්තා විමර්ශන අංශයක් වෙනම තිබෙනවා. මේවාට අවශ්‍ය කරන ශක්තිය ඔවුන් ලබා දෙනවා. හැබැයි, සමහර අවස්ථාවලදී අපි දැකලා තිබෙනවා, මේ හිංසාවට පත් වන කාන්තාව පොලීසියට ගියාම, එහෙම නැත්නම් තමන්ගේ ස්වාමියා හිර ගෙදර ඉන්නවා නම්, ඒ හිර ගෙදරට ගියාට පස්සේ ඒ හිර ගෙදරදී ඒ ඉන්න නිලධාරීන්ගෙන් - ආපසු බැලුවාම නොයෙකුත් ආකාරයෙන් ඒ කාන්තාවට යම්කිසි කරදරයක් ඇති වෙන්න ඉඩ තිබෙනවා. හැබැයි, මේක සමහරුන්ට, ඔක්කෝටම නොවෙයි. මෙතුමිය කථා කරලා තිබෙනවා. මම හිතන්නේ 75% ක් කාන්තාවන්ට මේ වන කොට කරදර වෙනවාය කියලා. අර මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, මම අත් දෙකම උස්සලා එතුමාගේ ඒ කථාව අනුමත කරනවා. මොකද හේතුව, අද මෙවන් අපේ රටට, අපේ සිංහල බෞද්ධ සංස්කෘතියට අනුකූලව මම හිතන්නේ කටයුතු කරන කොට ගරු වැඩ බලන සභාපතිතුමනි, අපි දකිනවා පාසල්වල ගුරුවරු දරුවන්ව අපයෝජනයට පත් කරනවා. එහෙම නැත්නම් විවිධ ස්ථානවල ඉන්න ආයතන ප්‍රධානීන්. එහෙම නැත්නම් රාත්‍රී සමාජ ශාලා. නොයෙකුත් ආකාරයට වෙනවා. හැබැයි, බටහිර සංස්කෘතියත් එක්ක අපි බැඳුනාට පස්සේ තමයි මේ සියල්ල අපේ සංස්කෘතිය විනාශ වෙන්න කටයුතු සිදු වුණේ කියලා අපි දකිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි උදාහරණයකට ගත්තොත් අවුරුදු 60 ක වයසක තාත්තා කෙනෙක් පාරේ යනවා. අවුරුදු 60 ක අම්මා කෙනෙකු පාරේ යන කොට එදා කාල වකවානුව තුළත් අද කාල වකවානුව තුළත් සමහර කාන්තාවෝ ඇඳගෙන යන ඇඳුම දිහා බැලුවාට පස්සේ, මම හිතන්නේ ඔවුන්ගේ ඇඟ දිහා බැලුවාට පස්සේ, සමහර විට සම්පූර්ණයෙන්ම ඇඟ විනිවිදභාවයෙන් පේනවා. මේ ආච්චියි, සීයයි එතැනින් යන කොට මේ සීයා හොරෙන් හරි හැරිලා මේ කාන්තාව දිහා බලනවා. ඒ වාගේම තමයි මේ ඉන්න සියලුම මනුෂ්‍යයෝ. මේ ඔක්කොම ඇට, ලේ, මස්, නහරින් හැදිලා ඉන්නේ. පුරුෂයාගේ මනස විකෘති කරන්නේ කාන්තාව. කාන්තාව විසින් පුරුෂයන්ගේ මනස විකෘති කිරීමත් සමඟම ඔහුගේ මනස විකෘති වෙලා අතින් ඔවුන් සමහර අවස්ථාවලදී ඒ කාන්තාව දූෂණයට පත් වෙනවා. එහෙම නැත්නම් දරුවෙකු දූෂණයට පත් වෙනවා. ඒ නිසා මේකත් වගකිවයුතු ප්‍රශ්නයක් බවට අද කාන්තාව හැඩ ගැස්විය යුතු කාලය ඇවිල්ලා තිබෙනවා. අපි පන්සලට යන කොට, පල්ලියට යන කොට, කෝවිලට යන කොට සමහර විධියට මේ කාන්තාව ඇඳගෙන යන ඇඳුමේ, එහෙම නැත්නම් ගෙදර දොර ඉන්න විලාශය අනුව තමයි ප්‍රදේශය තුළ ඉන්න කාන්තාව නොයෙකුත් ආකාරයෙන් විනාශයට පත් වෙන්නේ. සමහර විට මම හිතන්නේ, තමන්ගේ දරුවාව. සාමාන්‍යයෙන් අද දරුවෙකු ඉක්මණින් ඇඟ ටිකක් උස මහතට හැදෙනවා නම් ඒ දරුවාගේ අන්දන ඇඳුම ගෙදර ඉන්න අම්මා, තාත්තා ඒක දැන ගන්න ඕනෑ මේ දරුවාට මොන විධියට ඇඳුම අන්දවන්න ඕනෑද කියලා.

අන්න ඒ තුළින් තමයි අද සමාජය විනාශ වෙලා යන්නේ. ඒ නිසා අපි දකිනවා. අපි ප්‍රදේශයක් තුළ, සංචාරක ව්‍යාපාරයක් තුළ අපි ඉන්න කොට අපි දැකලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ ප්‍රදේශය තුළ විවිධ සංචාරකයෝ ඇවිල්ලා, මම හිතන්නේ අවුරුදු 65 ක් 75 ක් වන මේ වයස ආච්චිලා අවුරුදු 30, 35 කොල්ලොත් එක්ක කසාද බඳිනවා. මේක මම හිතන්නේ නොයෙකුත් ආකාරයේ බටහිර සංස්කෘතියත් එක්ක අපේ තිබෙන බැඳීම තුළින් තමයි මේ දේවල් සිදු වෙලා තිබෙන්නේ. ඒ වාගේම තමයි. පාසල් දරුවන්ගේ අතේ තිබෙන මේ හැන්ඩ් ෆෝන් එක දිහා බැලුවාම අද ජාත්‍යන්තර ජාලයත් එක්ක එකතු වුණාට පස්සේ මම හිතන්නේ, අවුරුදු 60, 70, 80 කට එහා පැත්තේ නොදැකපු දේවල් අද මේ ෆෝන් එක ඇතුලේ තියා ගෙන මේ චූටි දරුවෝ බලලා, අද පාසල් යන දරුවෝ මහා පරිමාණයෙන් විනාශයට පත් කරලා තිබෙනවා. හැබැයි, ගෙදර දොරේ ඉන්න අම්මා තාත්තා දන්නෙත් නැහැ. නමුත් අලුත් අලුත් ක්‍රමවේද සොයා ගෙන යන්න, අලුත් අලුත් දේවල් සොයා ගෙන යන්න, අලුත් අලුත් මත්ද්‍රව්‍ය සොයා ගෙන යන්න මම හිතන්නේ කටයුතු කරනවා. අද ඒවා කරන්නේ මහා පරිමාණයේ ව්‍යාපාරිකයෝ. ඒවා පොලීසිය ඇල්ලුවාට පස්සේ, ඒවා යට ගහනවා. ඒ වාගේම තමයි ඒක කරන්න එක්කෝ පොලීසියේ ලොක්කෙක් සම්බන්ධ වෙනවා. අද කසිප්පු විකුණන මිනිහාත් එක්ක පොලීසිය සම්බන්ධ වෙලා තිබෙනවා. සූරා බදු එක සම්බන්ධ වෙලා තිබෙනවා. එහෙම නැත්නම් මත්ද්‍රව්‍ය විකුණන මිනිහාත් එක්ක පොලීසිය සම්බන්ධ වෙනවා. එහෙම නැත්නම් කුඩු විකුණන මිනිහාත් එක්ක පොලීසිය සම්බන්ධ වෙලා මේක මහා පරිමාණයෙන් ගිහිල්ලා අද රාත්‍රී සමාජ ශාලාවල කාන්තාවෝ එළි වෙනකල් නටන්න, එහෙම නැත්නම් පාසල් යන දරුවන්ට මත් පෙති දාලා පෙත්තක් දීලා ඒ දරුවාව විනාශ කරන්න පුළුවන් වැඩ සටහන් මේ රට තුළ වෙන්නේ. සමහර විට මේ සිංහල ජාතිය වඳ කර ගෙන යන්න තමයි. කටයුතු කරන්නේ. ඒ නිසා මෙන්න මේ කටයුත්ත නිසා අද කාන්තාවන් බොහෝ දුරට මම හිතන්නේ විනාශයට පත් වෙනවා. අපි මෙතුමියගේ යෝජනාවට එකඟ වෙනවා. හැබැයි, මේ කියන ජාත්‍යන්තර BBC වෙබ් අඩවියෙන් ගත්ත 75% ක් කියන කාරණය පිළිගන්නේ නැහැ. අවුරුදු දෙකක කාලය තුළ මේ පවතින රජය තුළින් ක්‍රියාත්මක වන වැඩ සටහන් හරියට ක්‍රියාත්මක වෙනවා නම් - මත් ද්‍රව්‍ය, මත් කුඩු, කසිප්පු වැනි සියලු දේවල් මේ රටට මේ අවුරුදු දෙකක් තුනක් ඇතුළත මහා පරිමාණයෙන් ගෙන ඒම නිසා තමයි අද ඒවා පරිහානියට පත් වෙලා තිබෙන්නේ. විනාශයට පත් වෙලා තිබෙන්නේ, කියලා මතක් කරමින් ගරු මන්ත්‍රීතුමියගේ යෝජනාවේ අපි අවශ්‍ය දේට පමණක් සහයෝගය දෙනවා. අනවශ්‍ය දේ කපා හැරලා. බොහොම ස්තූතියි.

[ අ.භා. 01.07]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමිය කාලීන වශයෙන් වැදගත් යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. එය මේ සභාවේ සංවාදයට ලක් කිරීම ඉතාම කාලෝචිතයි. වැදගත් කියලා මම කල්පනා කරනවා. විශේෂයෙන්ම එතුමියගේ මේ යෝජනාවේ සඳහන් පරිදි ශ්‍රී ලාංකීය සමාජය ඇතුළේ කාන්තාවට සුවිශේෂ තැනක් හිමි වී තිබෙනවාය කියන එක පිළිබඳව විවාදයක් නැහැ. මේ මොහොත වන කොට අපේ සමාජය තුළ සෑම ක්ෂේත්‍රයකම කාන්තාව බලාත්මක වෙලා තිබෙනවා. සමාජයීය වශයෙන්, ආර්ථිකමය වශයෙන්, දේශපාලන වශයෙන් සෑම ක්ෂේත්‍රයකම පරිපාලනය, අධ්‍යාපනය ඇතුළු සෑම ක්ෂේත්‍රයකම අපේ කාන්තාව බලාත්මක වෙලා තිබෙනවා. අපි කිසිසේත් අපේ කාන්තාව කුස්සිය ඇතුලේ හිර කර තබන්න, ගෘහය ඇතුලේ හිර කර තබන්න කටයුතු කරලා නැහැ. කාන්තාවට ඒ ලබා දිය යුතු නිදහස අපි ලබා දීලා තිබෙනවා. ඒ නිදහස නිසා තමයි කාන්තාව පරිපාලන ක්ෂේත්‍රයේ, අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඒ විතරක් නොවෙයි දේශපාලන ක්ෂේත්‍රයේත්, ආර්ථිකමය ක්ෂේත්‍රයේත් සුවිශාල කාර්යභාරයක් ඉෂ්ට කරන භූමිකාවක් ඉෂ්ට කරමින් තිබෙන්නේ. ඒ නිසා කාන්තාවට ඒ නිදහස හිමි වීම තුළම අද මේ විවෘත සමාජය තුළ කාන්තාව සෑම ක්ෂේත්‍රයකම අද පොර බදන්න පටන් අරගෙන තිබෙනවා. ඒ පොර බැදීම තුළම කාන්තාවත් සමඟ අද සමාජය තුළ යම්කිසි ආකාරයක ගැටුම්කාරී තත්ත්වයන් ඇති වෙලා තිබෙනවා. ඒක අපි පිළිගත යුතුයි. ඒකෙන් අදහස් කරන්නේ නැහැ කාන්තාව අනාරක්ෂිතයි කියලා. කාන්තාව ඒ සෑම ක්ෂේත්‍රයකම තරගකාරීව ඉස්සරහාට යනවා. ඒ තුළ පිරිමියා වාගේම කාන්තාවත් යම් යම් ගැටළුවලට මුහුණ දෙනවා. ඒ නිසා අපි තේරුම් ගන්න ඕනෑ. මේක ඇතුළේ කාන්තාව සුවිශේෂ ප්‍රශ්නයකට මුහුණ දෙනවාය කියලා අපි

[ ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ]

කල්පනා කළොත් ඒක ඇතුළේම මේ සමාජය බෙදීමක් ඇති වෙනවා. එහෙම නම් සමාජය ඇතුළේ සුරක්ෂිතභාවය ඇති කර ගැනීමයි අවශ්‍ය වෙන්නේ. සමාජීය සුරක්ෂිතභාවය තහවුරු කර ගන්න පුළුවන් නම් ඒක ඇතුළේ බාල, මහලු, කාන්තා, ළමා කියලා මේ සියලු දෙනාටම ආරක්ෂාව සැලසෙන සමාජ සුරක්ෂිතතාවය තහවුරු වන ආකාරයේ සමාජයක් නිර්මාණය කර ගැනීමයි අවශ්‍යයි. ඒ සඳහා නීති සම්පාදනය කර ගන්න ඕනෑ. අවශ්‍ය ආයතන සම්පාදනය කර ගන්න ඕනෑ. ආකල්පවල වෙනසක් ඇති කර ගන්න ඕනෑ. ඒ වාගේම තමයි කාන්තාව තව තවත් සමාජය තුළ බලාත්මක කරන්න අවශ්‍ය කරන දහමක් තමයි අපේ රට තුළ තිබෙන්නේ. බුදු දහමිනුයි කාන්තාවන්ට ඒ විමුක්තිය උදා වුණේ. ඒ නිසා කාන්තාවන්ට ඒ විමුක්තිය උදා කරපු, කාන්තාව සමාජයේ කොන් කරලා තියන්නේ නැතිව සමාජ පත්ලේ තියන්නේ නැතිව ඔවුන් ගෘහය ඇතුළේ, කුස්සිය ඇතුළේ හිර කරලා තියන්නේ නැතිව, පවුල ඇතුළේ හිර කරලා තියන්නේ නැතිව ඔවුන්ට අද නිදහසේ තමන්ගේ හැකියාව, කුසලතාවය, දක්ෂතාවය මත ඉදිරියට යන්න පුළුවන් සමාජයක් අපි නිර්මාණය කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා විශේෂයෙන්ම මම කියන්න කැමැතියි. අද ලෝකයේ විවිධ මාධ්‍ය ආයතන වෙන්න පුළුවන්, ඒ වාගේම විවිධ රාජ්‍ය නොවන සංවිධාන වෙන්න පුළුවන්. මේවා හරහා විවිධ වාර්තාවන් ඉදිරිපත් කරනවා. ඒ වාර්තාවල සත්‍ය අසත්‍යතාවය තහවුරු කර ගන්න පුළුවන්කමක් නැහැ. මෑත කාලයේදී අපි දැක්කා ඇමරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ ආගමික නිදහස පිළිබඳව වාර්තාවක් නිකුත් කළා. ඒ ආගමික නිදහස පිළිබඳව වාර්තාවෙන් ශ්‍රී ලංකාවේ ජීවත් වන සුළු ජන ආගමික කොටස්වලට මේ රටේ බහුතර සිංහල බෞද්ධ ජනතාවගෙන් බෞද්ධ සංවිධානවලින්, බෞද්ධ භික්ෂූන් වහන්සේලාගෙන් හිරිහැර සිදු වෙනවාය කියලා සම්පූර්ණ පදනම් විරහිත, අසත්‍ය වාර්තාවක් නිකුත් කළා. එවැනි වාර්තාවලින් මේ රටේ කීර්තිනාමය කෙළෙසෙනවා. ඒ වාගේම තමයි ඇමරිකානු තානාපති කාර්යාලය පසුගියදා ශ්‍රී ලංකාවට එන ඇමරිකානු සංචාරකයින්ට අවවාද කර සිටියා. ශ්‍රී ලංකාවේ ත්‍රීවිල්වල යාමේදී ප්‍රවේශම් වෙන්න කියලා. ඒකෙන් මේ රටේ ත්‍රීවිල්වල රියැදුරන් පිළිබඳව වැරැදි ආකල්පයක් ඇති කළා. ඒ නිසා මම කියන්න කැමැතියි. මේ BBC වාර්තා වෙන්න පුළුවන්. ලෝකයේ වෙනත් රාජ්‍ය නොවන සංවිධානවල වාර්තා වෙන්න පුළුවන්. ඒ රටවල් දෙන වාර්තාවලින් ශ්‍රී ලංකාව පිළිබඳව මනින එක වැරැදියි. ඒ වාගේම මම කියන්න කැමැතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන් වෙමින් පවතිනවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

මට තව පොඩි කාලයක් දෙන්න. විශේෂයෙන්ම කියන්න ඕනෑ. අද අපි අවධානය යොමු කළ යුතු වන්නේ කාන්තාවන්ගේ ආරක්ෂාව පිළිබඳ කාරණයේදී අන්තර්ජාලය හරහා කාන්තාවන්ට සිදුවන ප්‍රචණ්ඩත්වය. ඒ වාගේම කාන්තාවන් ප්‍රාණ ඇපයට ගැනීම. කාන්තාවන්ට සිදුවන ලිංගික හිරිහැර යන ඒ කාරණා පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්න ඕනෑ. මේක අද ප්‍රධාන ප්‍රශ්නයක්. විශේෂයෙන් මෑත කාලයේ වැදගත් චිත්‍රපටි දෙකක් ඉදිරිපත් වුණා. මේ ප්‍රදර්ශනය වන ධර්ම යුද්ධය කියන චිත්‍රපටය සෑම කෙනෙක්ම නැරඹිය යුතු චිත්‍රපටයක්. ඒ වාගේම පැණි මකුළුවෝ චිත්‍රපටයත් ආවා. ඒ චිත්‍රපටය තුළිනුත් මේ අන්තර්ජාලය ඇතුළේ අද කාන්තාව මොනතරම් හිරිහැරවලට, පීඩාවට සහ ඒ වාගේම ප්‍රාණ ඇපයට ලක් වෙලා තිබෙනවාද කියලා පේනවා. ඒ නිසා අපි කියන්නේ මෙන්න මේ අන්තර්ජාලය තුළ සිදුවන අපරාධ පිළිබඳව සොයා බැලීම අවශ්‍යයි. එහිදී කාන්තාවෝ තමයි වැඩියෙන්ම මේකෙන් පීඩාවට පත් වෙන්නේ. ඒ නිසා නිරෝෂා අතුකෝරල ගරු මන්ත්‍රීතුමියගේ මේ යෝජනාවේ කාලීන වැදගත්කමක් තිබෙන එක පිළිබඳව අවධානය මේ සභාවේ යොමු විය යුතුයි කියන එක පවසමින් මම නිහඬ වෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි. මීළඟට විපක්ෂය වෙනුවෙන් සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට කාලය විනාඩි 07 යි.

[ අ.භා. 01.13]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීමනි, ඇත්ත වශයෙන්ම මේ විවාදය පැවැත්වෙද්දී මට කනගාටුවක් දැනුනා. මේ පළාත් සභාව කාන්තාවන් 06 දෙනෙක් නියෝජනය කරනවා. අපේ නිරෝෂා අතුකෝරල ගරු මන්ත්‍රීතුමියගේ යෝජනාවට සහාය දක්වන්නවත් අඩුම ගණනේ කාන්තාවෝ ටික මේ සභාවේ නැති එක ගැන අපි කනගාටු වෙන්න ඕනෑ. ඒ තමන්ගේ වගකීම. ඇත්තටම එතුමියන්ලාට මේකට ඇවිල්ලා සහභාගි වෙන්න කියලා ඔබතුමිය කථා කළේ නැද්ද? ඉතාම කනගාටුදායක තත්ත්වයක්. ඉතින් කොහොමද අපි කාන්තා අයිතිවාසිකම් ගැන කථා කරන්නේ? අපි 25% කට වැඩි කරන්න කථා කරනවා. දැන් අපි මේ කථා කර කර සිටියේ ඊළඟ පළාත් සභාවට 25% ක් කාන්තාවන් එනවා කියලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, එතුමියන්ලා විශ්වාස කරනවාද දන්නේ නැහැ, සියලුම අයිතිවාසිකම් ලැබිලා තිබෙන්නේ කියලා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම හිතන්නේ එහෙම එකක් වෙන්න ඇති මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඇත්තටම කනගාටු වෙනවා. අනික් එක අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගේ කථාව ගැනත් යම් කනගාටුවක් දැණුනා. එතුමා කිව්වා, මේ මෑත කාලයේ වුණු දේවල්, මේ යහපාලන ආණ්ඩුව යටතේ කියලා. ඒක කිසිසේත්ම පිළිගන්න බැහැ. හරිම කනගාටුයි. එතුමා භූමියේ යථාර්ථය අමතක කරලා කථා කළේ. කුරාම්ෂේක්ව මරලා එයාගේ පෙම්වතිය දූෂණය කරපු හැටි. අර මාතර සුනිල් මාතර 100 ක් දූෂණය කරලා පාටි දාපු එක. ඒ සියල්ල අමතක කරලා තමයි මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කථා කළේ. ඒ නිසා මේ යුගය පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි තිබෙන්නේ. ප්‍රස්තුථ කාරණය ඔයිට වැඩිය වෙනස් එකක් හැටියටයි මම කල්පනා කරන්නේ. අපි දන්නවා අපේ සංස්කෘතිය ඇතුළේ අපේ රට ගොඩනැගුණේ, අපේ සමාජය ගොඩනැගුණේ බුදු දහමත් එක්ක. බුදු දහමෙන් පෝෂණය වුණේ. ඒකේ ආලෝකයෙන් අපි මෙතරම් කාලයක් මෙහෙම ආවේ. විශේෂයෙන්ම කල්පනා කරනවා නම්, බුදුරජාණන් වහන්සේ භික්ෂුණී ශාසනයක් ආරම්භ කළේ ඇයි? භික්ෂුණී ශාසනයක් වෙනම කොටසක් ආරම්භ කරන්නේ ඇයි? ඒ කාන්තාවට දිය යුතු නියමිත ස්ථානය දෙන්න ඕනෑ නිසා. අපේ බෞද්ධ ඉතිහාසය බලන්න කෝ. මේ මහා දුරක් ගෙවා ගෙන ඉන්දියාවේ ඉඳලා ලංකාවට මේ බෞද්ධාගම ගෙනාවේ කවුද? බුදුරජාණන් වහන්සේගේ දළදාව ගෙනාවේ කවුද? ඒ වාගේම මේ සංඝමිත්තා මෙහෙණින් වහන්සේ එක්ක බණ අහලා, අර අනුලා දේවිය එක්ක ලංකාවේ පළමුවෙන්ම මේ අග්‍රඵලය ලබා ගත්තේ මේ රටේ කාන්තාවෝ. ඒ නිසා බෞද්ධ සංස්කෘතිය ඇතුළේ අපේ රටේ කාන්තාවට නිශ්චිත ස්ථානයක් දීලා තිබුණා. තැනක් දීලා තිබුණා. පිළිගැනීමක් දීලා තිබුණා. ඒක අපේ සංස්කෘතිය ඇතුළේ පෝෂණය වුණු, දීර්ඝ කාලයක් තිස්සේ අවුරුදු දහස් ගණනක් තිස්සේ පැවතිලා තිබුණු දෙයක්. හැබැයි, අද ඒ තත්ත්වය වෙනස් වෙලා. මේ වෙලා තිබෙන්නේ මොකක්ද? ඒ නිසා අපි මූලික වශයෙන් පිළිගන්න ඕනෑ දේ තමයි කාන්තාවගේ මාතෘත්තවය කියන එක. මාතෘත්වය පිළිගන්නවා නම් අපට එතැනින් එහා අපේ සමාජය ගොඩනඟන්න ඕනෑ ඒක ඇතුලේ. විශේෂයෙන් අපේ වාගේ රටවල මාතෘත්වය පදනම් කරගෙන තමයි අපේ සමාජය ගොඩනැඟිලා තිබෙන්නේ. ඒක ඇතුළේ අපේ අම්මා පිළිගන්න බැරි නම්, අපි තවත් කොහෙද මේ යන්නේ? ඒක නිසා මේක තේරුම් ගන්න ඕනෑ සංකල්පයක්. මේක BBC එකෙන් කරපු Research එකක්ද? මේක බටහිර රාමුව ඇතුලේ දාපු පර්යේෂණයක්ද කියන එක නොවෙයි. අපි භූමියේ යථාර්ථය කථා කරන්න ඕනෑ. පොලිසියක් විතරක් හැදුවාට වැඩක් නැහැ. විද්‍යා දැරියව ඝාතනය කරපු ඝාතකයාව ආරක්ෂා කළේ නියෝජ්‍ය පොලිස්පතිවරයෙක්. එහෙව් රටක අපි ජීවත් වෙන්නේ. ඒක නිසා මේක ඇතුළේ පොලීසිය හදලා කරන්න පුළුවන්ද කියන ප්‍රශ්නය මතු වෙනවා. අපි කල්පනා කරන්න ඕනෑ. අපි ඉතිහාසයෙන් පාඩම් ඉගෙන ගන්න ඕනෑ.

විශේෂයෙන් අපි දන්නවා, බෞද්ධ දර්ශනයේ සංයුක්ත නිකායේ එක් තැනක තිබෙනවා, කාන්තාවන් දුක් විඳින කාරණා පහක්. ඒ කාරණා පහ මොනවාද? යොවුන් වියේදී පති කුලයට යාම හා නෑදෑයන්ගෙන් වෙන්ව වාසය කිරීමට සිදුවීම. දෙක, මාසික ඍතු වීම. තුන, ගැබිණියක ලෙස දුක්

[ ගරු සුසිල් කිඳෙල්පිටිය ]

විඳීමට සිදුවීම. හතර, දරු උපතකට මුහුණ දීම. පහ, පුරුෂයෙකුගේ අත්පා මෙහෙවර කිරීමට සිදුවීම. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණා පහ හැරෙන්න විවාහ ජීවිතයෙන් පරිබාහිරව අපේ රටේ කාන්තාවට කොයිතරම් දුක් විඳින්න වෙලා තිබෙනවාද? දූෂණය, කාන්තාවන්ට එරෙහිව අපරාධ, ඒ වාගේම ප්‍රචණ්ඩත්වය, හිරිහැරය, එකී නොකී වද වේදනා දහසක් අපේ කාන්තාවට විඳින්න වෙලා තිබෙනවා. අපේ පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය වෙන්නෙත් 4% යි. මේක ඇත්ත. කාන්තා නියෝජනය වැඩි කළ යුතුයි. හැබැයි, කාන්තාවගේ සක්‍රීය දායකත්වය මීට වඩා ලැබිය යුතුයි කියලා මම නිරෝෂා අතුකෝරල ගරු මන්ත්‍රීතුමියට සිහිපත් කරන්න කැමැතියි.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් වැදගත් කාරණයක් මම මතු කරන්න කැමැතියි. මොකක්ද? අපේ රටේ ප්‍රධාන ආදායම් මාර්ග තුනක් ගැන කල්පනා කරලා බලන්න කෝ. පළමුවැනි එක, වතුවල සේවය කිරීම. වැවිලි කර්මාන්තය. දෙවැනි එක, ඇඟලුම් කර්මාන්තය. තුන්වැනි එක, මොකක්ද? මේ රටට වැඩිම ආදායම ලැබෙන ක්‍රමය. මැද පෙරදිග රැකියා. දැන් කල්පනා කරලා බලන්න. මේ තුනට මූලික වෙන්නේ කවුද කියලා. අපේ රටට වැඩියෙන්ම ආදායම් උපයා දෙන මේ කාරණා තුනට මූලික වන්නේ කාන්තාවයි. මම කියන්නේ මේ පොලීසි හදන එක නොවෙයි, ප්‍රතිපත්ති සම්පාදකයෝ මේ අංශයට අවධානය යොමු කරන්න ඕනෑ. මෙන්න මෙහෙම. ජාතික ආර්ථිකයට ඇගේ දායකත්වය අපි අගයනවාද? කිසිසේත්ම නැහැ. ඒ වාගේම මාතෘත්වය ඇගයීමට ලක් කරනවාද? කිසිසේත්ම නැහැ. අර මව්වරුන්ගේ දිනය හරි මොකක් හරි -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය තව විනාඩියයි තිබෙන්නේ. කාලය කළමනාකරණය කර ගන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මව්වරුන්ගේ දිනය හරි මොනවා හරි දිනයක් දාලා පොඩි සංදර්ශන වැඩක් කරන්න නම් අපේ රටේ නායකයන්, පාලකයන් උනන්දු වෙනවා. හැබැයි, මාතෘත්වය අගයන්නේ නැහැ. තුන්වැනි කාරණය, ගෘහණියක් විධියට කාන්තාව කරන කටයුතු ඇගයීමට ලක් කරනවාද? ඒත් නැහැ. ඒ කියන්නේ, ගෙදර ඇගයීමකුත් නැහැ. දරුවන්ගේ ඇගයීමකුත් නැහැ. අවසානයේ රාජ්‍ය විසින් පාලකයින්ගේ ඇගයීමකුත් කාන්තාවන්ට නැහැ. ඒ නිසා අපි තේරුම් ගන්න ඕනෑ අන්න ඒ සංකල්පයයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සාරධර්ම හා සාම්ප්‍රදායින් ආරක්ෂා වූ කාන්තා නිදහස හා සුරක්ෂිතභාවය නීතියෙන් විතරක් ආරක්ෂා කරන්න බැහැයි කියලයි මම තර්කය ගොඩනඟන්නේ. ඒ නිසා මේක ගැන අවධානය යොමු කරන්න. විශේෂයෙන් මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා මතු කළ කාරණයක් යළිත් සැරයක් මතු කරන්න මම කැමැතියි. සියලු දෙයට ජීවය අම්මා සහ හිරු එළියයි. ඒක අපි පිළිගන්නවා නම් අහස තරම් බර උසුලන අම්මා වෙනුවෙන් ගැහැණියට ගෞරව කරන සමාජයක් හැදිය යුතුයි. ඒ නිසා ඇගේ භූමිකාව ඇගයීමට ලක් කරන සමාජයක් හැදිය යුතුයි. ඒ සඳහා ප්‍රතිපත්ති සම්පාදනයකින් තොරව මේ වැඩේ කරන්න බැහැයි කියලා මේ සභාවට මතක් කර දෙමින් මගේ කථාව අවසන් කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, බොහොම ස්තුතියි. මීළඟට අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට කාලය විනාඩි 03 යි. විශේෂ ඉල්ලීම පිට ලැබිලා තිබෙන්නේ.

[ අ.භා. 01.20]

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමා විශේෂයෙන් කාන්තාවන් පිළිබඳව -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ආදරෙයි. ආදරෙයි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

උනන්දුවක් දක්වන මන්ත්‍රීවරයෙක් හැටියට මම දුන්නේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන්නේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාත්, අපේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාත් කිව්වා මේ ලෝකය බිහි වෙලා තිබෙන්නේ අම්මාගේ කිරෙන් සහ හිරු එළියෙන් කියලා. මම හිතන්නේ හැම කෙනෙක්ම කාන්තා හිංසනය ගැන කථා කළා. ඒකේ විශාල ප්‍රමාණයක් සත්‍යය. කාන්තාවට සම අයිතිය ලැබෙන්න ඕනෑ. මම දකින දෙයක් තමයි මේ කාන්තාවට වැඩියෙන්ම හිංසන වෙන්නේ කාන්තාවන් අතින්. හේතුව කාන්තාව කසාද බැඳලා ගියාට පස්සේ එදාට ඒ පුරුෂයාගේ අම්මා නැන්දම්මා වෙනවා. කාන්තාව ලේලි වෙනවා. බැඳලා ගියායින් පස්සේ කාන්තාවගේ අම්මාට, කාන්තාවට අමතක වෙනවා, මටත් අම්මා කෙනෙක් ඉන්නවා කියලා. මේ ස්වාමියාව මට අයිති වුණේ මේ අම්මා නිසා කියලා. අම්මා නැන්දම්මා වෙලා ඒ අම්මා නැන්දම්මා වශයෙන් මැරෙනකම්ම බහුතරයක් තැන්වල අර ලේලිගෙන් දුක් විඳිනවා. මේ සමාජයේ ඇත්ත මේක. අපි දකිනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔය ලංකාවේද?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඔව්. මේ ලංකාවේ. මේ යථාර්ථය. එතකොට මේ කාන්තාව බිරිඳ වුණු දවසේ සිට මේ මගේ නැන්දම්මාත්, මේ ස්වාමියාගේ අම්මා කියලා දකින්න පුරුදු වුණොත් මම හිතන්නේ තමන්ගේ ස්වාමියාට කිරි දීපු අම්මා මැරෙනකම්ම සතුටු වෙයි මට හොඳ අම්මා කෙනෙක්ගේ දුවෙක් හම්බ වුණා. ලේලි නොවෙයි. මගේ දුව හා සමාන කියලා. මම හිතන්නේ හැම ගැහැණියක්ම අම්මා කෙනෙක් වුණායින් පසුව, බිරිඳක් වුණායින් පසුව එන්න ඒ නැන්දම්මාට ආදරය කරන සමාජයක් හදන්න පුළුවන් වන්නේ කාන්තාවට පමණයි. මොකද, මේ සමාජයේ අපේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කිව්වා, අද කාර්යාලවල 70% ක්, 75% ක් අද වැඩ කරන්නේ කාන්තාවන් කියලා. උගත් කාන්තාවෝ. 51% ක් ඉන්නේ කාන්තාවන් නම්, අද විශ්ව විද්‍යාලයේ වැඩියෙන් ඉන්නේ කාන්තාවෝ. එහෙමනම් මේ උගත් කියන කාන්තාව අතින් තමයි අර ස්වාමියාගේ අම්මා නැන්දම්මා බවට පත් වෙලා, මැරෙන තුරු අඩත්තේට්ටම්වලට ලක් වෙලා දුක් විඳින්නේ. සමාජයේ අපි දකිනවා. අපි පුංචි කාලයේ අපිව හදා වඩා ගත්තේ අම්මා. බලා ගත්තේ අම්මා, තාත්තා. මොකද අපට හයිය නැහැ. එහෙමනම් ඒ අය වයසට ගියාමත් බලාගන්න ඕනෑ අපි. මම දැක්කා, AG Office එකක ගහලා තිබෙනවා. සමාජයේ බැලුවාම, ලේලිගෙන් තේ එකක් ලැබෙන්නේ නැති නැන්දම්මලා කොපමණ ඉන්නවාද? අඩත්තේට්ටම් කොපමණ තිබෙනවාද? අපට සම්බන්ධ පවුල්වලත් එහෙමයි.

ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මාර්ගයෙන් කියනවා. මෙම ගරු මන්ත්‍රීතුමියගේ යෝජනාව බොහොම හොඳයි. එය අපි අනුමත කරනවා. අර BBC කැල්ල අයින් කරනවා. ඇත්තටම එහෙම සමාජයක් අපේ රට තුළ නැහැ. කාන්තාවන්ට විශාල තැනක් අපේ සමාජය තුළ තිබෙනවා. සාධාරණයක් ලැබෙනවා. කාන්තාවට ඒ තරම් සාමාජයේ තැනක් තිබුණේ නැත්නම් අර ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කියන විධියට 70% ක්, 75% ක් රජයේ කාර්යාලවල සේවය කරන්න බැහැ. අද මෙතැන ගත්තොත් හතර දෙනෙක් කාන්තාවෝ ඉන්නේ. වැඩිම ගත්තොත් කාන්තාවෝ ඉන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙමනම් මම කාන්තාවන්ගෙන් ඉල්ලා සිටිනවා. තරුණ කාන්තාවන්ගෙන්. කාන්තා හිංසනය පටන් ගන්නේ ගෙදරින්. ඒක නිසා ඒක නවත්වන්න. ඒ වාගේම තමයි මේ කාන්තාවට හිංසා නොකළොත් එක්තරා පැත්තකින් කාන්තාව පවතින්නෙත් නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, බොහොම ස්තුතියි. කාන්තාවන් පිළිබඳව ඉතාම අත්දැකීම් සහිත මන්ත්‍රීවරයෙක් හැටියට එතුමා කිව්වේ. මීළඟට උපුල් මහේන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය විනාඩි හතයි. කාලය කළමනාකරණය කර ගෙන සභාව අමතන්න.

[ අ.භා. 01.23]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ නිරෝෂා අතුකෝරල ගරු මන්ත්‍රීතුමියගේ යෝජනාවට කථා කරන්න ලැබීම වටිනවා කියලා මම හිතනවා. විශේෂයෙන්ම පොලිස් ස්ථානයක් සහ නිලධාරිනියක් පත් කරන්න කියලා තමයි එතුමියගේ යෝජනාව. මම පෞද්ගලිකව විශ්වාස කරන්නේ රටක නීති ගෙනැල්ලා යමක් කරන්න බැහැ. මිනිස්සු මානසික වශයෙන් සංවර්ධනය කරන්න ඕනෑ. මිනිස්සු ගුණධර්ම වශයෙන්, සාරධර්ම වශයෙන් සංවර්ධනය කරන්න ඕනෑ. ඒ නිසා අපි මේ අර ඉස්සෙල්ලා කිව්වා වාගේ මේ ලෝකය පවතින්නේ හිරුගේ රශ්මිය නිසාත් මවගේ කිරි නිසාත් කියලා කියනවා නම් අපට අම්මා කෙරෙහි ගෞරවයක් තිබෙන්නට ඕනෑ. අක්කා කෙරෙහි ගෞරවයක් තිබෙන්න ඕනෑ. තමන්ගේ ඒ නැන්දා කෙරෙහි, ඒ කාන්තාව කෙරෙහි ගෞරවයක් ඇති වෙන්න ඕනෑ. අපි එකනෙකාට ගරු කළොත් තමයි මේ සමාජයේ ඒ නිසි ආකාරයෙන් කරන්න පුළුවන්කම ලැබෙන්නේ.

හැබැයි, අද තිබෙන කාරණය තමයි මෙන්න මේ අපේ තිබෙන ගෞරවණීය තත්ත්වය බිඳ වැටිලා තිබෙනවා. අම්මා කියන්නේ, අපි උතුම්කොට සලකන චරිතයක්. හැබැයි, අම්මා මාස තුනක්වත් දරුවාට කිරි ටික දෙන්නේ නැහැ. අද දරුවන් රෝගී තත්ත්වයට පත් වෙන්නේ අම්මාගේ වරදින්. අපි අවුරුදු තුනක්වත් කිරි බිව්ව මිනිස්සු. හැබැයි, අද අලුත් කාන්තාව දරුවාට කිරි දෙන්නේ නැහැ. මාසයක් දෙකක් දෙන කොට නවත්වනවා. දරුවාගේ මූලික අවශ්‍යතාවයත් ඉටු කරන්නේ නැති අම්මලා. අම්මාට අම්ම කෙනෙක් කියන්න බැහැ. මේ සමාජයේ හැම දෙයක්ම ලැබෙන්න ඕනෑ, සුදුසුකම්ලත් අයට. ඒ නිසා අම්මා කියන චරිතයට නියම ගෞරවය තිබෙන්න ඕනෑ. ඒ ගෞරවය රකින අය තමයි ඒ අම්මා කියලා කියන්නේ කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා අපි සමාජය දිහා බලන්න ඕනෑ. මිනිස්සුන්ට ලැජ්ජාව තිබෙන්නට ඕනෑ. භය තිබෙන්නට ඕනෑ. මිනිස්සු වැරැදි කරන්න කම්මැලි වෙන්නට ඕනෑ. නමුත් සමාජය දිහා බලන කොට මේ පිරිමින්ට තෑග්ගක් දෙන්නට ඕනෑ, මේ කාන්තාවන් දිහා බලාගෙන ඔවුන් දූෂණය නොකර ඉන්නවාට. ඒ කියන්නේ මිනිස්සු පොළඹවනවා, අපිව දූෂණය කරහල්ලා. ඒක ශාරීරික වශයෙන් වෙන්න පුළුවන්. මානසික වශයෙන් වෙන්න පුළුවන්. කාන්තාවන් නිසා මොනතරම් මිනිස්සු අසහනයට ලක් වෙලා තිබෙනවාද? කාන්තාවට තමන්ගේ අදහස කියා ගන්න බැරිව, ළං වෙන්න බැරිව සමාජයේ මිනිස්සු මොනතරම් පිස්සෝ බවට පත් වෙලා තිබෙනවාද? ඒ නිසා කාන්තාවන් කිව්වාට අපි බලන්න ඕනෑ. අපි කොහොමත් වැඩියෙන් අහලා නැහැ, මුස්ලිම් කාන්තාවන් දූෂණයට ලක් වුණා කියලා. අපි අහලා නැහැ, උපාසක අම්මලා දූෂණයට ලක් වුණා කියලා. මිනිස්සු ඇස යන විධියට, මිනිස්සුන්ගේ ඇස නිර්මාණය වන විධියට තමයි තමන්ගේ වැඩි ආකර්ෂණය ගන්න විධියට මේ කටයුතු කරන්න ගිහිල්ලා තමයි මේ දූෂණයන්ට, කායික වශයෙන් පීඩාවට ලක් වෙන්නේ. ඒ නිසා අපි මේ සමාජයේ කථාවට කියන්නේ, සුද්දා වැද්දා කාලයේත් අපි ශිෂ්ටාචාර මිනිස්සු. හැබැයි, අද සුද්දා හොඳට අඳින කොට අපි ඇඳුම් නැතිව ඉන්න තමයි අපි කල්පනා කරන්නේ. ඒ නිසා අපේ ජනවහරේ තිබෙනවා. කාව්‍යශේකරය ලිව්වේ තොටගමුවේ ශ්‍රී රාහුල හාමුදුරුවෝ. රාහුල හාමුදුරුවෝ කියන්නේ,

*නාභිය නොදක් වා*
*සළු ඇඳ බොලට දක් වා*
*නොපා තන සක් වා*
*සිනා නොමසෙන් දසන් දක් වා*

මේ මහළු බමුණෙක් තමන්ගේ බිරිඳට කියනවා, උඹ මෙන්න මේ විධියට හැසිරියන්. උඹ කොයි වෙලේකවත් ඇඟ පේන්න අඳින්න එපා. තමන්ගේ නාභිය පේන්න අඳින්න එපා. උඹ මේ විධියට ඉන්න එපා. මිනිස්සු උඹට ආකර්ශනය වෙනවා. උඹ කොයි වෙලේත් අඳිනවා නම් තමන්ගේ කකුළ දක්වා වැහෙන්න ඇඳපන්. ඒ වාගේ කියනවා, හිනා වෙන කොට, කට ඇරලා හිනා වෙන්න එපා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔක කිව්වාට පස්සේ අපේ නිරෝෂා ගරු මන්ත්‍රීතුමිය සාරිය හඳනවා.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

අනවශ්‍ය විධියට කථා බහට යන්න එපා. මිනිස්සුන්ට තිබෙනවා, මෙන්න මේ වගකීම. අද සමාජය දිහා බලනකොට ඒක තමයි මම කිව්වේ. මේ කාන්තාවන්

දූෂණය නොකෙරුවා නම් තමයි මිනිස්සුන්ගේ වරද? මේ රටේ මිනිස්සු පිරිමි නොවෙයි කියලා හිතෙනවා ඇති. ඒ නිසා අපට වගකීමක් තිබෙනවා. සමාජයේ කාන්තාව වශයෙන් අපි හැසිරෙන්නට ඕනෑ -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. හොඳ සාරගර්භ කථාවක්.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

නැහැ. නැහැ. වෙලාව තව තිබෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

තව තත්ත්පර 30 යි තිබෙන්නේ.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ඒ නිසා අපට මේ කාන්තාව සම්බන්ධයෙන් විශාල කර්තව්‍යතක් තිබෙනවා. හැබැයි, කාන්තාවෝ හිතෙනවා ඇති අපේ කලිසම ඇන්දාම, අපේ කමිසය ඇන්දාම ඔවුන් පිරිමි කියලා. හැබැයි අපි දැනගන්න ඕනෑ පිරිමි කවදාවක්වත් කාන්තාවන්ගේ චීත්ත අඳින්නේ නැති බව. ඒ නිසා පිරිමි චීත්ත අඳින තත්ත්වයට කවදාවක්වත් පත් කරන්න බැහැ. ඒ නිසා කාන්තාවන්ගේ අයිතීන් සුරක්ෂිත කරන්න නම් ඔවුන්ට වගකීමක් තිබෙනවා. වටපිටාවක්. ඔවුන් ඒක ආරක්ෂා කරගන්නට ඕනෑ. ඒ අම්මා කියන ගරුත්වය රකින්නට ඕනෑ. ඉතින් අපි මෙන්න මේ කරුණු කාරණා - මගේ දීර්ඝ කථාවකුයි තිබෙන්නේ. නමුත් ඔබතුමා කාලය අවසන් කියපු නිසා මම ඒකට ගරු කරලා මම නිහඬ වෙනවා. ඒ නිසා කාන්තාවන්ට මේ සමාජයේ නිසි තැන ලැබෙන්න ඕනෑය කියලා මමත් විශ්වාස කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කාල කළමනාකරණය පිළිබඳ ප්‍රශ්නයක්. මීළඟට තිබෙන්නේ පිළිතුරු කථාව. මම අපේ නිරෝෂා අතුකෝරල ගරු මන්ත්‍රීතුමියට ආරාධනා කරනවා. ඔබතුමියට හිමි කාලය විනාඩි 02 යි.

[ අ.භා. 01.28]

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාමත් සතුටට පත් වෙනවා. අදහස් යෝජනා ගොඩක් ලැබුණා. කථා කරපු සියලුම ගරු මන්ත්‍රීවරුන්ට අපි ස්තුතිවන්ත වෙනවා. මොකද මේකේ කර්තව්‍යක් අනිවාර්යයෙන්ම හැදෙන්න ඕනෑ. ඒ හැදෙන්න මූලාරම්භය කිරීම ගැන ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම සමහර ගරු මන්ත්‍රීවරුන් ගැන කනගාටුවට පත් වෙනවා. විශේෂයෙන් මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගේ කථාව ගැන. එතුමා හැම එකක්ම දේශපාලනිකව තමයි හිතන්නේ. එතුමාට දේශපාලන වාසියක් ගන්න පුළුවන් කොහාමද කියන එක. මම මේ යුගය ගැන නොවෙයි කථා කළේ. වසර 30 ක් තිස්සේ මේ රටේ කාන්තා දූෂණ, ළමා අපචාර, ළමා අපයෝජන විශාල ප්‍රමාණයක් ඇති වෙලා තිබෙනවා. මේ යහපාලනය ගැන නොවෙයි මම කථා කළේ. එතුමා මේ යෝජනාව ඇතුළෙත් බැලුවේ මෙතැනින් මොකක්ද ගන්න පුළුවන් වාසිය සහ යහපාලනයට බණින්න පුළුවන් කොහොමද කියන එක. මම ඒ ගැන ඉතාමත් කනගාටු වෙනවා.

අනික් එක තමයි, මෙයින් මම විදේශ රටවල්වලින් මුදලක් ගන්න මම යෝජනාවක් ගෙනාවේ නැහැ. මම කාන්තාවක් හැටියට මේ යෝජනාවක ගෙනාවේ අපේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, කාන්තාවක් පොලීසියට ගියාම ඇතිවන අපහසුතාවය නිසා. මොකද, කාන්තාව පොලීසියට ගියාම පිරිමි පොලිස් නිලධාරිවරයෙකුට යම් දෙයක් කියන්න පැකිලෙනවා. ලැජ්ජාව ඇති වෙනවා. මොකක් හරි අපයෝජනයකට, නින්දාවකට, අපහාසයකට ලක් වුණාම. ඉතින් එම නිසා සමහර විශාල කාන්තාවන් පිරිසක් යන්නේ නැහැ. සමහරවිට මහත්මයාගෙන් දේවල් වුණාමත් යන්නේ නැහැ. මොකද, මහත්තයා එක්කෝ පොලීසියේ ස්ථානාධිපතිට බෝතලයක් දීලා එයාව අල්ලගෙන තිබෙන්නේ. ඒ නිසා යන්නේ නැහැ. ඒ වාගේම චණ්ඩින්ගෙන් මොකක් හරි වුණාම ඒ යන්නෙත් නැහැ. මොකද, චණ්ඩි පොලිසිය අල්ලගෙන ඉන්නේ. එවැනි දේවල් ගැන හිතලයි මම මේ යෝජනාවක් ගෙනාවේ. මොකද, මම විශාල කාන්තාවන් පිරිසක් එක්ක ගනුදෙනු කරන නිසා. කාන්තාවට ගෞරවය කරන, තමන්ගේ අම්මාට ගෞරවය කරන පිරිස කාන්තාවන් ගැන ඉතාමත්

පැහැදීමෙන් කථා කළා. ඒ අයට විශේෂ ස්තුතියක් මම පුද කරනවා. අපේ මන්ත්‍රීවරුන් අම්මා ගැන හිතපු විධිය ගැන. අපි මේක සංශෝධනය කරලා, නීතියෙන් විතරක් මේ සමාජය හදාගන්න බැහැ. ඒක මමත් පිළිගන්නවා. මේ රටේ ගුණගුරුක ඇති වෙන්න ඕනෑ. සාරධර්ම ඇති වෙන්න ඕනෑ. මෙම යෝජනාවට කථා කිරීම ගැන සියලුම දෙනාට ස්තුතිවන්ත වෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි. ඊළඟට තිබෙන්නේ මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීම. අත් උස්සලා එකඟතාවය පෙන්වන්න.

***ප්‍රශ්නය සංශෝධිතාකාරයෙන් විමසන ලදින්, සභා සම්මත විය.***
*Question, as amended was put and adopted*

# කල් තැබීමේ යෝජනාව
ADJOURNMENT

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, *"රීති අංක 8(4) හි කෙසේ සඳහන් වුවද මීට පෙර සභාව එකඟ වූ පරිදි 2017 අගෝස්තු මස 28 වන සඳුදා දින පූ.භා. 10.00 ට මෙම පළාත් සභාව රැස් විය යුතු යැයි යෝජනා ප්‍රකාර දැන් මෙම සභාව 2017 අගෝස්තු මස 28 වන දින පූ.භා. 10.00 දක්වා කල් තැබිය යුතු යැයි" යෝජනා කරමි.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

***ඊට අනුකූලව පළාත් සභාව ප.භා. 01.30 ට, 2017 අගෝස්තු මස 28 වන දින පූ.භා. 10.00 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at 01.30 p.m till 10.00 a.m. on 28.08.2017*